

ප්‍රගති වාර්තාව 2025

ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

මාළිගාවත්ත

කොළඹ - 10

අන්තර්ගතය

		පිටු අංකය
01	ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය	03-18
02	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	19 -46
03	ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය	47 - 60
04	ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිත ආයතනය	61 - 83
05	ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව	84 - 93
06	ලංකා ධීවර සංස්ථාව	94 - 99
07	සී/ස සීනෝර් පදනම	100 - 102
08	නෝත්සී ලිමිටඩ්	103 - 108
09	පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය	109 - 110

01
ධීවර ජලජ හා සාගර සම්පත්,අමාත්‍යාංශය

දැක්ම

ධීවර හා ජලජ සම්පත් සංරක්ෂණය සහ තිරසර භාවිතය පිළිබඳ දකුණු ආසියානු කලාපයේ ප්‍රමුඛයා වීම.

මෙහෙවර

වර්තමාන හා අනාගත පරපුරේ යහපත උදෙසා ධීවර හා ජලජ සම්පත් භාවිතය කළමනාකරණය කිරීම.

ප්‍රතිපත්ති ප්‍රකාශනය

1. ජලජ සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කිරීම
2. යහ පාලනය ශක්තිමත් කිරීම
3. මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම
4. ජාත්‍යන්තර සහ කලාපීය සම්මුතීන්, ගිවිසුම් සහ ප්‍රමිතීන්ට අනුකූල වීම
5. යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම
6. වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව බලගැන්වීම
7. ආහාර සුරක්ෂිතතාව හා ධීවර නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම
8. නිල් ආර්ථිකයය සංකල්පයට නැඹුරුවීම
9. පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම
10. රැකියා උත්පාදනය
11. සමාජ ආරක්ෂණ ක්‍රම ධීවරයින් අතර ප්‍රචලිත කිරීම
12. පුහුණුව සහ ධාරිතා වර්ධනයෙන් ව්‍යවසායකත්ව හැකියා ප්‍රවර්ධනය කිරීම
13. කාලගුණික හා දේශගුණික විපර්යාස මත සිදුවන බලපෑම්වලට මුහුණ දීම
14. ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇති කිරීම
15. ධීවර ප්‍රජාවන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම
16. සහනාධාර පිළිබඳ ඇති යැපීම් මානසිකත්වය අවම කිරීම
17. පෞද්ගලික අංශයේ සහභාගීත්වය වැඩි කිරීම
18. මානව හිමිකම් උල්ලංඝනය නොකිරීම
19. සුපිළිපන්නභාවය ස්ථාපිත කිරීම
20. ප්‍රජා සංවිධාන සමඟ සාමූහිකව ක්‍රියා කිරීම

ධීවර අංශයට දායකත්වය සපයන ආයතන හා අරමුණු	
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (DFAR)	**අපේක්ෂිත අරමුණු** - ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය, සංවර්ධනය හා සංරක්ෂණය. **වගකීම්** - කලාපීය සහ අන්තර්ජාතික සම්මුතීන්ට හා රෙගුලාසිවලට අනුකූලව 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත ක්‍රියාත්මක කිරීම සහ ධීවර කළමනාකරණ කටයුතු හා නෛතික විධිවිධාන යාවත්කාලීන කිරීම.
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය(NARA)	**අපේක්ෂිත අරමුණු** - ජලජ සම්පත් පිළිබඳ පර්යේෂණ, ජලජ සම්පත් සංවර්ධනය, සංරක්ෂණය හා කළමනාකරණය. **වගකීම්** - 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනත යටතේ ස්ථාපිත මෙම ආයතනය මගින් ජලජ සම්පත් හා ජලජීවී වගාව, ධීවර තාක්ෂණය, මත්ස්‍ය හා පසුඅස්වනු තාක්ෂණය, පාරිසරික අධ්‍යයනය, සමුද්‍ර ජීව විද්‍යාව, ජල ශාස්ත්‍රය හා සාගර අධ්‍යයන කටයුතු සිදුකිරීම.
ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA)	**අපේක්ෂිත අරමුණු** - වගා කිරීම මත පදනම් වූ මිරිදිය ධීවර කර්මාන්තය හා ජලජීවී වගාව ප්‍රවර්ධනය, කළමනාකරණය සහ නියාමනය. **වගකීම්** - 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරී පනත යටතේ ස්ථාපිත කරන ලද මෙම ආයතනය මඟින් මිරිදිය ධීවර කර්මාන්තය සහ ජලජීවී වගාවට අවශ්‍ය බීජ සැපයීම හා ව්‍යාප්ති සේවය ලබාදීම, මිරිදිය හා ජලජීවී වගා කටයුතු අධීක්ෂණය, ජලජීවී වගා පුහුණු කටයුතු සැපයීම.
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC)	**අපේක්ෂිත අරමුණු -** ධීවර වරායන්, නැංගුරම්පොළවල් සැලසුම් කිරීම, ඉදිකිරීම හා පවත්වාගෙන යාම. **වගකීම්** - 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ මෙම ආයතනය මගින් වර්තමානයේ ධීවර වරායන් 23ක් හා නැංගුරම්පොළවල් 58ක් පවත්වාගෙන යාම.
ලංකා ධීවර සංස්ථාව (CFC)	**අපේක්ෂිත අරමුණු -** මත්ස්‍ය නිෂ්පාදකයාට හා පාරිභෝගිකයාට උපරිම වාසි සැලසෙන අයුරින් මත්ස්‍ය වෙළඳපොළ සඳහා දායක වීම. **වගකීම් -** 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ ස්ථාපිත මෙම ආයතනය මගින් මාළු මිලදී ගැනීම හා විකිණීම, අයිස් නිපදවීම හා විකිණීම, ශීතාගාර පහසුකම් පවත්වාගෙන යාම හා මත්ස්‍ය අතුරු නිෂ්පාදන විකිණීම සිදුකරයි.
සීමාසහිත සීනෝර් පදනම	**අපේක්ෂිත අරමුණු** - ධීවර කර්මාන්තයට අදාළ වන්නා වූ යෙදවුම් හා සැපයුම් ලබාදීම. **වගකීම්** - 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති මෙම ආයතනය මගින් ෆයිබර් ග්ලාස් ආශ්‍රිත උපකරණ හා ඔරු, බෝට්ටු නිෂ්පාදනය කරන අතර අනිකුත් සියලුම ධීවර ආම්පන්න අලෙවිය සිදු කරයි.
නෝත්සී ලිමිටඩ	**අපේක්ෂිත අරමුණු** - දේශීය ධීවර කාර්මිකයින් ගේ අවශ්‍යතා පිරිමසමින් උසස් ප්‍රමිතියකින් යුත් මාළු දැල් හා ධීවර ආම්පන්න සැපයීම. **වගකීම් -** 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ආරම්භ කර, 2007 අංක 7 දරන නව සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරමින් පිහිටුවන ලද මාළු දැල් නිෂ්පාදනය කරන සමාගමකි.
පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය	අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 10/0958/438/001 මඟින් කළමනාකරණ භාරයක් පිහිටුවීම **වගකීම් -** මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණයේ කළමනාකරණ හා මෙහෙයුම් ක්‍රියා පිළිබඳ අදාල ප්‍රතිපත්ති සකස් කිරීම

ජාතික ආර්ථිකයේ වර්ධනයට ධීවර අංශයේ දායකත්වය

2025 වර්ෂයේ ධීවර අංශයේ සමස්ත ප්‍රගතිය

පුද්ගල, ශාරීරික සහ මානසික යෝග්‍යතාව රටක සාර්ව සංවර්ධනය කෙරෙහි බලපෑම් කරන සාධකයකි. එය ජාතික ප්‍රතිපත්තියකින් දුරස් නොවිය යුතුය. යහපැවැත්මෙන් යුත් බහුවිධ පුද්ගල පරිසරයක පදනම සෞඛ්‍ය සම්පන්න ජනතාවකගෙන් පිළිබිඹු කෙරේ. රාජ්‍යයක් ගෝලීය, කලාපීය සහ ජාතික නිර්නායක වෙත ප්‍රවේශවීමේදී රාජ්‍යයේ පවතින මානව, භෞතික සහ මූල්‍ය සම්පත් තිරසර ලෙස කළමනාකරණය කර ගනිමින් ජාතික අභිලාස සපුරා ගැනීම ප්‍රතිපත්තිය වේ. ඒ සඳහා අපේ ධීවර කර්මාන්තයට විශාල විභවයක් පවතී. එහි සම්පත් තිරසර ලෙස කළමනාකරණය කර ගනිමින් ගුණාත්මක මත්ස්‍ය සම්පත් නෙළා ගැනීම කෙරෙහි අවධානය යොමු කර ඇත. ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමට “පොහොසත් රටක් ලස්සන ජීවිතයක්” යන ජාතික ප්‍රතිපත්තියෙන් මූලධර්ම අටක් (08) හා ක්‍රියාමාර්ග දොළහක් (12) ඉදිරිපත් කර තිබේ.

සංඛ්‍යාලේඛනවලට අනුව ශ්‍රී ලංකාවට අයත් අනන්‍ය ආර්ථික කලාපය වර්ග කිලෝමීටර් 517,000කි. ඓතිහාසික ජල තීරය වර්ග කිලෝමීටර් 21,500කි. කළපු සහ ගං මෝය ඇතුළු අභ්‍යන්තර විභවය වර්ග කිලෝමීටර් 4,890ක් වන අතර මේ සමස්ථය යනු; අප සතු ස්වභාවික ජලජ සම්පත්වල ධාරිතාවයි

ජනතාවගේ සත්ව ප්‍රෝටීන අවශ්‍යතාව සපුරාලීම, එය සාධනයට, ශ්‍රමය හසුරුවන 320,470ක් පමණ වන ධීවරයින්ගේ වෘත්තීය සහ ජීවන තත්ත්වය උසස් කිරීම, පසු අස්වනු හානිය අවම කර ගැනීම, පාරිභෝගිකයාට සාධාරණ මිලකට මසුන් ලබාදීම සහ යටිතලපහසුකම් සංවර්ධනය ආදිය ප්‍රමුඛ අරමුණු වේ.

සමස්ත ධීවරයින්ගෙන් 70%ක් හෙවත් ධීවර කාර්මිකයෝ 225,480ක් කරදිය ධීවර කර්මාන්තයේ යෙදෙති. අක්වෙරළ සහ ගැඹුරු මුහුදේ පන්නවල යෙදෙන පිරිස 33,980ක් වන බව සංඛ්‍යාලේඛන තහවුරු කරති. ධීවර වෘත්තිකයන්ගේ පවුල් ඒකක ප්‍රමාණය 272,900කි. ඒ අනුව, ධීවර කර්මාන්තයෙන් සෘජුව යැපෙන්නන් සංඛ්‍යාව 1,031,160ක් බව සංඛ්‍යාලේඛනවලින් සනාථ කෙරේ. ඇස්තමේන්තුවලට අනුව ධීවර කර්මාන්තය හා ආශ්‍රිත වක්‍ර වෘත්තීන්හි නියැලී යැපෙන ප්‍රමාණය මිලියන 2.7කි. ප්‍රතිශතයක් ලෙස සමස්ත ජනගහනයෙන් 12.3%ක් ධීවර කර්මාන්තය පදනම් කරගනිමින් සිය ජීවනෝපාය සලසා ගනිති.

2025 ජනවාරි සිට සැප්තැම්බර් මාසය දක්වා වූ කාලය තුළ කරදිය ධීවර කර්මාන්තයෙන් අස්වනු මෙ.ටො. 237,395ක් හා මිරිදිය ධීවර කර්මාන්තයෙන් මෙ.ටො.44,360ක මත්ස්‍ය අස්වැන්නක් නෙළා ගෙන තිබේ. එය සමස්තයක් වශයෙන් ගත්විට මෙ.ටො. 281,755කි.

ජනතාවගේ ප්‍රෝටීන අවශ්‍යතාව සපුරා ගැනීම ප්‍රධාන අරමුණුවලින් එකක් වන අතර උක්ත කාලය තුළ ඒකපුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 34.03ක් සපුරා ගෙන තිබේ. මෙරට මත්ස්‍ය පරිභෝජනයට අවශ්‍ය සමස්ත අවශ්‍යතාවයෙන් 60.5%ක් පමණ දේශීය ධීවර කර්මාන්තයෙන් සපුරා ගැනීමට සමත්ව ඇත.

පවතින අභියෝග හමුවේ විදේශ විනිමය උපයා ගැනීමට ධීවර කර්මාන්තයේ වැඩි දායකත්වයක් සලසා ගැනීම අපේක්ෂාව වූ අතර 2025 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනය තුළින් රු.මි.68,889.0ක් උපයා ගෙන ඇත. එය ඇ.ඩො.මි 230.1කි.

ජාතික අපනයන ආදායම වර්ධනය කිරීමට ධීවර අංශයේ දායකත්වය 2.4.%කි. එයින් 1.3%ක් යුරෝපා සංගමය ඇතුලත්ව යුරෝපා රටවලටත්, 1.1% ක් යුරෝපා නොවන රටවලටත් ලෙස අපනයනය කර තිබේ. එමෙන්ම, උක්ත කාල පරිච්ඡේදයේදී විසිතුරු මසුන් අපනයනයෙන් උපයා ගත් ආදායම රු.මි. 5,382.9කි.

151 වන අයවැය ශීර්ෂයෙන් පවතින වර්ෂය වෙනුවෙන් රු.මි5,278.54ක ප්‍රාග්ධනයක් හා පුනරාවර්තන ප්‍රතිපාදන ලෙස රු.මි 2,020.04ක් වෙන් කෙරිණි. 2025 සැප්තැම්බර් 30 දිනට එහි මූල්‍ය ප්‍රගතිය පිළිවෙළින් රු.මි.1,320.78 හා රු.මි.1,442.11ක් වේ. 2025 වර්ෂයට 290 වැය ශීර්ෂයෙන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට රු.මි.187.00ක ප්‍රාග්ධන ප්‍රතිපාදනද, පුනරාවර්තන ප්‍රතිපාදන ලෙස රු.මි.4,191ක්ද වෙන් කෙරිණි. එහි මූල්‍ය ප්‍රගතිය පිළිවෙළින් රු.මි.46.83ක් (25%) හා රු.මි.2,564.60කි (61.19%).

ධීවර වරාය වැඩි දියුණු කිරීම යටතේ මේ වන විට අම්බලන්ගොඩ, හික්කඩුව, වාලච්චේන සහ දොඩන්දුව සංවර්ධනයට සැලසුම් සකස් කර අවසන් අතර වාලච්චේන ධීවර වරාය 2026 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිතය. ඊට අමාත්‍ය මණ්ඩල අනුමැතියද ලැබී ඇත. උතුරු පළාතේ දිස්ත්‍රික්ක 04ක ධීවර තොටුපොළ හා නැංගුරම්පොළ 62ක් සංවර්ධනය සඳහා වෙන් කළ මුදල රු.මි.280කි.

වෙරළාසන්නව ධීවර වෘත්තියේ යෙදෙන ධීවර කාර්මිකයන්ගේ වෘත්තීය සුරක්ෂිතභාවය තහවුරු කරනුවස් පූර්ව අනතුරු හැඟවීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයතන ඒකාබද්ධ ගිවිසුමකට එළැඹ තිබේ. එහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 120,000කි. සංඛ්‍යාලේඛනවලට අනුව යාත්‍රා නිරීක්ෂණ පද්ධතියෙන් නිරීක්ෂණයට ලක් වන බහුදින ධීවර යාත්‍රා සංඛ්‍යාව 4,869ක් පමණ වේ.

යුරෝපීය කොමිසමේ ඇගයීමට ලක්වූ මෙම නිරීක්ෂණ ක්‍රියාවලිය, ආසියාවේ ඇති නවීනතම අධීක්ෂණ ක්‍රමවේදයක් ලෙසද හඳුනා ගෙන තිබේ. එක්සත් ජාතින්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය විසින් කළ ප්‍රදානයන් යොදවා එයින් ග්‍රාමීය ජනතාවගේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කිරීම, ජීවනෝපාය සංවර්ධනය උදෙසා වන අභිජනන පහසුකම් සැලසීම, ප්‍රවාහනය, නව අභිජනන ඒකක ස්ථාපිත කිරීම, මව් මත්ස්‍යයින් ආනයනය, දැනුවත් කිරීම් ආදී වැඩසටහන් රැසක් මෙම වසරේ ක්‍රියාත්මක කෙරිණි. ගෝලිය වෙළෙඳපොළ නව්‍යකරණ විධි හා තරග අවකාශය සැලකිල්ලට ගෙන නව විසිතුරු මත්ස්‍ය ප්‍රභේද තුනක් (03) හඳුන්වා දෙන ලදී.

නිසි විද්‍යාත්මක ක්‍රමවේද හා ප්‍රායෝගික උපක්‍රම තුලින් තිරසර හා පරිසර හිතකාමී ලෙස සංවර්ධනය හා කළමනාකරණය කිරීමටත්, ඒ තුලින් මත්ස්‍ය නිෂ්පාදන සුලභ කිරීම හා පාරිභෝගිකයාට සාධාරණ මිලකට ලබාගත හැකි තත්ත්වයකට පත් කිරීමත්, කර්මාන්තයේ නියැලෙන්නන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමත් අරමුණු කොට නව රජයේ ‘පොහොසත් රටක් ලස්සන ජීවිතයක්’ ප්‍රතිපත්ති රාමුවේ තිරසර කළමනාකරණයක් - ගුණාත්මක මත්ස්‍ය සම්පතක් ප්‍රධාන ප්‍රතිපත්තියක් ලෙස දක්වා ඇති අතර ඒ අනුව වැඩසටහන්/ව්‍යාපෘති ධීවර කර්මාන්තය නංවාලීම සඳහා 2026 වසර තුල ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.

සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයේ දායකත්වය

1.1 වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය වර්ධනය කර ගැනීම.

2025 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දිවයිනේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො 281,755 ක් විය. මෙහි වැඩි දායකත්වයක් ලබා දී ඇත්තේ වෙරළාසන්න ධීවර කර්මාන්තයෙනි. එහි ප්‍රතිශතය 45.6% කි. එසේම පිළිවෙළින් 38.7%ක් ගැඹුරු මුහුදෙන් හා 15.7 %ක් මිරිදිය හා ජලජීවී වගාව මඟින් දායකත්වයක් සැපයේ.

1.2 කරදිය මත්ස්‍ය නිෂ්පාදනය (වෙරළාසන්න, අක්වෙරළ/ ගැඹුරු මුහුද)

සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය සඳහා වෙරළාසන්න හා ගැඹුරු මුහුදේ දායකත්වය ක්‍රමානුකූලව වැඩි කර ගැනීමට හැකියාව ලැබී ඇත. 2025 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයෙන් මෙ.ටො. 109,085ක් ද, වෙරළාසන්න ධීවර කර්මාන්තයෙන් මෙ.ටො. 128,310ක අස්වැන්නක් ද ලබාගැනීමට හැකි වූ අතර, සමස්ත කරදිය අස්වැන්න මෙ.ටො. 237,395කි.

1.3 මිරිදිය හා ජලජීවී වගා නිෂ්පාදනය

2025 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාල පරාසය තුළ සමස්ත මිරිදිය මත්ස්‍ය හා ජලජීවී වගා නිෂ්පාදනය මෙ.ටො. 44,360 ක් වූ අතර සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය සඳහා මෙහි දායකත්වය 15.7 % කි.

2025 සැප් 30 දින වන විට සමස්ත මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය මිලියන 51.44 ක් වන අතර ඉන් මිලියන 19.01ක් ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන මඟින් නිෂ්පාදනය කෙරිණි, ඉතිරිය ප්‍රජා මූලික මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක, පෞද්ගලික පොකුණු, ජලාශ තුළ දැල් කූඩු හා කොටු භාවිතයෙන් නිෂ්පාදනය සිදු කර ඇත.

2025 සැප් 30 දින වන විට සමස්ත මිරිදිය ඉස්සන්, පසුකීටයන් නිෂ්පාදනය මිලියන 29.08ක් වන අතර ඉන් මිලියන 16.57ක් ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානවලින් නිෂ්පාදනය කළ අතර ඉතිරිය නිෂ්පාදනයට පෞද්ගලික අංශයෙන් දායකත්වය ලබා ගන්නා ලදී.

එසේම පෞද්ගලික අංශය විසින් කිවුල් දිය ඉස්සන් පසුකීටයන් මිලියන 611ක් නිෂ්පාදනය කර ඇත.

2025 වසරේ දේශීය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමේ අවකාශය පුළුල් කරමින් ජනතාවගේ පෝෂණ අවශ්‍යතාව ඉහළ නංවාලීම, රැකියා උත්පාදනය , අපනයන වර්ධනය හා ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කරලීම උදෙසා උපරිම දායකත්වය ලබා ගැනීමේ අරමුණින් යුතුව, ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් වගා පාදක ධීවර කර්මාන්තය, කිවුල්දිය හා වෙරළබඩ ජලජීවී වගාව ආශ්‍රිත සංවර්ධනය සඳහා විවිධ දිස්ත්‍රික්කයන්හි වැඩසටහන් ක්‍රියාවට නංවා ඇත.

වගුව 1.1 මත්ස්‍ය නිෂ්පාදන පිළිබඳ දත්ත									
මත්ස්‍ය නිෂ්පාදනය (මෙ.ටො.)									
ධීවර උප අංශ		2020	2021	2023	2024	2024 (ජන-සැප්)	2025 (ජන-සැප්)	වෙනස 2025-2024 (%)	දායකත්වය (%)
1	ගැඹුරු මුහුදු	144,370	153,415	128,950	143,390	105,330	109,085	3.56	38.7
2	වෙරළාසන්න	182,560	178,260	164,995	165,040	124,090	128,310	3.40	45.5
	මුළු කරදිය	**326,930**	**331,675**	**293,945**	**308,430**	**229,420**	**237,395**	3.48	84.3
3	මිරිදිය	84,310	80,720	93,440	87,210	70,375	34,290	(51.28)	12.2
4	ජලජීවී වගාව	10,140	9,105	8,085	7,800	6,560	4,530	(30.95)	1.6
5	ඉස්සන් වගාව	7,360	14,410	11,600	7,320	5,735	5,540	(3.40)	2.0
	මුළු මිරිදිය	**101,810**	**104,235**	**113,125**	**102,330**	**82,670**	**44,360**	(46.34)	15.7
	සමස්ථ නිෂ්පාදනය	**428,740**	**435,910**	**407,070**	**410,760**	**312,090**	**281,755**	(9.72)	100.0

මූලාශය : ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය - සංඛ්‍යා ලේඛන අංශය

වගුව 1.2 2025 මත්ස්‍ය නිෂ්පාදන පිළිබඳ දත්ත								
මත්ස්‍ය නිෂ්පාදන (මෙ.ටො.)								
	කරදිය මත්ස්‍ය නිෂ්පාදනය			මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය				සමස්ථ නිෂ්පාදනය
	අක් වෙරළ	වෙරළාසන්න හා කළපු	මුළු කරදිය	මිරිදිය	ජලජීවී වගා	ඉස්සන්	මුළු මිරිදිය	
2025	109,085	128,310	237,395	34,290	4,530	5,540	44,360	281,755
ජන	13,920	15,390	29,310	3,775	245	470	4,490	33,800
පෙබ	14,520	17,230	31,750	3,325	235	265	3,825	35,575
මාර්තු	13,885	16,380	30,265	3,520	285	280	4,085	34,350
අප්‍රේල්	11,790	13,640	25,430	4,890	240	480	5,610	31,040
මැයි	9,090	11,820	20,910	3,890	290	790	4,970	25,880
ජුනි	9,150	11,990	21,140	4,265	360	785	5,410	26,550
ජූලි	11,230	13,670	24,900	3,970	530	700	5,200	30,100
අගෝ	12,860	14,260	27,120	3,405	895	1,160	5,460	32,580
සැප්	12,640	13,930	26,570	3,250	1,450	610	5,310	31,880

මූලාශ්‍රය : ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය - සංඛ්‍යා ලේඛන අංශය

1.4 ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය වැඩි කර ගැනීම.

මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීමෙන් ශ්‍රී ලාංකික ජනතාවගේ පෝෂණ ඌනතා අවම කර, මන්දපෝෂණයෙන් තොර සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කර ගැනීමට මඟ පාදයි.

2025 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය, දිනකට ග්‍රෑම් 34.03ක් ලෙස වාර්තා වී ඇත. මෙම ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය සඳහා දේශීය කරදිය හා මිරිදිය නිෂ්පාදන මෙන්ම ආනයනය කරන ලද මත්ස්‍ය නිෂ්පාදන ද දායකවී ඇත.

1.5 මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන ආනයනය

හාල්මැස්සන්, කරවල, උම්බලකඩ හා ආහාරයට ගන්නා මසුන් මෙරටට ආනයනය කරනු ලබන ප්‍රධානතම මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වේ. මුළු ආනයනයෙන් වැඩි දායකත්වයක් ලබා දෙන්නේ කරවල හා හැල්මැස්සන් ය. ආනයනික මත්ස්‍ය ප්‍රමාණයෙන් 80.3%ක් හිමායිත මැකරල් මසුන් වන අතර එය දේශීය මත්ස්‍ය නිෂ්පාදනයේ ලින්නා මසුන් හිඟ කාලසීමාවේදී දේශීය ටින් මාළු නිෂ්පාදන කර්මාන්තය සඳහා අමුද්‍රව්‍යයක් ලෙස යොදා ගැනේ. දේශීයව නිපදවන මත්ස්‍ය නිෂ්පාදනය හා පරිභෝජනය අතර පරතරය පිරවීමට මෙම ආනයන ඉතා වැදගත්ය. 2025 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන මෙට්‍රික් ටොන් 42,796.3ක් ආනයනය කර ඇති අතර එහි වටිනාකම රුපියල් මිලියන 25,993.1ක

වගුව 1.3: ආනයනික මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදනවල වටිනාකම (රු.මි)

අයිතමය	2022	2023	2024	2024 (ජන-සැප්)	2025 (ජන - සැප්)	වෙනස % 2025/ 2024	මුළු ප්‍රතිශතය
කරවල	3,470	3,511	5,331	3,793.1	4,234.1	11.6	16.3
වියළි හාල්මැස්සන්	9,955	9,011	14,610	9,430.9	8,159.5	-13.5	31.4
උම්බලකඩ	926	926	1,422	929.5	1,147.3	23.4	4.4
ටින් මාළු	2,672	6,173	3,318	2,815.6	75.2	-97.3	0.3
ආහාර පිණිස ගන්නා මසුන්	2,108	2,744	5,186	3,884.6	6,156.3	58.5	23.7
සජීවී මසුන්	430	369	486	354.9	369.2	4.0	1.4
අනෙකුත්	2,103	4,001	6,320	5,270.1	5,851.4	11.0	22.5
එකතුව	21,664	26,734	36,672	26,478.6	25,993.1	-1.8	100.0

මූලාශ්‍රය : ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය - සංඛ්‍යා ලේඛන අංශය

1.6 මත්ස්‍ය අපනයනය

මත්ස්‍ය ආහාර, විසිතුරු මසුන් හා මුහුදු පැළෑටි අපනයනයෙන් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම උදෙසා ධීවර අංශයෙන් ලබා දෙන්නේ ප්‍රමුඛ දායකත්වයකි. මෙම කාර්යය ඉටුකිරීමේදී ආනයනික රටවල ප්‍රමිතීන්ට අනුගත වෙමින් ගුණාත්මක හා සෞඛ්‍ය ආරක්ෂිත තත්ත්වයෙන් උසස් මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා, එම කාර්යයේ නියුතු පාර්ශ්වකරුවන්ට නිසි මඟ පෙන්වීම හා ආධාර ලබා දී මත්ස්‍ය අපනයන ක්ෂේත්‍රයේ වර්ධනයක් ඇති කරලීමට පියවර ගෙන ඇත.

වගුව 1.4: මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදනවල අපනයන ප්‍රමාණය හා වටිනාකම				
මත්ස්‍ය වර්ගය	අපනයන ප්‍රමාණය (මෙ.ටො.)		අපනයන වටිනාකම (රු.මී.)	
	2024	2025 ජන-සැප්	2024	2025 ජන-සැප්
සජීවී මසුන්	අදාල නැත	අදාල නැත	7,392	5,385.2
ඉස්සන්	3,432	2,183.0	8,921	6,064.3
පොකිරිස්සන්	82	76.9	790	689.7
කකුළුවන්	2,187	1,273.7	9,056	6,623.6
මුහුදු කුඩැල්ලන්	252	224.1	3,202	2,296.8
වෙනත් මොලුස්කාවන්	2,211	1,935.0	4,367	3,695.6
මෝර වරල්	100	48.2	1,175	403.2
මාළු බොකු	10	7.0	290	145.7
බෙල්ලන් සහ කවච මසුන්	465	180.8	234	144.6
ආහාර පිණිස ගන්නා මසුන්	13,451	12,354.9	49,731	42,595.5
වෙනත්	367	352.0	1,082	844.7
මුළු එකතුව	22,556	18,635.5	86,241	68,889.0

මූලාශ්‍රය : ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය - සංඛ්‍යා ලේඛන අංශය

1.7 විසිතුරු මසුන් අපනයනය

ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය නව විසිතුරු මත්ස්‍ය ප්‍රභේද හඳුන්වා දීම, අභිජනන කටයුතු, මත්ස්‍ය රෝග නීර්ණය සහ රෝග පැතිරීයාම වැළැක්වීම, ගුණාත්මක තත්ත්වයේ මව් මත්ස්‍යයින් ලබාදීම, ගුණාත්මක තත්ත්වයේ ආහාර ලබා දීම හා වගා කරුවන් පුහුණු කිරීම හා දැනුවත් කිරීම, නාරා ආයතනයේ සහයෝගයෙන් මසුන්ගේ නව ප්‍රභේද බිහි කිරීම, තාක්ෂණික සංවර්ධනය, මත්ස්‍ය රෝග නිර්ණය, වගා කරුවන්ට ණය සහන ලබා ගැනීමට සහාය වීම ආදී ක්‍රමෝපායන් සිදු කර විසිතුරු මසුන් අපනයනය දිරිමත් කිරීමට පියවර ගැනුණි.

2025 වසරේ ජනවාරි - සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදයේදී විසිතුරු මසුන් අපනයනයෙන් රු.මිලියන 5,382.9 ක් උපයා ගැනීමට හැකියාව ලැබී ඇත.

ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය

ධීවර ක්ෂේත්‍රයේ සංවර්ධනය ඉලක්ක කර ගෙන ක්‍රියාත්මක කරන සියලුම සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම, මෙහෙයවීම හා සමස්ත ධීවර සංවර්ධනයට අදාල කාර්යයන් කෙරෙහි බලපාන ප්‍රතිපත්ති සම්පාදනය, ධීවර අමාත්‍යාංශයේ ප්‍රමුඛ වගකීමකි. ඒ අනුව, ධීවර අංශය සම්බන්ධයෙන් මෙරට ජාතික ප්‍රතිපත්තියෙහි අන්තර්ගත සමුද්‍රීය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම, ජලජීවී වගා සහ මිරිදිය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම, පසු අස්වනු හානි අවම කිරීම සහ අගය එකතු කිරීම ඉහළ නැංවීම, ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීම, අපනයන ආදායම් ඉහළ නැංවීම, විනෝදාත්මක ක්‍රියාකාරකම්, රැකියා හා ව්‍යාපාරික සංවර්ධනය සඳහා පවතින අවස්ථා පුළුල් කිරීම, ධීවර ප්‍රජාවන්ගේ සමාජ-ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම යන අරමුණු ළඟාකර ගැනීමට අවශ්‍ය සියලු වැඩසටහන් සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම මෙම අමාත්‍යාංශය සතු ප්‍රධානම කාර්යභාරයක් වේ.

1. කලපු පිරිසිදු කිරීම හා සංරක්ෂණය

1.1 මීගමු කලපුව සංවර්ධනය කිරීම

ව්‍යාපෘතිය පිළිබඳ විස්තරය:

මෙම ව්‍යාපෘතිය අදියර 3ක් යටතේ ක්‍රියාත්මක වේ. එහි දී, අදියර I යටතේ ක්‍රියාත්මක පැකේජ ගණන 7කි. ව්‍යාපෘතියේ අදියර I හි පැකේජ 7 සඳහා මුළු මුදල රු.මි. 1,000 කි. (පැකේජ I,II,,හා IV මෙවන විට අවසන්ව ඇත.)



1. පැකේජ III - රැජින මාර්ගය ප්‍රදේශයේ කලපු සංවර්ධනය

පැකේජ III යටතේ රැජින පාර අසල කලපුව හැරීම 2018.07.20 වන දින ආරම්භ කළ අතර, මේ වන විට කලපුවේ භෞතික ප්‍රගතිය 90% කි.

I. ප්‍රමාදවීමට හේතු

ව්‍යාපෘතියේ 3 වන අදියර ක්‍රියාත්මක කිරීමේදී, කලපු රොන්මඩ ඉවත් කර ඒවා වියළෙන තෙක් ව්‍යාපෘති සීමාවෙහි තැන්පත් කර තැබීම කඩොලාන පරිසරයට හානි සිදු කිරීමක් ලෙස හුවා දක්වා ඊට විරුද්ධව වන සංරක්ෂණ ආ .ප . 20 (1) වෙනි වගන්තිය යටතේ නඩු පවරා ඇත.
ඒ සම්බන්ධයෙන් උසාවි නියෝගය ලබා දුන් පසු රොන්මඩ ඉවත් කිරීම නැවත ආරම්භ කිරීමට නියමිතය.

II. පැකේජ VII - උසාවි සංකීර්ණය අසල ප්‍රදේශයේ ජැටිය ඉදිකිරීම

පැකේජ VII යටතේ මීටර 15 පළල මීටර 100ක් දිග ජැටිය ඉදිකරනු ලබයි. මේ වන විට සැලසුම් හා නිර්මාණ කටයුතු අවසන්ව ඇති අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලියඅවසන් අදියරේ පවතියි.



2 ගන්දර ධීවර වරාය ඉදිකිරීම

i. ව්‍යාපෘතිය පිළිබඳ විස්තරය :

මෙම ව්‍යාපෘතිය මඟින් පහත දැක්වෙන යටිතල පහසුකම් ඉදිකිරීම සිදු කෙරේ.

- දියකඩනය ඉදිකිරීම
- වේදිකාව ඉදිකිරීම
- වෙරළ පහසුකම් (Shore facilities)

මත්ස්‍ය වෙන්දේසි ශාලාව, දැල් සැකසුම් මධ්‍යස්ථානය, සනීපාරක්ෂක පහසුකම්, සාප්පු ගොඩනැඟිල්ල, කාර්ය මණ්ඩල නේවාසිකාගාරය, ධීවර පරීක්ෂක හා වෙරළාරක්ෂක බලකාය සඳහා කාර්යාල, නවාතැන් පහසුකම්, පොම්පාගාර, කසළ එකතු කිරීමේ ස්ථානය, කිරුම් ස්ථානය, තෙල් සැපයීම් කටයුතු සහ ජල ටැංකි ඉදිකිරීම සිදු කරයි

ii. ව්‍යාපෘති ආරම්භය: 2020.12.07
iii. ව්‍යාපෘති අවසානය: 2026 දෙසැම්බර් (අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත)
iv. සංශෝධිත ව්‍යාපෘති වටිනාකම : රු.මි. 11,354 (අවිනිශ්චිත වියදම් 10% හා වැට් බදු රහිතව)

v. ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය :

වසර	මූල්‍ය ප්‍රතිපාදන රු.මි.	වියදම රු.මි.	සටහන
2020	408	202.48	
2021	1,710	1,595.30	
2022	1,599.44	1,145.43	
2023	2534.59	2,353.00	
2024	3,199.90	2,795.2	
2025	1,328	697.0	2025.08.31 දිනට මූල්‍ය ප්‍රගතිය

vi. භෞතික ප්‍රගතිය:

ප්‍රගතිය පහත දැක්වේ.

ඒ අනුව ගන්දර ධිවර වරාය ඉදිකිරීම් ව්‍යාපෘතියේ 2025.08.31 දිනට අපේක්ෂිත භෞතික ප්‍රගතිය 87.51% වූ අතර එහි භෞතික ප්‍රගතිය 78% කි.

දියකඩනය

වේදිකා බැම්ම ඉදිකිරීම

Travel lift bay ඉදිකිරීම

ධීවර කාර්යාලය ඉදිකිරීම

භූගත ජල ටැංකිය ඉදිකිරීම

ඉන්ධන කාර්යාලය ඉදිකිරීම

පරිපාලන කාර්යාලය ඉදිකිරීම

3 <u>මයිලිඩ්ඩි ධීවර වරාය</u>

මෙම ධීවර වරායෙහි දියඩනය ප්‍රතිසංස්කරණය කිරීම, ජැටි හා යාත්‍රා ආලෝකය, ප්‍රවේශ ඇළ මාර්ගය ඇතුළු වරාය ද්‍රෝණියෙහි මඩ කැණීම, වෙරළ පහසුකම් සැපයීම සඳහා වෙන්දේසි ශාලාව, දැල් අලුත් වැඩියා කිරීමේ ශාලාව, ගබඩා කිරීමේ ටැංකියක් සහිත ඉන්ධන පිරවුම්හල ඉදි කිරීම, ප්‍රජා ශාලාව, පරිපාලන කාර්යාලය, පරිපාලන නිලධාරීන් සඳහා නිල නිවාස, පොදු පහසුකම් හා වෙරළ ආශ්‍රිත යටිතල පහසුකම් සහිතව ව්‍යාපෘතිය අදියර කිහිපයක් යටතේ සිදු කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව අදියර I හා II වැඩ අවසන් කර මෙහෙයුම් කටයුතු සඳහා භාර දී ඇති අතර අදියර III සඳහා සීනොර් සමාගම විසින් ඉදිකිරීම් කටයුතු කරනු ලැබේ.

ව්‍යාපෘතිය අදියර III

අදියර III යටතේ වෙරළ පහසුකම් සැපයීම සඳහා වෙන්දේසි ශාලාව, පරිපාලන කාර්යාලය,පරිපාලන නිලධාරීන් සඳහා නිල නිවාස, පොදු පහසුකම් හා වෙරළ ආශ්‍රිත යටිතල පහසුකම් සැලසීම සිදු කරයි. මෙම ව්‍යාපෘතිය 2026 වර්ෂයෙහි අවසන් කිරීමට නියමිතය.

4 ශක්‍යතා අධ්‍යනය, සැලසුම් සකස් කිරීම හා පාරිසරික බලපෑම් අධ්‍යනය කිරීම

<u>අම්බලන්ගොඩ ධීවර වරාය වැඩි දියුණු කිරීම</u>

මේ වන විට මෙහි සැලසුම් සකස් කිරීම අවසන් කර ඇත. පාරිසරික බලපෑම් වාර්තාව (EIR) සකස් කිරීමද අවසන් කර ඇති අතර එම වාර්තාව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමෙන්තුවේ තාක්ෂණික කමිටුවට යොමු කරන ලදී.



<u>හික්කඩුව ධීවර වරාය වැඩි දියුණු කිරීම,</u>

මෙහිද සැලසුම් සකස් කිරීම සහ පාරිසරික බලපෑම් වාර්තාව (EIR) සකස් කිරීම අවසන් කර ඇති අතර එම වාර්තාව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමෙන්තුවේ තාක්ෂණික කමිටුවට යොමු කරන ලදී.



<u>වාලච්චෙන ධීවර වරාය සංවර්ධනය කිරීම,</u>

- මෙම සංවර්ධන කටයුත්තට අදාළ සැලසුම් සකස් කිරීම අවසන් කර ඇති අතර පාරිසරික බලපෑම් වාර්තාව (EIR) සඳහා වන අනුමැතියද ලැබී ඇත. අනුමැතිය ලැබී ඇති අතර 2026 වර්ෂයේදි ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

<u>දොඩංදුව ධීවර වරාය වැඩි දියුණු කිරීම</u>

- මීට අදාළ සැලසුම් සකස් කිරීම අවසන් කර ඇත. පාරිසරික බලපෑම් වාර්තාව (EIR) සකස් කිරීම අවසන්ය. එම වාර්තාව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමෙන්තුවේ තාක්ෂණික කමිටුවට යොමු කරන ලදී.

5 මාවැල්ල නැංගුරම්පොළ ඉදිකිරීම

පාරිසරික අනුමැතිය සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර පාර්ශ්වකරුවන් සමඟ එම ඉදිකිරීම සඳහා සාකච්ඡාවක් පවත්වන ලදී. වෙරළ බාදනය සඳහා වූ ව්‍යුහාත්මක සැලැස්මට පාර්ශ්වකරුවන් එකඟ වූහ. මේ වන විට සැලසුම්, ලංසු කැඳවීම සඳහා ලංසු ලේඛනය සකස්කර අවසන් කර ඇති අතර, කොන්ත්‍රාත් කරුවෙකු තොරා ගැනීම සඳහා වන ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට නියමිතය.

6 රූකව නැංගුරම්පොළ ඉදිකිරීම

- සැලසුම් කිරීම අවසන් කර ඇත. ඉදිරි අනුමැතීන් සඳහා යොමු කළ යුතුව ඇත.

7 උතුරු පළාතේ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම

2024 අයවැය යෝජනාව යටතේ උතුරු පළාතේ පවතින ධීවර තොටුපොළවල් හා නැංගුරම්පොළ සංවර්ධනය වෙනුවෙන් රු. මි. 500ක් වෙන් කරන ලදී. 2025 අයවැය මඟින් උතුරු පළාතේ පවතින ධීවර තොටුපොළවල් හා නැංගුරම්පොළ සංවර්ධනය වෙනුවෙන් වෙන් කළ මුදල රු. මි. 280කි.
යාපනය, මන්නාරම, මුලතිව්, හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල පවතින ධීවර තොටුපොළවල් 62ක් සංවර්ධනය කරනු ලබයි.

ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය : රු.මි. 183.41 (2025.08.31 දිනට). මේ වන විට වැඩ අවසන් කර ඇත.

මන්නාරම දිස්ත්‍රික්කයේ ධීවර තොටුපොළවල් 4ක සංවර්ධන ප්‍රගතිය

- ඇළ මාර්ගය හැරීම - පල්ලිමුනෙයි ගොඩබෑමේ ස්ථානය - ප්‍රගතිය 100%
- සවේරියපුරම් වෙරළ පාර දුර මීටර් 700 ඉදිකිරීම – ප්‍රගතිය 100%
- තෝමයාර්පුරම් විලාවතුරෙයි වෙරළ පාර දුර මීටර් 500 ඉදිකිරීම - ප්‍රගතිය 100%
- කොණ්ඩච්චි කුඩා/කක්කුපුඩයියන් - වෙරළ පාර ඉදිකිරීම– ප්‍රගතිය 100%

මුලතිව් දිස්ත්‍රික්කය

- මුලතිව් දිස්ත්‍රික්කයේ ධීවර තොටුපළවල් 4ක සංවර්ධන ප්‍රගතිය

- ඉරණපාලෙයි අන්තෝනියාර් පල්ලිය පාර දුර මීටර් 500 සංවර්ධනය කිරීම– ප්‍රගතිය 100%
- තීතකරයි ධීවර තොටුපොළ දැල් සැකසුම් ගොඩනැගිල්ල ඉදිකිරීම– ප්‍රගතිය 100%
- චම්මලෙයි ගම් සභා පාර දුර මීටර් 900 සංවර්ධනය කිරීම– ප්‍රගතිය 100%
- නීතාල් මුල්ලිවයික්කාල් සින්නප්පාර් පල්ලිය පාර දුර මීටර් 900 සංවර්ධනය කිරීම– ප්‍රගතිය100%
- උප්පමවෙලි පාරේහි මීටර් 900 සංවර්ධනය කිරීම – ප්‍රගතිය 100%

<u>කිලිනොච්චි දිස්ත්‍රික්කය</u>

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ධීවර තොටුපොළවල් 09ක් සංවර්ධනය කරනු ලබයි. එයින්,

- යාත්‍රා ප්‍රවේශ මාර්ගය පිරිසිදු කිරීම් 03 ක්ද,
  - ✓ නාවිකුඩා.ඉරනිමාතා නගර් තොටුපොළෙහි යාත්‍රා ප්‍රවේශ මාර්ගය පිරිසිදු කිරීම - ප්‍රගතිය 100%
  - ✓ නාවිකුඩා, යග්බර් තොටුපොලෙහි යාත්‍රා ප්‍රවේශ මාර්ගය පිරිසිදු කිරීම - ප්‍රගතිය 100%
  - ✓ පූනකරි. වලයිමති තොටුපොලෙහි යාත්‍රා ප්‍රවේශ මාර්ගය පිරිසිදු කිරීම - ප්‍රගතිය 100%
- දැල් සැකසුම් ගොඩනැගිල්ල ඉදිකිරීම් 01 ක්ද,
  - ✓ නාවිකුඩා සහ නල්ලයන් තොටුපොලෙහි දැල් සැකසුම් ගොඩනැගිල්ල ඉදිකිරීම - ප්‍රගතිය 100%
- මත්ස්‍ය වෙන්දේසි ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම් 01ක්ද,
  - ✓ නාවිකුඩා කුම්ලමුවානි මත්ස්‍ය වෙන්දේසි ශාලාව ප්‍රතිසංස්කරණය - ප්‍රගතිය 100%
- මත්ස්‍ය වෙන්දේසි ශාලාව හා දැල් සැකසුම් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම් 02ක්ද,
  - ✓ නාවිකුඩා කිරංචි මත්ස්‍ය වෙන්දේසි ශාලාව හා දැල් සැකසුම් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය - ප්‍රගතිය 100%
  - ✓ පූනකරි කවුතාරිමුනේ මත්ස්‍ය වෙන්දේසි ශාලාව හා දැල් සැකසුම් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය - ප්‍රගතිය 100%
- මාර්ග සංවර්ධනය කිරීම් 01ක්ද,

නාවිකුඩා වලයිපාඩු ශාන්ත ආනා පන්සල පාර දුර මීටර 700 මාර්ග සංවර්ධනය කිරීම - ප්‍රගතිය 100%

- බීකන් විදුලි පහන් සවි කිරීම
  - ✓ පලෙයි කිලාලි බීකන් විදුලි පහන් සවි කිරීම - ප්‍රගතිය 100%

<u>යාපනය දිස්ත්‍රික්කය</u>

යාපන දිස්ත්‍රික්කයේ ධීවර තොටුපොළ සංවර්ධනය අදියර I හා II යටතේ ක්‍රියාත්මක වේ. එහි ප්‍රසම්පාදන කටයුතු නිමකර කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත.

- අදියර I - ප්‍රසම්පාදන කටයුතු නිමකර කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත. එමඟින්,
  - ✓ යාත්‍රා ගමන් කරන ඇළ මාර්ග තොටුපොළ 25 ක පිරිසිදු කිරීම් සිදු කෙරේ.
  - ✓ තොටුපොළ 17ක තොටුපොළ හා මාර්ගයන්හි Solar Light සවි කිරීම සිදු වේ.

- අදියර II - ප්‍රසම්පාදන කටයුතු නිම කර කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත. එමඟින්,
  - ✓ කට්කෝවල්ම් තීර්තක්කරෙයි වෙරළ පාර බෝක්කුවක් ඉදිකිරීම - ප්‍රගතිය 100%
  - ✓ උදයපුරම් වෙරළ පාර මීටර 1700 ප්‍රතිසංස්කරණය කිරීම - 100%
  - ✓ ගුරුනගර් වෙන්දේසි ශාලාව වාහන නැවැත්වීමේ ස්ථානය සංවර්ධනය කිරීම - ප්‍රගතිය 100%

අමාත්‍යාංශයේ විෂය පථයට අනුකූල වෙනත් කටයුතු

ජාතික දේශසීමාවට ඔබ්බෙන් පිහිටි ප්‍රදේශවල සමුද්‍ර ජෛව විවිධත්ව සංරක්ෂණය සහ තිරසාර භාවිතය සම්බන්ධයෙන් වන සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි රාජ්‍ය පාර්ශවකරුවකු බවට ශ්‍රී ලංකාව පත්වෙයි

ශ්‍රී ලංකාව, ජාතික දේශසීමාවට ඔබ්බෙන් පිහිටි ප්‍රදේශවල සමුද්‍ර ජෛව විවිධත්ව සංරක්ෂණය සහ තිරසාර භාවිතය සම්බන්ධයෙන් වන සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (ජාතික දේශසීමාවට ඔබ්බෙන් පිහිටි ප්‍රදේශවල සමුද්‍ර ජෛව විවිධත්ව සංරක්ෂණය සහ තිරසාර භාවිතය පිළිබඳ ගිවිසුම) පිළිබඳ අපරානුමත (පසුව අනුමත කළ) ලේඛනය, සම්මුතියේ රාජ්‍ය පාර්ශවකරුවෙකු බවට පත් වෙමින්, 2025 සැප්තැම්බර් 16 වැනි දින එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත ඉදිරිපත් කර ඇත.

ජාතික දේශසීමාවට ඔබ්බෙන් පිහිටි ප්‍රදේශවල සමුද්‍ර ජෛව විවිධත්ව සංරක්ෂණය සහ තිරසාර භාවිතය පිළිබඳ ගිවිසුම අපරානුමත කිරීම, සමුද්‍රීය පාලනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අඛණ්ඩ නායකත්වයේ තවත් සන්ධිස්ථානයක් සනිටුහන් කරයි. ජාතික දේශසීමාවට ඔබ්බෙන් පිහිටි ප්‍රදේශවල සමුද්‍ර ජෛව විවිධත්ව සංරක්ෂණය සහ තිරසාර භාවිතය පිළිබඳ ගිවිසුම අපරානුමත කිරීමෙන්, ජාතික දේශසීමාවට ඔබ්බෙන් පිහිටි ප්‍රදේශවල සමුද්‍ර ජාන සම්පත් (MGRs) සහ ඩිජිටල් අනුක්‍රමික තොරතුරු (DSI) වැනි සම්පත් සාධාරණ හා යුක්තිසහගත ලෙස බෙදා ගැනීම තුලින් ප්‍රතිලාභ ලබාගැනීමට ශ්‍රී ලංකාවට අවස්ථාව සැලසෙනු ඇත. මෙම ගිවිසුම මගින් ශාක්‍යතා සංවර්ධනය සහ සමුද්‍රීය තාක්ෂණ හුවමාරු කිරීම් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන අතර, එමඟින් ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවලට සමුද්‍ර ජෛව විවිධත්ව සංරක්ෂණය හා තිරසාර භාවිතය පිළිබඳ තම හැකියාවන් වැඩි දියුණු කරගැනීමට අවස්ථාවන් සලසයි. එපමණක් නොව, ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම, දේශගුණික විපර්යාසවලට මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම සහ තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලංකාවට අනෙකුත් ජාතීන් සමඟ සාමූහිකව කටයුතු කිරීමට ද මෙමඟින් අවස්ථාව සැලසෙයි.

ධාරිතා සංවර්ධනය සඳහා බෙංගාල බොක්ක වැඩසටහන් අන්තර්-රාජ්‍ය සංවිධානය මඟින් ලබාදෙන ලෝක වෙළෙඳ සංවිධාන යීවර සහනාධාර

ශ්‍රී ලංකාව ලෝක වෙළෙඳ සංවිධාන යීවර සහනාධාර ගිවිසුම පිළිගැනීමේ ලේඛනය භාරදෙන ලද අතර, ලෝක වෙළෙඳ සංවිධානය සමඟ ගිවිසුම සඳහා පිළිගැනීමේ ලේඛනයට 2025 අගෝස්තු 06 දින නිල වශයෙන් අත්සන් කරන ලදි. මෙම පියවර මගින් ශ්‍රී ලංකාව ‘‘පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්’’ යන ජාතික ප්‍රතිපත්තියෙහි ඇතුළත් ප්‍රතිපත්තියක් වන සාගර සම්පත් වගකීම් සහිතව කළමනාකරණය කිරීමේ කැපවීම නැවත තහවුරු කරයි.

ගිවිසුම අපරානුමත කිරීමෙන් නීති විරෝධී, වාර්තා නොකළ හා නියාමනය නොකළ යීවර කටයුතුවලට එරෙහි ව සටන් කිරීම සහ අධික ලෙස මසුන් ඇල්ලීමෙන් මත්ස්‍ය තොග ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව තම ජාතික නීති ගෝලීය ප්‍රමිතීන් සමඟ ගැළපීම සිදු කරන අතර, එමඟින් සාගර ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමේ ගෝලීය උත්සාහයන් සඳහා තම භූමිකාව ශක්තිමත් කරයි.

ගිවිසුම යටතේ පිහිටුවන ලද විශේෂිත අරමුදල මගින් තාක්ෂණික සහාය සහ ධාරිතා සංවර්ධන සහාය ලබාගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීමේ ක්‍රියාවලියෙහි ශ්‍රී ලංකාව මේ වන විට නියැළෙමින් සිටී.

02
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (DFAR)

දැක්ම

ධීවර සහ ජලජ සම්පත් තිරසරභාවයෙන් යුක්තව පවත්වා ගනිමින් ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම හරහා ජාතික ආර්ථිකයට ප්‍රශස්ථ දායකත්වයක් ලබාදීම.

මෙහෙවර

ධීවර කර්මාන්තයෙහි තිරසාර සංවර්ධනය හරහා ශ්‍රී ලංකා ආර්ථිකයට ඵලදායී දායකත්වයක් ලබාදීමට ජාතික හා ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව නව තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කරමින් ධීවර සහ ජලජ සම්පත් කළමණාකරණය කිරීම.

අරමුණු

- දේශීය ,ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව ධීවර කටයුතු කළමනාකරණය, සංරක්ෂණය සහ තිරසර සංවර්ධනය විධිමත් කිරීම
- ධීවර ක්ෂේත්‍රයේ දේශීය හා විදේශීය ආයෝජන දිරිගැන්වීම.
- දේශීය සහ ජාත්‍යන්තර මුහුදේ මත්ස්‍ය සම්පත් නෙළීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම.
- ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය නන්වාලීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන්හි තත්ත්වය සහ සුරක්ෂිතතාවය සහතික කිරීම.
- පසුඅස්වනු නාස්තිය අවම කිරීම සහ දේශීය මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම.
- අන්තර් ජාතික ප්‍රඥප්ති සහ කලාපීය සම්මුතීන්ට අනුකූලව ධීවර මෙහෙයුම් සිදු කරන බවට සහතික වීම.
- වරාය රාජ්‍ය පියවරයන් ක්‍රියාත්මක කිරීමේ නියෝග මාලාවට අනුව වරාය සේවා ක්‍රියාත්මක කිරීම.
- මහමුහුදේ ධීවර කටයුතුවල යෙදෙන යාත්‍රාවල මෙහෙයුම් අධීක්ෂණය හා ආරක්ෂාව තහවුරු කිරීම.
- තොරතුරු තාක්ෂණය භාවිතයෙන් මාර්ගගත ක්‍රමයට ධීවර ජනතාවට හා අනෙකුත් සේවාදායකයින්ගට ප්‍රශස්ත සේවාවක් සැලසීම.
- තොරතුරු තාක්ෂණය භාවිතයෙන් මාර්ගගත ක්‍රමයට ධීවර ක්ෂේත්‍රයට අදාළ දත්ත තොරතුරු කඩිනමින් හා නිරවුල්ව ලබා ගත හැකි වීම.

ප්‍රධාන කාර්යයන්

- “ධීවර මෙහෙයුම් නියෝග” සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ධීවර කළමනාකරණ නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ජලජීවී වගා කළමනාකරණ නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම, උකස් කිරීම හා ධීවර මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම.
- සජීව මසුන් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- විදේශීය ධීවර යාත්‍රා සඳහා මසුන් ගොඩබෑම පිණිස බලපත්‍ර නිකුත් කිරීම.
- ධීවර කළමනාකරණය පිළිබඳ ධීවර ජනතාවගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම.
- ධීවර යාත්‍රා නිෂ්පාදන ආයතන ලියාපදිංචි කිරීම නියාමනය හා අධීක්ෂණය කිරීම.
- ධීවර යෙදවුම් සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීම නියාමනය සහ අධීක්ෂණය කිරීම.
- ධීවර සමුපකාර සමිති කාර්යක්ෂම මට්ටමට ගෙන ඒම සඳහා මාර්ගෝපදේශකත්වය සැපයීම.
- ජාතික ධීවර සම්මේලනය යටතේ පිහිටුවා ඇති ග්‍රාමීය ධීවර සංවිධාන සම්බන්ධීකරණය හා අධීක්ෂණය.
- ධීවර කර්මාන්තයට අදාළ දත්ත රැස් කිරීම.
- විදේශ රටවල් විසින් අත්අඩංගුවට ගැනෙන ධීවර කාර්මිකයින් හා යාත්‍රා ආපසු ලංකාවට ගෙන්වා ගැනීම.
- මුහුදේ අතරමං වන ධීවර කාර්මිකයින් හා යාත්‍රා ආපසු ලංකාවට ගෙන්වා ගැනීම.
- අපනයන කරනු ලබන මසුන් තත්ත්ව පරීක්ෂණයට භාජනය කිරීම.
- මසුන් සකස් කිරීමේ ස්ථාන ලියාපදිංචි කිරීම සහ මත්ස්‍ය අපනයනය සඳහා ස්වස්තථා සහතික නිකුත් කිරීම.
- දේශීය පරිභෝජනය සඳහා මසුන් වෙළෙඳාම් කරන ස්ථානවල තත්ත්වය උසස් කිරීම.
- මහ මුහුදේ ධීවර කර්මාන්තයට එක් වූ බහුදින යාත්‍රා සඳහා යාත්‍රා නිරීක්ෂණ උපකරණ සවිකිරීම හා අධීක්ෂණය.
- ධීවර යාත්‍රා සහ ගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ සන්නිවේදන පහසුකම් ලබාදීම.
- දේශසීමාවන් උල්ලංඝනය කරමින් ගමන් කරන ධීවර යාත්‍රා පිළිබඳ වාර්තා ලබාගැනීම හා නියාමනය.
- දිනපතා කාලගුණ වාර්තා හා අයහපත් කාලගුණික පූර්ව තොරතුරු දෛනිකව ලබා දීම.
- යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මගින් ලබාදෙන තොරතුරු අනුව යාත්‍රා දැනුවත් කිරීම.
- අනවසර විදේශීය ධීවර යාත්‍රා හා කාර්මිකයින් පිළිබඳ අදාළ ආයතන දැනුවත් කිරීම.
- ධීවර යාත්‍රාවල සන්නිවේදන කටයුතු සඳහා බලපත්‍ර හා ඇමතුම් සංඥා ලබාදීමට කටයුතු කිරීම.
- ධීවර කාර්මිකයින් හා යාත්‍රා සම්බන්ධ අනතුරුවලදී රක්ෂණය සඳහා තොරතුරු සනාථ කරදීම.
- අන්තර්ජාතික මුහුදු සීමාවන්හි පාවෙමින් තිබෙන යාත්‍රා බේරා ගැනීමට කටයුතු කිරීම.
- ධීවර පවුල්වල සාමාජිකයන්ගේ වෘත්තීය අධ්‍යාපනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

1.0 සංවර්ධන අංශය

ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට වැඩි දායකත්වයක් ලබා දීම සඳහා කාර්යක්ෂම සහ පරිසර හිතකාමී නව තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතයෙන් ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම, විධිමත් කිරීම මගින් මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම හා ධීවර ප්‍රජාවගේ සමාජීය, ආර්ථික හා සමාජ සුබසාධක තත්ත්වය ඉහළ නැන්වීමට අවශ්‍ය පියවර ගැනීම ධීවර සංවර්ධන අංශයේ ප්‍රමුඛතම වගකීම වේ.

1.1 ධීවර සංවර්ධන අංශයේ මූලික කාර්යභාරය

- ධීවර යාත්‍රා නිෂ්පාදන ආයතන ලියාපදිංචි කිරීම නියාමනය හා අධීක්ෂණය කිරීම
- ධීවර යාත්‍රා සැලසුම් සඳහා අනුමැතිය ලබා දීම
- ධීවර යෙදවුම් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම නියාමනය සහ අධීක්ෂණය කිරීම
- ධීවර ක්ෂේත්‍රය සඳහා නව තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම හා ප්‍රවර්ධනය කිරීම
- වෙරළාශ්‍රිත ඉදි කිරීම් ව්‍යාපෘතිවලට අදාළව පාරිසරික ඇගයීම් වාර්තා සඳහා ධීවර කර්මාන්තයන්ට බාධාවක් නොවන පරිදි නිර්දේශ ලබාදීම.
- ධීවර ක්ෂේත්‍රයට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය.
- විකල්ප ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ධීවර සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ධීවර ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- ධීවර කාර්මික රක්ෂණය ක්‍රියාත්මක කිරීම.
- ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම මගින් ධීවර සමාජ ආරක්ෂණය තහවුරු කිරීම.
- ධීවර වන්දි ලබා දීම පිළිබඳ කටයුතු කිරීම.
- දියවර කැකුළු ළමා ඉතුරුම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- කලපු පරිසර පද්ධතිය සංවර්ධනය හා සංරක්ෂණය විධිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- කලපු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම.
- සියලුම දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණය කරමින් ප්‍රගති සමාලෝචනය කිරීම.
- විශේෂ ධීවර ගැටලු නිරාකරණය කිරීම.

1 2.ධීවර කාර්මිකයින්ගේ සුරක්ෂිතතාව තහවුරුකිරීම

වගුව :01 ධීවර කාර්මිකයින්ගේ සුරක්ෂිතතාව තහවුරු කිරීම සම්බන්ධ කාර්යවල ප්‍රගතිය

කාර්යය	2025.08.31 දක්වා ප්‍රගතිය
රක්ෂණය කරන ලද සමස්ථ ධීවර යාත්‍රා සංඛ්‍යාව	27,986
රක්ෂණය කරන ලද සමස්ථ ධීවර කාර්මිකයින් සංඛ්‍යාව	10,194
ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වූ සංඛ්‍යාව	69,095
මුහුදු යෝග්‍යතා සහතික නිකුත් කිරීම්	28,421
ධීවර යාත්‍රාංගන ලියාපදිංචි කිරීම්	35
ධීවර ආම්පන්න සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම්	19
ධීවර උපකරණ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම්	07
ස්වාභාවික විපත් සඳහා වන්දි ලබා දීම්	02
දියවර කැකුළු ළමා ඉතුරුම් ගිණුම් විවෘත කිරීම්	316
නිකුත් කර ඇති මුළු ධීවර හැඳුනුම්පත් සංඛ්‍යාව	1528
නිකුත් කර ඇති මුළු යාත්‍රා නියමු බලපත්‍ර සංඛ්‍යාව	871

1.3 දියවර දිරිය ණය යෝජනා ක්‍රමය

දියවර දිරිය අදියර එක (1) යටතේ ප්‍රතිලාභීන් 755දෙනෙකු සඳහා රුපියල් බිලියන1ක ණය මුදලක් ලබා දී ඇති අතර දියවර දිරිය අදියර දෙක (11) යටතේ ප්‍රතිලාභීන් 1017දෙනෙකු සඳහා රුපියල් බිලියන1.8ක ණය මුදලක් ලබා දී ඇත. මේ වන විටත් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් මෙහි 4% ක පොලී වාරික මුදල් ලංකා බැංකුව වෙත යොමු කරන අතර එය 2031 වන තෙක් ගෙවීම් සිදු කිරීමට ඇත.

1.4 2025 වර්ෂයේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් සහ එහි ප්‍රගතිය

1.4.1 ආර්ථික අර්බුදය හේතුවෙන් ධීවර කර්මාන්තයට සිදු වී ඇති බලපෑම අවම කර, ධීවර කර්මාන්තය යථාවත් කිරීමේ වැඩසටහන

මෙම වැඩසටහන යටතේ මේ වන විට ධීවර දිස්ත්‍රික්ක 15 ට අදාළව 2024 ඔක්තෝබර්,නොවැම්බර්, දෙසැම්බර්, 2025 ජනවාරි,පෙබරවාරි හා මාර්තු වලට අදාළව OFRP,IMUL,I DAY,MTRB යාත්‍රා හිමිකරුවන් 154,035 දෙනෙකු සඳහා රුපියල් 2,086,706,652.52 ක මුදලක් ලබා දී ඇත.

1.4.2 මැයි මස 21 වන දින සිදු වූ MV X- Press Pearl භාණ්ඩ ප්‍රවාහන නෞකාව ගිනිගැනීමේ සිද්ධිය හේතුවෙන් ධීවර ක්ෂේත්‍රයට සිදු වූ බලපෑම නියාමනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග ප්‍රගතිය

MV X-Press Pearl නෞකාව භාණ්ඩ ප්‍රවාහනය කරමින් සිටිය දී කොළඹට ආසන්න මුහුදේ දී 2021.05.20 වන දින, නෞකාවේ ගින්නක් වාර්තා වූ අතර, එය මුලින් පාලනය කරන ලද නමුත්, නැවත දැල්වී දින කිහිපයක් පැවතුනි. 2021.06.02 වන දින පමුණුගම වෙරළට ඔබ්බෙන් මෙම නෞකාව මුළුමනින්ම ගිලී ගිය අතර මෙය රටේ සාගර පරිසරයට මෙතෙක් සිදු වූ දරුණුතම ව්‍යසනය වශයෙන් හැඳින්වේ.

විෂ සහිත/අනතුරුදායක රසායනික ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් මුදාහැරීම නිසා ඇති වූ සමුද්‍ර දූෂණයේ ප්‍රමාණයට, බහාලුම් 20ක අඩු-ඝනත්ව සහ අධි-ඝනත්ව පොලි එතිලීන් බෑග් 46,960 ක් ඇතුළත් වූ අතර, එමඟින් බටහිර වෙරළ තීරයට අවම වශයෙන් ප්ලාස්ටික් නර්ඩල් බිලියන 70-75ක් වත් විසිරී ගියේය. සමුද්‍ර දූෂණය හේතුවෙන් කැස්බෑවන්, ඩොල්ෆින්, තල්මසුන් සහ සිද්ධියෙන් පසු වෙරළට ගසාගෙන පැමිණි මත්ස්‍ය විශේෂ විශාල සංඛ්‍යාවක් මිය ගිය අතර, මෙම ව්‍යවසනයට හේතුව සමුද්‍ර දූෂණය බව තහවුරු විය.

අධික සමුද්‍ර දූෂණය හේතුවෙන්, බටහිර වෙරළබඩ ප්‍රදේශයේ වසරකට වැඩි කාලයක් සඳහා රජය විසින් ධීවර තහනමක් පනවන ලදී. බලපෑමට ලක් වූ ප්‍රදේශයේ දීර්ග කාලයක් තිස්සේ පැවති මත්ස්‍ය තහනම හේතුවෙන් සෘජු ධීවරයින් සහ ධීවර කර්මාන්තයේ වක්‍ර ප්‍රතිලාභීන් සැලකිය යුතු පිරිසක් මෙම සිද්ධියෙන් පීඩාවට පත් වූ අතර එසේ පීඩාවට පත් පාර්ශ්වයන් ලෙස ධීවරයින් කාණ්ඩ 23ක් සහ ධීවර කර්මාන්තයට සම්බන්ධ වෙනත් වෘත්තීන් වර්ග 24ක් හඳුනා ගන්නා ලදී.

වගුව 02 : බලපෑමට ලක් වූ සෘජු ධීවරයින් පිළිබඳ තොරතුරු

දිස්ත්‍රික්කය	සෘජු බලපෑමට ලක්වූ ධීවර පරීක්ෂක කොට්ඨාස සංඛ්‍යාව	බලපෑමට ලක් වූ සෘජු ධීවර කාර්මිකයින් සංඛ්‍යාව	බලපෑමට ලක් වූ වක්‍ර ධීවර කාර්මිකයින් සංඛ්‍යාව
ගම්පහ	13	11,081	3,866
කොළඹ	10	3,250	851
කළුතර	02	701	171

ඉහත සඳහන් කර ඇති සෘජු ධීවරයින් සඳහා අදියර 04කිනුත්, වක්‍ර ධීවරයින් සඳහා එක් අදියරකිනුත් පහත පරිදි මේ වන විට වන්දි ගෙවා ඇත.

වගුව 03 : ලබා දුන් වන්දි ප්‍රමාණය

දිස්ත්‍රික්කය	ලබා දුන් වන්දි ප්‍රමාණය (රුපියල්)				
	1 වන අදියර (රු)	2 වන අදියර (රු)	3 වන අදියර (රු)	4 වන අදියර(රු)	මුළු මුදල (රු)
ගම්පහ	206,197,500.00	242,825,000.00	551,220,000.00	1,006,356,485.90	2,006,598,985.90
කොළඹ	58,942,500.00	74,720,500.00	205,233,125.00	300,846,344.00	639,742,469.00
කළුතර	14,170,000.00	16,312,500.00	37,285,000.00	72,880,360.00	140,647,860.00
දැල් ආම්පන්න සඳහා	2,067,515.00			4,474,410.00	6,541,925.00
ජලජීවී වගාවන්ට සිදු වූ හානි පූරණය		1,154,930.00			1,154,930.00
මුළු මුදල (රු)	281,377,515.00	335,012,930.00	793,738,125.00	1,384,557,599.90	2,794,686,169.90

පරිපාලන වියදම් දීමනාව ලබා දීම

එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ශ්‍රී ලංකා මුහුදු තීරයේ දී ගිනි ගෙන මුහුදු බත් වීම හේතුවෙන් සිදු වූ හානිය හඳුනා ගැනීම, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා රාජ්‍ය ආයතන කිහිපයක් එකතු වී කටයුතු කරන ලදී. ඒ සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිත ආයතනය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල යන රාජ්‍ය ආයතන ඉතා විශාල දායකත්වයක් දුන් අතර මේ වන විට ද අවශ්‍ය සියලු කටයුතු සඳහා සහයෝගය ලබා දෙමින් පවති.

ඒ අනුව, ධීවර ක්ෂේත්‍රයට සිදු වූ හානි තක්සේරු කිරීම, ජීවිකාව අහිමි වූ පුද්ගලයන් හඳුනා ගැනීම, හා වන්දි ගෙවීම ඇතුළු පරිපාලනමය කාර්යයන් සිදු කිරීම වෙනුවෙන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අදාළ රාජකාරි ඉටු කරන ලද නිලධාරීන් 292ක් සඳහා 2021.05.21 දින සිට සිදු කරන ලද රාජකාරි වෙනුවෙන් දීමනාවක් ගෙවීමට කටයුතු කරන ලදී.

ධීවරයින් විසින් ඉදිරිපත් කරන ලද අභියාචනා

එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුර හේතුවෙන් අගතියට පත් වුවත්, වන්දි ඉල්ලීම් කිරීමට නොහැකි වූ ධීවර හා ධීවර ආශ්‍රිත රැකියා සිදු කරන ලද බව පවසා පුද්ගලයින් විසින් අභියාචනාව වරින් වර ඉදිරිපත් කරන ලද අතර එම අභියාචනා අභියාචනා කමිටු හා ග්‍රාමීය, ප්‍රාදේශීය, දිස්ත්‍රික් කමිටු වෙත ඉදිරිපත් කර සත්‍ය වශයෙන්ම අගතියට පත් පුද්ගලයන් නිර්දේශ කර, අදාළ රක්ෂණ සමාගම වෙත ඉදිරිපත් කිරීමට ධීවර ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ලබා දෙන උපදෙස් අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.

වගුව 04 : මුළු අභියාචනා සාරාංශය

	මුළු අභියාචනා සාරාංශය			
	දිස්ත්‍රික්කය	ලැබුණු මුළු අභියාචනා සංඛ්‍යාව	අභියාචනා කමිටු මඟින් නිර්දේශ කරන ලද සංඛ්‍යාව	ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් කමිටු නිර්දේශ කරන ලද සංඛ්‍යාව
1	ගම්පහ(මීගමුව)	6,097	3,136	2,033
2	කොළඹ	307	245	173
3	කළුතර	226	142	108
	මුළු සංඛ්‍යාව	6,630	3,523	2,314

1.4.3 ධීවර තොටුපළවල ආරක්ෂාව වැඩිදියුණු කිරීම

ධීවර තොටුපළ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අරමුණු කොටගෙන බීකන් පහන් හා විදුලි පහන් සවි කිරීමේ ව්‍යාපෘතියට අදාලව බීකන් පහන් 45lක් මිලදීගෙන තෝරාගත් ධීවර තොටුපළ වෙත ලබාදීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇති අතර, අදාළ මිලදී ගැනීම් සිදු කරමින් පවතී. තවද ඉදිරියේදී මීට අමතරව බීකන් පහන් 22ක් හා විදුලි පහන්ද මිලදීගෙන තෝරාගත් ධීවර තොටුපළ වෙත ලබාදීමට නියමිතය.

1.4.4 ස්වභාවික විපත් හෝ වෙරළාසන්න ධීවර කර්මාන්තයට සිදුකරන බාධා කිරීම් හේතුවෙන් ධීවර කර්මාන්තයට වන බලපෑම් අවම කිරීම (යටිතල පහසුකම් සංවර්ධනය /2090-1-1-13-2506)

පුත්තලම, මාතර, යාපනය හා මීගමුව යන ධීවර දිස්ත්‍රික්කවල ක්‍රියාත්මකවන සුළුපන්න ධීවර යාත්‍රාවල ගමන් මාර්ගය පහසු කිරීමේ අරමුණින්, ඇළ මාර්ග/ මෝය කටවල් පිරිසිදු කර, සංවර්ධනය කිරීමට සහ යාපනය මයිලඩි වරායේ ධීවර යාත්‍රා නැංගුරම්ලෑම පහසු කිරීම සඳහා රු.මිලියන 3ක ප්‍රතිපාදන අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යොමු කර ඇත.

1.4.5 නව ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ඒකාබද්ධව නව ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීමට නියමිතය. මෙම නව ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමය සම්බන්ධයෙන් මේ වන විට ධීවර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා අවසන්ය. ඉදිරියේදී ධීවර ප්‍රජාව මෙම ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් දැනුවත් කර, නව බඳවාගැනීම් සිදු කිරීමට යෝජිතය.

1.4.6 උතුරු හා නැගෙනහිර පළාත්, වල අඩු ආදායම්ලාභී ධීවර පවුල් සඳහා චීන සමූහාණ්ඩු ආධාර යටතේ පෙර සැකසූ නිවාස 500ක් ලබාදීමේ වැඩසටහන

චීන සමූහාණ්ඩු ආධාර යටතේ ශ්‍රී ලංකා රජයට රුපියල් මිලියන 750ක වටිනාකමකින් යුත් පෙර සැකසූ නිවාස 500ක් පරිත්‍යාග කර ඇති අතර එම පෙර සැකසූ නිවාස යාපනය, කිලිනොච්චි, මඩකලපුව, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය හා කල්මුණේ යන දිස්ත්‍රික්ක තුළ සක්‍රීය ධීවර කර්මාන්තයේ නියැලෙන අඩු ආදායම්ලාභී ධීවර කාර්මිකයින් සඳහා ඉදිකර දීමට නියමිතය. මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායකවලට අනුකූලව, සියලුම දිස්ත්‍රික්කවල ප්‍රතිලාභීන් හඳුනා ගැනීම අවසන්ව ඇත. පෙරසවි නිවසේ පාදම සකස් කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය මිළදී ගැනීමේ කටයුතු හා පාදම සකස් කිරීමේ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී.

මඩකලපුව දිස්ත්‍රික්කය

කිලිනොච්චි දිස්ත්‍රික්කය

1.4.7 උතුරු හා නැගෙනහිර පළාත් වල අඩු ආදායම්ලාභී ධීවර පවුල් සඳහා චීන සමූහාණ්ඩු ආධාර යටතේ මත්ස්‍ය දැල් 75,000ක් ලබාදීමේ වැඩසටහන

වගුව 05: දැල් සහනාධාරය බෙදා හැරීමේ සාරාංශය

දිස්ත්‍රික්කය	තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව	එක් එක් දිස්ත්‍රික්කය සඳහා අනුමත හා ප්‍රවාහනය කල දැල් සංඛ්‍යාව	දැල් බෙදා දුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව	බෙදා දුන් දැල් සංඛ්‍යාව
යාපනය	3,614	21,684	3,449	20,694
ත්‍රිකුණාමලය	2,625	15,750	2,482	14,892
මන්නාරම	2,309	13,854	2,006	12,036
මඩකලපුව	1,589	9,534	1,370	8,220
මුලතිවු	583	3,498	466	2,796
කල්මුණේ	887	5,322	887	5,322
කිලිනොච්චි	870	5,220	665	3,990
එකතුව	**12,477**	**74,862**	**11,325**	**67,950**

2.0 කළමණාකරන අංශය

2.1 ධීවර හා ජලජ සම්පත් තිරසාර ලෙස කළමනාකරණය

ධීවර කළමනාකරණය යනු ධීවර හා සාගර සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම සහ සංරක්ෂණය කිරීම අරමුණු කරගත් බහුවිධ ප්‍රවේශයකි. 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත අනුව සකස් කරන ලද ශක්තිමත් නියාමන රාමු සහ ප්‍රතිපත්ති මගින් පාලනය වන අතර එයට බලපත් නියාමනය සහ බලාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ අංශය සිදු කරයි. තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හි දේශීය මැදිහත්වීම් සහතික කරමින් ප්‍රජා පාදක කළමනාකරණය මුල පිරීම් හරහා ප්‍රජා සහභාගීත්වය දිරිමත් කරනු ලැබේ. සමස්ථයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ ධීවර කළමනාකරණය වර්තමාන සහ අනාගත පරම්පරාවේ ප්‍රයෝජනය සඳහා පාරිසරික සංරක්ෂණය සමඟ සමාජ-ආර්ථික අවශ්‍යතා සමතුලිත කිරීමට උත්සාහ කරයි. මෙම දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ අංශය ඉහත ක්‍රියාකාරකම් සිදුකිරීමේ වගකීම දරන අතර එම අංශයේ ප්‍රධාන කාර්යයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

අරමුණ

මෙම අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ ධීවර යෙදවුම් සහ මෙහෙයුම් නියාමනය මගින් ධිවර හා සාගර සම්පත් කළමනාකරණය කිරීමත් ප්‍රජා සහභාගීත්වයෙන් මුහුදු, කලපු සහ ජලාශවල ධීවර සම්පත් සංරක්ෂණය හා කළමනාකරණය මගින් ශ්‍රී ලංකාවේ ධීවර ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් අත්කර ගැනීමයි.

අංශයේ කාර්යයන්

- ධීවර රෙගුලාසි සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම.
- ධිවර යාත්‍රා පැවරීම(බහුදින ධිවර යාත්‍රා).

- ධීවර යාත්‍රා උකස් කිරීම හා ධීවර යාත්‍රා උකස් නිරවුල් කිරීම.
- ධීවර යාත්‍රා ලියාපදිංචිය අවලංගු කිරීම.
- ජාත්‍යන්තර මුහුදේ ධීවර මෙහෙයුම් සඳහා මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම.
- දේශීය මුහුදේ ධීවර මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම.
- විදේශීය යාත්‍රා සඳහා මාළු ගොඩබෑමේ බලපත්‍ර නිකුත් කිරීම.
- විසිතුරු මසුන් සඳහා ආනයන, අපනයන සහ ප්‍රතිඅපනයන බලපත්‍ර නිකුත් කිරීම.
- මුහුදු කුඩැල්ලන් හා පොකිරිස්සන් ඇල්ලීම, සන්තකයේ තබාගැනීම, ප්‍රවාහනය සහ අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- හක්බෙල්ලන්, සිප්පිකටු සහ මෝරවරල්, නක්ලා, බෙල්ලන්ගේ මාංශ (ChicoreusRamosu) මුහුදු තෘණ සඳහා ප්‍රවාහනය සහ අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- පොකිරිස්සන් සන්තකයේ තබා ගැනීම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම.
- කෘතීම උපස්තර මත වගා කරන ලද කොරල් අපනයනය සඳහා බලපත්‍ර ලබා දීම
- ධීවර යාත්‍රා නියමුවන් සඳහා නියමු බලපත්‍ර නිකුත් කිරීම.
- මාදැල් වරායන් සහ හිමිකරුවන් ලියාපදිංචි කිරීම සහ වෙරළ තීරය සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ ගැටලු නිරාකරණය.
- මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සඳහා ලියාපදිංචි කිරීම හා කළමනාකරණ බලපත්‍ර නිකුත් කිරීම.
- මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා ලියාපදිංචි කිරීම හා කළමනාකරණ බලපත්‍ර නිකුත් කිරීම.
- මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන ප්‍රතිඅපනයනය සඳහා ලියාපදිංචි කිරීම හා කළමනාකරණ බලපත්‍ර නිකුත් කිරීම.
- නව යාත්‍රා ලියාපදිංචි කිරීමේ අංක වෙන් කිරීම, අනුමත කිරීම, නිකුත් කිරීම.
- විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක ධීවර කළමනාකරණය සම්බන්ධ සියලුම ව්‍යාපෘති කටයුතු.
- ජාත්‍යන්තර මුහුදේ ක්‍රියාත්මක වන යාත්‍රා ලැයිස්තුව සකස් කිරීම, නඩත්තු කිරීම හා අදාළ ආයතන වෙත වාර්තා කිරීම.
- විදේශ රටවල ධීවර රැකියාවේ යෙදීමට දේශීය ධීවරයන්ට අනුමැතිය ලබා දීම.
- විදේශ රටවලට දේශීය නිෂ්පාදිත යාත්‍රා අලෙවිය, පැවරීම කිරීමේදි අනුමැතිය ලබා දීම.
- විශේෂිත ධිවර කළමනාකරණ ප්‍රදේශ හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීම ඒ සම්බන්ධයෙන් අදාළ රෙගුලාසි සකස් කිරීම හා කළමනාකරණ සැපසුම් ක්‍රියාත්මක කිරීම.
- ඉලක්කගත මත්ස්‍ය විශේෂ සම්බන්ධයෙන් තොග සමීක්ෂණය අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව කළමනාකරණ ක්‍රමවේද හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම.
- නීති විරෝධී ධීවර කර්මාන්තය වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරකම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
- මෝර මත්ස්‍ය කළමනාකරණය සම්බන්ධ කටයුතු අධීක්ෂණය කිරීම සහ ජාතික ක්‍රියාත්මක සැලැස්ම ක්‍රියාත්මක කිරීම
- විනෝදාත්මක කටයුතු සඳහා මසුන් ඇල්ලීම පිළිබඳ බලපත්‍ර නිකුත් කිරීම (Recreational fishing activity).
- අපනයන මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන රේගු නිෂ්කාශන සඳහා ASYCUDA පද්ධතිය හරහා අනුමැතිය ලබා දීම.

ධීවර හා ජලජ සම්පත් තිරසාර ලෙස කළමණාකරණය කිරීම හා විධිමත් කිරීම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයක් වන අතර, ඒ සඳහා ධීවර යාත්‍රා, ධිවර මෙහෙයුම් වෙනුවෙන් කළමනාකරණ බලපත්‍ර නිකුත් කිරීම්, නිත්‍යානුකූල නොවන, අවිධිමත්, වාර්තා නොවන ධීවර කටයුතු වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම් සිදු කරන අතර 2025 වර්ෂයට අදාළව 2025.08.31 දින දක්වා පහත සඳහන් පරිදි විවිධ ධීවර මෙහෙයුම් හා යාත්‍රා සඳහා බලපත්‍ර ලබා දී ඇත.

වගුව 06: 2025 වර්ෂයේ 2025.08.31 දිනට අදාලව එක් එක් කාර්යන්හි ප්‍රගතිය

අනු අං	ක්‍රියාකාරකම	අපේක්ෂිත ඉලක්කය	2025.08.31 දිනට ප්‍රගතිය
1	ධීවර යාත්‍රා ලියාපදිංචිය (නව)	20,00	1,332
2	මහ මුහුදේ යාත්‍රා මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම	1,020	1,316
3	යාත්‍රා නියමු බලපත්‍ර නිකුත් කිරීම	500	81
4	විසිතුරු මසුන් ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම	25	35
5	විසිතුරු මසුන් අපයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම	30	28
6	විසිතුරු මසුන් ප්‍රතිඅපයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම	15	
7	කටු පොකිරිස්සන් අපනයනය සඳහා බලපත්‍ර ලබාදීම	80	26
8	කටු පොකිරිස්සන් ළඟ තබා ගැනීම,ප්‍රවාහනය	10	16
9	හක්බෙල්ලන් ළඟ තබා ගැනීම, ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදීම	80	40
10	හක්බෙල්ලන් අපනයනය සඳහා බලපත්‍ර ලබාදීම	40	17
11	මුහුදු කූඩැල්ලන් ඇල්ලීම, එකතු කිරීම, ළඟ තබා ගැනීම හා ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදීම	200	127
12	මුහුදු කූඩැල්ලන් ආනයනය, අපනයනය, ප්‍රතිඅපනයනය සඳහා බලපත්‍ර ලබාදීම	150	84
13	සිප්පි කටු එකතු කිරීම ප්‍රවාහනය සහ විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම	20	25
15	මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සඳහා ලියාපදිංචි කිරීම	200	106
16	මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා ලියාපදිංචි කිරීම	150	140
17	මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන ප්‍රතිඅපනයනය සඳහා ලියාපදිංචිකිරීම	13	7
18	නව යාත්‍රා සඳහා ලියාපදිංචි අංක වෙන්කිරීම, අනුමතකිරීම සහ නිකුත් කිරීම	IMUL-100	48
		OFRP-1000	1,392
		MTRB-250	106
		NTRB-500	355
		NBSB--0	2
19	නක්ලා (Operculum of ***Chicoreusramosus***) අපනයනය කිරීම සඳහා බලපත්‍රය	15	08
20	නක්ලා (Operculum of ***Chicoreusramosus***) සන්තකයේ තබාගැනීම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම	15	12
21	***Chicoreusramosus*** මාංශ සන්තකයේ තබා ගැනීම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවාහනයකිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම	30	11
22	***Chicoreusramosus*** මාංශ අපනයන බලපත්‍රය	15	8
23	අජීවී මුහුදු බෙල්ලන්ගේ කවච ප්‍රවාහනය කිරීම, සන්තකයේ තබා ගැනීම සහ ප්‍රදර්ශනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම	20	25
24	මුහුදු තෘණ, ප්‍රවාහනය කිරීම සහ අපනයනය කිරීම සඳහා බලපත්‍රය නිකුත් කිරීම.	8	9
25	ලොග් පොත් නිකුත් කිරීම	1,000	1,093

2.2 ජාතික ධීවර යාත්‍රා සංගණනය

යාවත්කාලීන වූ ධීවර යාත්‍රා තොරතුරු නොමැති වීම කළමනාකරණ තීරණ සඳහා අභියෝගයකි. මේ හේතුවෙන් අදියර කිහිපයක් යටතේ ශ්‍රී ලංකාවේ සියලුම ධීවර යාත්‍රා පිළිබඳ සංගණනයක් සිදු කිරීමට සැලසුම් කරන ලදි. මෙහි පළමු අදියර ලෙස පිටත එංජීම සහිත OFRP සහ MTRB යාත්‍රා සංගණනය අගෝස්තු මස 4 දින සිට දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදි. දෙවන හා තෙවන අදියර වශයෙන් සියලුම බහුදින ධීවර යාත්‍රා සහ යාන්ත්‍රික නොවන යාත්‍රාද සංගණනය කරනු ලැබේ. ඒ අනුව මේ වන විට දිවයින

වටා පිහිටි 900කට අධිකවූ ධීවර යාත්‍රා තොටුපළවල ඇති සියලුම පිටත එංජිම සහිත OFRP සහ MTRB යාත්‍රා සංගණනය සිදු කර අවසන් කර ඇත.

2.3 ධීවර යෙදවුම් හා ආම්පන්න පිළිබඳ පුහුණුව

ධීවර යාත්‍රා සංගණනයට සමගාමීව සියලුම ධීවර ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ධීවර ආම්පන්න හා ධීවර යෙදවුම් පිළිබඳ පුහුණුවක්, කලාවැව පුහුණු මධ්‍යස්ථානයේදී ලබා දෙන ලදි.

3.0 තත්ත්ව පාලන අංශය

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සහ පාරිභෝගික ආරක්ෂාව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාව සිය මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා දැඩි තත්ත්ව පාලන ක්‍රියාමාර්ගවලට ප්‍රමුඛත්වය ලබා දී ඇත. මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන අපනයන රෙගුලාසි යටතේ ඇති විධිවිධාන මගින් පාලනය වන මෙම ක්‍රියාවලිය සහතික කිරීම, පරීක්ෂා කිරීම, සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂක පිළිවෙත් පිළිපැදීම ඇතුළත් වේ. පසු විපරම් කිරීමේ පද්ධති (Traceability) සහ රසායනාගාර පරීක්ෂණ තත්ත්ව සහතිකය තවදුරටත් ඉහළ නන්වන අතර ධාරිතා ගොඩනැගීම මගින් කර්මාන්ත සේවකයින්ගේ කුසලතා වැඩි දියුණු කිරීම ආදිය සිදු කරයි. වෙළඳපල ප්‍රවේශ අවශ්‍යතා සපුරාලීමෙන් සහ නිෂ්පාදන අඛණ්ඩතාව පවත්වා ගැනීමෙන්, ගෝලීය වෙළඳපොළේ උසස් තත්ත්වයේ මුහුදු ආහාරවල විශ්වාසදායක මූලාශ්‍රයක් ලෙස ශ්‍රී ලංකාව සිය කීර්ති නාමය පවත්වා ගැනීම අරමුණු කරයි. මෙම දෙපාර්තමේන්තුවේ තත්ත්ව පාලන අංශය ඉහත ක්‍රියාකාරකම් සිදු කිරීමේ වගකීම දරන අතර එය ශ්‍රී ලාංකීය මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනය පිළිබඳ බලයලත් ආයතනය ලෙස ක්‍රියාත්මක වේ.
මෙම අංශය ප්‍රධාන වශයෙන් ධීවර නිෂ්පාදන අපනයනයට අදාළව ධීවර හා ජලජ සම්පත් පනත යටතේ බලත්මක වන පහත රෙගුලාසි ක්‍රියාත්මක කරමින් පවති.

- 1998 මත්ස්‍ය නිෂ්පාදන (අපනයන) රෙගුලාසිය
- 2003 අංක 01 දරන මත්ස්‍ය පිරිසැකසුම් නියෝග
- 2014 මසුන් ඇල්ලීම පිළිබඳ දත්ත රැස්කිරීමේ නියෝග
- 2002 ජලජීව් වගා (අවශේෂ අධීක්ෂණ) නියෝග

2014 වසරේ සිට කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ තත්ත්ව පාලන උප කාර්යාලය පිහිටුවන ලද අතර මෙම කාර්යාලය සතියේ දින හත පුරාවට දිවා රාත්‍රී දේශීය අපනයන කරුවන්ට සේවා සපයන (24X7) කාර්යාලය ලෙස ක්‍රියාත්මක වේ.

එයට අමතරව මේ වන විට දේශීය පාරිභෝගිකයා වෙත සෞඛ්‍ය ආරක්ෂිත මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන ලබා දීම පිළිබඳ අපගේ අවදානය යොමු වී ඇති අතර ඒ සඳහා අවශ්‍ය මූලික වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

තවද, තත්ත්ව පාලන අංශයේ රාජකාරී කටයුතු විධිමත් පරිදි සිදුකිරීම සඳහා පුරප්පාඩුව පැවති අනුමත නිලධාරී සංඛ්‍යාව බඳවාගැනීම් සිදු කරන ලදී. මේ අනුව මෙම අංශය තුළ තාක්ෂණික කාර්යය භාරයක් සිදුකරන තත්ත්ව පාලන නිලධාරී තනතුර සඳහා නවක නිලධාරීන් අට දෙනෙකු බඳවා ගැනීම සිදුකරන ලදී. ඒ අනුව තත්ත්ව පාලන අංශයේ ධාරිතාවය වැඩි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

එම අංශයේ ප්‍රධාන ඉලක්ක අරමුණු කාර්යයන් හා ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් පහත දැක්වේ.

ඉලක්කය
යුරෝපීය වෙළඳපොළට සහ අනෙකුත් විදේශීය වෙළඳපොළ සඳහා අපනයනය කරන මත්ස්‍ය නිෂ්පාදන සම්බන්ධයෙන් යුරෝපීය කොමිසම විසින් නියම කර ඇති අවශ්‍යතා සපුරාලීම සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කරන ලද මෙම අංශය 1999.01.04 දින සිට ක්‍රියාත්මක වූ අතර මේ වනවිට ශ්‍රී ලංකාව විසින් මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සිදු කරන සියලුම රටවල් සඳහා එම රටවල නිත්‍යානුකූල අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය කාර්ය භාරය ඉටු කිරීම සිදු කරයි.

අරමුණ
1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත යටතේ බලාත්මක වන මත්ස්‍ය නිෂ්පාදන (අපනයන) රෙගුලාසි ක්‍රියාත්මක කිරීම යටතේ ශ්‍රී ලංකාව විසින් මානව පරිභෝජනය සඳහා ජාත්‍යන්තර වෙළඳපොළට අපනයනය කරනු ලබන මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය ඉහළ නැංවීම මෙම අංශයේ ප්‍රධාන අරමුණ වේ.

කාර්යයන්

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තත්ත්ව පාලන අංශය විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරයි.

- මත්ස්‍ය පිරිසැකසුම් ආයතන සඳහා අනුමැතිය ලබා දීම හා ඒවාට අදාළ බලපත්‍ර නිකුත් කිරීම.
- මත්ස්‍ය පිරිසැකසුම් ආයතනවලට අපනයනය සඳහා මසුන් සකස් කිරීමට බලය ලබාදීම.
- HACCP ක්‍රමවේද විශ්ලේෂණ කිරීම හා එම ක්‍රමවේදයන් සඳහා අනුමැතිය ලබා දීම.
- මත්ස්‍ය පිරිසැකසුම් ආයතන නිරන්තරව පරීක්ෂාවට ලක් කිරීම හා නුසුදුසුතා නිවැරදි කිරීමට මග පෙන්වීම හා අවශ්‍ය කටයුතු කිරීම.
- මසුන් ගොඩබෑමේ ස්ථාන පරීක්ෂා කිරීම හා මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- අපනයනය සඳහා මසුන් සපයන ධීවර යාත්‍රා පරීක්ෂා කිරීම හා මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- මසුන් ගොඩබෑමේ ස්ථානවල සිට සැකසුම් කම්හල් වෙත මසුන් ප්‍රවාහනය පරීක්ෂා කිරීම මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- අපනයනය සඳහා එක් එක් මත්ස්‍ය තොග/ ධීවර නිෂ්පාදන තොග සඳහා සෞඛ්‍ය සහතික නිකුත් කිරීම.
- අපනයනය කරනු ලබන මත්ස්‍ය නිෂ්පාදනවල සෞඛ්‍ය ආක්ෂිතභාවය තහවුරු කරන පරීක්ෂණ වාර්තා (Test Report) නිකුත් කරනු ලබන පරීක්ෂණාගාර අනුමත කිරීම.
- අදාළ ස්ථානවලින් ලබාගත් සාම්පල අනුමත පරීක්ෂණාගාරවලදි පරීක්ෂාවට ලක් කිරීම පිණිස නිල සාම්පල පරීක්ෂා වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- මසුන් සැකසීමේ ස්ථාන, බෝට්ටු හා මසුන් ගොඩබාන ස්ථාන රෙගුලාසියේ අඩංගු අදාළ කොන්දේසි වලට අනුකූල නොවන අවස්ථාවලදී ඒ සම්බන්ධව නිසි පියවර ගැනීම.
- අපනයනය කරනු ලබන මත්ස්‍ය නිෂ්පාදනවල අනාරක්ෂිත සෞඛ්‍ය තත්ත්වයන් පිළිබඳ ආනයනික රටවලින් ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් අදාළ පියවර ගැනීම.
- මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය මෙන්ම අපනයනය සඳහා මසුන් සපයන ධීවර යාත්‍රාවල කාර්යය මණ්ඩල සඳහා මත්ස්‍ය පරිහරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ජලජජීවී වගා නිෂ්පාදන (මසුන්,ඉස්සන්) සඳහා භාවිතා වන ප්‍රතිජීවක බෙහෙත් වර්ග හා රසායනික ද්‍රව්‍ය පාලනය කිරීම පිණිස ජලජීවී වගා අවශේෂ අධීක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා එම වැඩසටහන යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
- මත්ස්‍ය නිෂ්පාදනවල නිත්‍යානුකූලභාවය තහවුරු කිරීම සඳහා මසුන් ඇල්ලීමේ සහතික නිකුත් කිරීම.
- සතියේ දින හතම තුළ පැය 24 පුරා ක්‍රියාත්මක වන කටුනායක ගුවන්තොටුපොළ තත්ත්ව පාලන උප කාර්යාල මගින් යුරෝපා රටවල් සඳහා මාර්ගගත ක්‍රමවේදය යටතේ ස්වස්ථතා සහතික නිකුත් කිරීම.
- රෙගුලාසින්ට අනුගත නොවන අවස්ථා සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සහ ආනයනය කරන රටවල් විසින් කරන ලද දැනුම්දීම් සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීම

3.1 ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමත මත්ස්‍ය සැකසුම් ආයතන

යුරෝපා කොමිසමට අයත් රටවලට අපනයනය සඳහා සුදුසු, ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ අනුමත, මත්ස්‍ය පිරිසැකසුම් ආයතන සංඛ්‍යාව (2025.08 31 දිනට) 50 සිට 55 දක්වා ඉහළ නන්වාගැනීමට හැකි වී ඇත.

යුරෝපා කොමිසමට අයත් නොවන රටවලට පමණක් අපනයනය සඳහා අනුමත මත්ස්‍ය සැකසුම් ආයතන සංඛ්‍යාව 23ක් වන අතර මත්ස්‍ය ඇසුරුම් කටයුතු සඳහා අනුමත ආයතන සංඛ්‍යාව 21කි. මේ අතරින්, චීන සමුහාණ්ඩුව වෙත ආයතන 38ක්ද, සෞදි අරාබිය වෙත ආයතන 17ක්ද, රුසියාව වෙත ආයතන 18 ක්ද අපනයන කටයුතු සිදුකරයි.

3.2 ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම සහ නිල සාම්පල් වැඩසටහන ක්‍රියාත්මක කිරීම

මේ යටතේ මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන, ඉස්සන් වගා ගොවිපළ, පරීක්ෂණාගාර, ධීවර වරායන්, අපනයනය සඳහා අමුද්‍රව්‍ය සපයන ධීවර යාත්‍රා පරීක්ෂා කිරීම සහ මත්ස්‍ය නිෂ්පාදනවල සෞඛ්‍ය ආරක්ෂිත භාවය තහවුරු කිරීම සඳහා නිල සාම්පල වැඩසටහන ක්‍රියාත්මක කිරීම අයත්වේ.

ක්ෂුද්‍රජීවී විද්‍යා පරීක්ෂණ: ජලය, අයිස් සහ මත්ස්‍ය නිෂ්පාදන සඳහා මෙන්ම,රසායනික පරීක්ෂණ: මසුන්ගේ හිස්ටමීන් ප්‍රමාණය/බැර ලෝහ/අවශේෂ අධීක්ෂණය සිදුකරනු ලබයි.

3.3 ජලජීවී වගා රසායනික අවශේෂ අධීක්ෂණ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම

මේ යටතේ 2002 වසරේ ප්‍රකාශිත ජලජීවී වගා අවශේෂ අධීක්ෂණ රෙගුලාසිය ක්‍රියාත්මක කිරීමට අදාළ අධීක්ෂණ, පරීක්ෂණ සාම්පල ලබාගැනීම සහ විශ්ලේෂණද නීතිමය පියවර ගැනීමද සිදුවේ. ඉස්සන් අභිජනන මධ්‍යස්ථානවල ජල සාම්පල ලබා ගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි.

සාම්පල පරීක්ෂා සිදුකරන පරාමිතින්:

- ප්‍රතිජීවක ඖෂධ
- දූෂක ද්‍රව්‍ය (බැරලෝහ කාබමේට්, පයිරත්රෝයිඩ්)
- කෘමිනාශක අවශේෂ
- වර්ණක (මැලකයිට් ග්‍රීන්, ලියුකොමැලකයිට්, බ්‍රිලියන්ට් ග්‍රීන්, ක්‍රිස්ටල් වයලට්)

දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම:

මේ යටතේ මසුන්ගේ හා මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මක භාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය ආරක්ෂා කිරීම පිළිබඳව අදාළ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකිරීම ප්‍රධාන වශයෙන් සිදුවේ.

වගුව 07: 2025 වර්ෂයේ 2025.08.31 දිනට අදාළව තත්ත්ව පාලන අංශයේ කටයුතුවල ප්‍රගතිය

තත්ත්ව පාලන අංශය මගින් සිදුකරන කාර්යයන්	**වාර්ෂික ඉලක්කය**	**ප්‍රගතිය 08.31 දිනට**	**ප්‍රතිශතය %**
දේශීය වෙළඳපලෙහි ඇති මත්ස්‍ය නිෂ්පාදනයන්ගේ සෞඛ්‍යාරක්ෂිතභාවය හා ගුණාත්මකභාවය තහවුරු කිරීම			
01.වරාය පරීක්ෂණ සිදු කිරීම.	10	4	40%
02.මත්ස්‍ය වෙන්දේසි පොළවල් සහ පොදු මත්ස්‍ය වෙළඳ සැල් පරීක්ෂණ සිදු කිරීම.	4	1	25%
03.දැනුවත් කිරීමේ වැඩසටහන් (ධීවර කාර්මිකයන්/වෙළෙඳුන්)	10	2	50%
අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන්ගේ සෞඛ්‍යාරක්ෂිතභාවය හා ගුණාත්මකභාවය තහවුරු කිරීම			
01.නිල සාම්පල ලබා ගැනීම - ආයතන	300	125	42%
02.දැනුවත් කිරීමේ වැඩසටහන් (තත්ත්ව පාලන නිලධාරීන් /අදාල ක්ෂේත්‍ර නිලධාරීන්)	10	2	20%
03.දැනුවත් කිරීමේ වැඩසටහන් (ජලජීවී වගාකරුවන්/ පිරිසැකසුම් ආයතනනිලධාරීන් / ධීවර කාර්මිකයන්)	10	1	10%
04.ධීවර වරායවල සෞඛ්‍යාරක්ෂිතභාවය සහ සනීපාරක්ෂාව පිළිබඳ පරීක්ෂා කිරීම.	20	1	5%
05.ධීවර යාත්‍රාවලවල සෞඛ්‍යාරක්ෂිතභාවය, සනීපාරක්ෂක තත්ත්ව හා යහපත් පරිහරන ක්‍රම පිළිබඳ පරීක්ෂා කිරීම.	85	10	12.75%
06.අපනයනය සඳහා සිදුකිරීමට අපේක්ෂිත ආයතන	120	63	52.5%

මත්ස්‍ය පිරිසැකසුම් සිදුකෙරෙන ආයතන පරීක්ෂාව.	පරීක්ෂා සංඛ්‍යාව			
	සිදුකිරීමට අපේක්ෂිත ඇසුරුම් /පොකිරිස්සන් එකතු කරන මධ්‍යස්ථාන පරීක්ෂා සංඛ්‍යාව	15	2	13 %
07.රසායනාගාර පරීක්ෂා කටයුතු සිදු කිරීම.		5	2	40%
08.අභිජනන මධ්‍යස්ථාන, මිරිදිය ජලජීවී වගා ගොවිපල සහ කිවුල්දිය, සමුද්‍රජීවී වගාබිම් පිළිබඳ පරීක්ෂා කිරීම.		40	5	12.5 %
09.ජලජීවී වගා රසායන අවශේෂ පිළිබඳ සිදුකරන රසායනාගාර පරීක්ෂණ		යුරෝපා කොමිසම සහ එක්සත් රාජධානියමඟින් නිර්දේශිත සැලැස්මට අනුකූලව වාර්ෂිකව තීරණය වේ. (66)	20	30%
10. ගොඩබෑමේදී/ පිරිසැකැස්මේදී ඉන්ද්‍රීය විභාජක පරීක්ෂා		70	15	21.5%
11. කලාපිය ධීවර කළමනාකරණ සංවිධානයන් මගින් ස්ථාපිත සංඛ්‍යාලේඛන දත්ත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.		අවස්ථානුකූව	1	-
12. අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන් සඳහා නිල සාම්පල වැඩසටහන අනුව සිදුකළ පර්යේෂණ ප්‍රතිඵල ප්‍රමිතීන්ට අනුකූල නොවන අවස්ථා සඳහා ගනු ලබන නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම.		ප්‍රතිඵල වල පාරාමිතීන්ගේ සම්මත අගයන් ඉක්මවා යාම සිදු වුවහොත් අවස්ථානුකූව	-	-
13. ආනයනික රටවල් (Importing countries) මඟින් මත්ස්‍ය නිෂ්පාදන වල නුසුදුසුතා පිළිබඳ සිදුකරන දැනුම් දීම.		අදාල රටවලින් නුසුදුසුතා දැනුම් දෙන වාර ගණන අනුව අවස්ථානුකූව	10	-
14. අපනයනය සඳහා මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන අනුමත කිරීම.	නව මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන අනුමත කිරීම.	63	1	-
	මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන ලියාපදිංචිය යාවත්කාලීන කිරීම.		45	-
15. මසුන් ඇල්ලීමේ සහතික නිකුත් කිරීම. * මේ වන විට උපයා ඇති මුළු මුදල රු. 2,819,000		17,000 (සහතික සංඛ්‍යාව)	14,095	83%
16. අපනයනය සඳහා ස්වස්ථතා සහතික නිකුත් කිරීම. (යුරෝපා රටවල් සඳහා)* මේ වන විට උපයා ඇති මුළු මුදල රු. 4,662,500		18,000 (සහතික සංඛ්‍යාව)	9,325	52%
17. අපනයනය සඳහා ස්වස්ථතා සහතික නිකුත් කිරීම. (යුරෝපා නොවන රටවල් සඳහා) * මේ වන විට උපයා ඇති මුළු මුදල රු. 3,712,500		10,000 (සහතික සංඛ්‍යාව)	7,425	74%
18. ප්‍රති අපනයනය සඳහා ආනයනය කරන ලබන මත්ස්‍ය තොග පිළිබඳ පරීක්ෂණසිදු කිරීම. (BIA)		ප්‍රති අපනයනය සඳහා මසුන් ආනයනය කිරීමට ඉල්ලීම් කිරීමත් අනුමැතීන් ලබා	-	-

	දීමත් මත අවස්ථානුකූව		
19. යුරෝපා කොමිසම සහ අනෙකුත් රටවල අදාළ නිසි බලධාරී ආයතන (Competent Authorities) සමඟ අවශ්‍ය සම්බන්ධීකරණය පවත්වා ගෙනයාම සඳහා ආනයනික රටවල් මගින් සිදුකරන දැනුම්දීම් මඟින් හෝ විදේශවල පිහිටුවා ඇති ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් කෙරෙන විමසීම්.	සිදු කරන ඉල්ලීම් අනුව අවස්ථානුකූව	30	-

3.4 ටින් මාළු කර්මාන්තය නියාමනය කිරීම

වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ ප්‍රචලිත වෙමින් පවතින ටින් මාළු කර්මාන්තය අගය වැඩි කිරීමේ නිෂ්පාදනයක් ලෙස සැලකිය හැකි අතර එය දිගින් දිගටම ඉල්ලුම වැඩිවන ප්‍රෝටීන්වලින් ඉහළ ටුනා, සාඩින් හා මැකරල් මත්ස්‍ය විශේෂ යොදා ගනිමින් දිගු කාලයක් කල් තබා ගත හැකි පසසුවෙන් සකස්කර ගත හැකි නිෂ්පාදනයකි. ශ්‍රී ලංකවේ මෙම ටින් මාළු වෙළඳපොළ සම්පූර්ණයෙන්ම ආනයන වෙළඳපොළ මත රදා පැවති අතර මේ වන විට මෙය දේශීය කර්මාන්තයක් බවට පත් කර ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් සිටි. දැනට ටින් මාළු නිෂ්පාදන කිරීම සඳහා දායකත්වය ලබා දෙන දේශීය ව්‍යාපාරිකයින් 22ක් පමණ හඳුනා ගෙන එම නිෂ්පාදනවල සෞඛ්‍ය ආරක්ෂිතභාවය හා ගුණාත්මකභාවය ඉහළ නැන්වීමේ මූලික කටයුතු තත්ත්ව පාලන අංශයේ මැදිහත් වීමෙන් ආරම්භ කර ඇත. ඒ අනුව ටින් මාළු ආනයනය සඳහා වැය වන විදේශ සංචිත අප රට තුළ රඳවා ගැනීමට අපේක්ෂිතය.

තවදුරටත් මෙම කර්මාන්තය නියාමනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතින අතර අදාළ ටින් මාළු පිරිසැකසුම් කිරීමේ ආයතන 2003 අංක 1 දරන මත්ස්‍ය පිරිසැකසුම් ආයතන නියෝග යටතේ අප දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම, මේ වන විට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ තත්ත්ව පාලන අංශය විසින් ආරම්භ කර ඉදිරි පියවර ගනිමින් සිටි. දැනට 2003 අංක 01 දරන මත්ස්‍ය පිරිසැකසුම් ආයතන නියෝග යටතේ ආයතන 12ක් ක්‍රියාත්මක වේ.

3.5 ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමත මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන නිල සන්නාම ලාංඡන හඳුන්වා දීම

ශ්‍රී ලංකා මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා අවසර ලබා දීම, ධීවර ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු නියාමනය යටතේ සිදු කරයි. මේ වන විට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන සියයකට ආසන්න (99) පමණ ඉතා උසස් තත්වයේ මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන විවිධ විදේශීය වෙළඳ පොළවල් වෙත යොමු කරමින් පවති. එමෙන්ම මේ වන විට මෙම නිෂ්පාදන විදේශීය රටවල ශ්‍රී ලාංකීය නිෂ්පාදන ලෙස උසස් සන්නාමයක් අත්කර ගනිමින් විදේශීය පාරිභෝගිකයින් අතර ජනප්‍රියත්වයට පත් වෙමින් පවති.

මේ අනුව ශ්‍රී ලාංකීය මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයන පිරිසැකසුම්කරුවන් විසින් තම නිෂ්පාදන සඳහා රටෙහි අනන්‍යතාවය තහවුරු වන සන්නාමය ලාංඡනයක අවශ්‍යතාවය කාලයක සිට හඳුනාගෙන ඉල්ලීම් සිදු කරමින් පවතින අතර, ඒ පිළිබඳව අදාළ පාර්ශ්වයන්ගෙන් ලබා ගත් යෝජනා අනුමැතින් අනුව සුදුසු සන්නාම ලාංඡන හඳුනාගෙන ඇත. ඒ අනුව අදාළ ආයතනවල අනුමැතිය ලැබීමෙන් පසු සුදුසුකම් සපුරන ආයතනයන් සඳහා අදාළ සන්නාම ලාංඡනය ලබාදීමට නියමිතය.

3.6 එක් දින කුඩා යාත්‍රා මගින් රැගෙන එන මත්ස්‍ය අස්වැන්න අපනයයන වෙළඳ පොළ වෙත යොමු කිරීමට හැකි වන පරිදි තත්ත්වයෙන් උසස් සෞඛ්‍යයාරක්ෂිත මත්ස්‍ය අස්වැන්නක් ගොඩබිමට රැගෙන ඒම දිරිගැන්වීම

ශ්‍රී ලංකාවේ වෙරළබඩ ධීවර කර්මාන්තය රටේ ආර්ථිකයේ, සංස්කෘතියේ සහ ආහාර සුරක්ෂිතතාවයේ වැදගත් අංගයක් වන අතර ජනගහනයෙන් සැලකිය යුතු කොටසකට ජීවනෝපායන් සපයන අතර ජාතික මත්ස්‍ය නිෂ්පාදනයට දායක වේ.

මෙම කුඩා යාත්‍රා මගින් නෙළාගන්නා මත්ස්‍ය අස්වැන්න, රටේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයට සැලකිය යුතු දායකත්වයක් සපයන අතර, එම අස්වැන්නෙන් සැලකිය යුතු ප්‍රමාණයක්, අපනනය කළ හැකි මත්ස්‍යය විශේෂ වේ.

වෙරළබඩ ධීවර කර්මාන්තය මගින් විශේෂ රාශියකින් යුත් අපනයන ඉල්ලුමක් සහිත අස්වැන්නක් නෙළා ගත්තද එසේ නෙළා ගැනීමේදී හා ගොඩබිමට රැගෙන ඒමේදී සිදුවන දුර්වල පරිහරන තත්වයන් නිසා අදාළ මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වය අඩුවීම මගින් අදාළ අස්වැන්න අපනයන අමුද්‍රව්‍ය ලෙස යොදා ගැනීමට නොහැකි තත්වයකට පත්ව ඇත. ඒ අනුව අල්ලා ගන්නා මසුන් අපනයය වෙළඳපොළ තුළ විශාල ඉල්ලුමක් පවතියද ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දීමේ ගැටලුවකට අපනයනය කරුවන් මුහුණ දී ඇත.

ඒ අනුව පසු අස්වනු හානිය අවම කරමින් ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ මත්ස්‍ය නිෂ්පාදන අපනයන වෙළඳපොළට ලබාදීම සඳහා නිවැරදි පරිහරණය ක්‍රමවේද අනුගමනය කිරීම වැදගත් වේ. ඒ සඳහා, ධීවරයන් වෙත අවශ්‍ය උපකරණ හා පහසුකම් ලබා දීම වෙනුවෙන් සහ එක් දින කුඩා යාත්‍රා මගින් නෙළා ගනු ලබන මත්ස්‍ය අස්වැන්න ආරක්ෂිතව ගොඩබිමට ගෙන ඒම දිරිගැන්වීම සඳහා වන වැඩසටහන් හලාවත, කලුතර සහ මීගමුව යන ධීවර දිස්ත්‍රික්කවල සිදුකරන ලදී. මේ සඳහා මත්ස්‍ය අපනයනකරුවන් සහ ධීවර කාර්මිකයින් සහභාගී වූ අතර ගුණාත්මක මත්ස්‍ය අස්වනුවල අවශ්‍යතාවය පිළිබඳව තොරතුරු හුවමාරු කරගැනීම ද සිදුවිය.

රූපය 01 :2025.06.25 දින හලාවත ධීවර දිස්ත්‍රික්කය සඳහා රැස්වීම පවත්වන අයුරු දැක්වෙන ඡායාරූපය

රූපය 02 :2025.07.03දින කලුතර ධීවර දිස්ත්‍රික්කය සඳහා රැස්වීම පවත්වන අයුරු දැක්වෙන ඡායාරූපය

රූපය 03: 2025.07.09 දින මීගමුව ධීවර දිස්ත්‍රික්කය සඳහා රැස්වීම පවත්වන අයුරු දැක්වෙන ඡායාරූපය

3.7 ධීවර නිෂ්පාදන අපනයන, ආනයන සහ ප්‍රතිඅපනයන කළමනාකරණ නියාමනය (ප්‍රතිඅපනයනය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටිය (SOP)

මේ වන විට ශ්‍රී ලංකාවේ අනුමත මත්ස්‍ය පිරිසැකසුම් ආයතනයවල ධාරිතාවය හා විදේශීය ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම සපුරාලීමට නොහැකි තත්වයකට වර්තමානයේ ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අපනයනකරුවන් පත්ව ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයන කර්මාන්තය තිරසාරව අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා තත්වයෙන් උසස් අපනයනයට සුදුසු මට්ටමේ අමුද්‍රව්‍ය හිඟ කමක් හඳුනාගෙන තිබූ අතර එම හේතුවෙන් සමහර පිරිසැකසුම් ආයතන වැසි යාමේ අවදානමකට ලක්ව ඇති බව හඳුනා ගන්නා ලදී. ඒ අනුව දීර්ඝ කාලයක සිට අපනයනකරුවන් විසින් සිදු කරනු ලබන ඉල්ලීම් අනුව මත්ස්‍ය අපනයනය තිරසාරව පවත්වා ගෙන යෑම සඳහා අත්‍යවශ්‍ය ටුනා, තලපත් හා ඉස්සන් ආනයනය කර දේශීයව පිළිසකර කර නැවත ප්‍රති අපනයනය කිරීම සඳහා පහසුකම් සැලසීමට අදාළ පාර්ශවයන් තීරණය කරන ලදී. ඒ අනුව අදාළ පාර්ශ්වකරුවන්ගේ එකඟතාවයන් සහිතව මෙහෙයුම් ක්‍රියා පටිපාටිය සැකසීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

ඒ අනුව ශ්‍රී ලංකාවට ඉස්සන් ටූනා, තලපත් හා ඉස්සන් ආනයනය කිරීම සඳහා විධිමත් ක්‍රියාපටිපාටි හා කොන්දේසි සහිත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP) දෙකක් ස්ථාපිත කර බලපත්‍රලාභී මත්ස්‍ය සැකසුම් ආයතන හරහා අගය එකතු කිරීම සහ පසුව නැවත අපනයනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. මෙහි සියලුම අධීක්ෂණ කටයුතු තත්ත්ව පාලන අංශය විසින් සිදු කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී.

ශ්‍රී ලංකාව ප්‍රමුඛතම මුහුදු ආහාර සැකසුම් මධ්‍යස්ථානයක් ලෙස ස්ථානගත කිරීමෙන්, මුහුදු ආහාර අපනයන පහත වැටීමට පිළියම් යෙදීම, විශේෂයෙන් අපනයන අරමුණු සඳහා ආනයන සඳහා පහසුකම් සැලසීම මෙහි අරමුණයි. එහි උපායමාර්ගික පිහිටීම, දියුණු යටිතල පහසුකම්, ශක්තිමත් ආරක්ෂාව සහ කළමනාකරණ ප්‍රටෝකෝල සහ දක්ෂ ශ්‍රම බලකාය උපයෝගී කරගනිමින්, ගෝලීය මුහුදු ආහාර වෙළඳාම තුළ ශ්‍රී ලාංකික නිෂ්පාදන සඳහා වැඩි වෙළඳපොළ කොටසක් අත්කර ගැනීම මෙම වැඩසටහනේ අරමුණයි.

3.8 ආනයනික රටවල් මගින් සිදු කරනු ලබන විශේෂ පරීක්ෂණ කටයුතු සඳහා පෙනී සිටීම

මත්ස්‍ය අපනයනය සඳහා පවතින නව වෙළඳපොළ ගවේෂණය කර ජාත්‍යන්තර මට්ටමින් නව අපනයන පිවිසුම් අප රටට ලබාදීමට කටයුතු සම්පාදනය කරනු ලබන්නේද තත්ත්ව පාලන අංශය මගිනි.

එසේ නව මත්ස්‍ය අපනයන පිවිසුමක් ලෙස චීන සමුහාණ්ඩුව, ඔවුන්ගේ වෙළඳපොල, ලාංකීය සියලු මත්ස්‍ය නිෂ්පාදන සඳහා විවර කරදීමට පැවති මාර්ගගත විගණන ක්‍රියාවලියට සාර්ථකව මුහුණ දෙමින් එම නව අපනයන අවස්ථාව අප රටට ලබා ගැනීමට හැකිවිය. මීට අමතරව ඉදිරි වර්ෂයේදී කොරියානු රජය සමග ඉස්සන් අපනයනය කිරීමට අපනයන කරුවන්ගේ ඉල්ලීම මත අවශ්‍ය ලේඛන කටයුතු සිදු කිරීමට පියවර ගෙන ඇත.

3.9 තත්ත්ව පාලන උප කාර්යාලය -කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල

2014 ජනවාරි 13 වන දින කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ තත්ත්ව පාලන උප කාර්යාලය පිහිටුවන ලදී.මෙම කාර්යාලය සතියේ දින හත පුරාවට දිවා රාත්‍රී සේවය සපයන (24X7) කාර්යාලය ලෙස මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයන කරුවන් වෙත සේවා සපයන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ.

දේශීය මත්ස්‍ය නිෂ්පාදන අපනයන කරුවන්ගේ බලවත් ඉල්ලීමකට අනුව කටුනායක තත්ත්ව පාලන උප කාර්යලයේ කටයුතු පුළුල් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලද අතර ඒ අනුව තත්ත්ව පාලන අංශයේ උප කාර්යාල රාජකාරි පුළුල් කිරීමට පියවර ගැනීම තුලින් මත්ස්‍ය නිෂ්පාදන සඳහා නිකුත් කරන සවස්ථතා සහතික බාධාවකින් තොරව සතියේ දින හත තුළ පැය 24 පුරා දිවා රාත්‍රී අඛණ්ඩ සේවයක් සැපයීමෙන් අපනයනකරුවන් දිරි ගන්වා විදේශ විනිමය ඉපයීම් ඉහළ නැවීම අරමුණු කර ගෙන ඇත.

ආරම්භයේදී යුරෝපා කොමිසමේ රටවලට අපනයනය කරන මත්ස්‍ය නිෂ්පාදනවල නීත්‍යානුකූලභාවය තහවුරු කිරීම සඳහා මසුන් ඇල්ලීමේ සහතික සත්‍යෝක්ෂණය කිරීම පමණක් මෙම කාර්යාලය මගින් සිදු කල අතර මේ වනවිට අදාළ අපනයනය කරන සියලුම මත්ස්‍ය තොග සඳහා අවශ්‍ය ස්වස්ථා සහතික හා ඇල්ලීමේ සහතික මෙම කාර්යාලය මගින් සතියේ දින හත තුළ ලබා ගැනීමට හැකි වන පරිදි පහසුකම් සපයා ඇත.

4.0 විමර්ශන හා පුහුණු අංශය

4.1 ධීවර ප්‍රජාව, ධීවර නිලධාරී හා අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ මනා සබඳතාවයක් ගොඩනැඟීම

ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය නීති විරෝධී,අවිධිමත් හා වාර්තා නොවන ධීවර කටයුතුවලින් තොරව,ධීවර සම්පතෙහි තිරසාර පැවැත්ම තහවුරු කිරීම සඳහා 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත හා ඒ යටතේ පනවා ඇති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම විමර්ශන අංශයේ ප්‍රමුඛතම අරමුණ වේ.

නව තාක්ෂණය යොදා ගනිමින් ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව සම්පත් කළමනාකරණය තුළින් ශ්‍රී ලංකා ජාතික ආර්ථිකයට ඵලදායි දායකත්වයක් ලබාදීම සඳහා ධීවර කර්මාන්තය තිරසාර ලෙස සංවර්ධනය කිරීමත් අරමුණ වේ.

අනාගත පරපුර සඳහා ධීවර සම්පත් ආරක්ෂා කර ගැනීම උදෙසා ධීවර ප්‍රජාව, ධීවර ක්ෂේත්‍රය නියාමනය සිදු කරන ධීවර නිලධාරීන් සහ ධීවර ක්ෂේත්‍රයට අදාළවන අනෙකුත් පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම සහ පුහුණු කිරීමත් අරමුණ වේ.

4.2 විමර්ශන හා පුහුණු අංශයේ කාර්යභාර්ය

විමර්ශන ඒකකය

- වාර්ෂික වැටලීම්/ පරීක්ෂා කිරීම් සම්බන්ධ සැලසුම් සකස් කිරීම
- යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මගින් හඳුනා ගන්නා ලද නීති කඩකිරීම් සඳහා වන විමර්ශන කටයුතු සිදු කිරීම
- නීති විරෝධී ධීවර කටයුතු වැටලීම් සඳහා දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන්ට අනුමැතින් ලබා දීම දිස්ත්‍රික් මට්ටමේ පරීක්ෂණ, වැටලීම් හා විමර්ශන කටයුතු අධීක්ෂණය කිරීම.
- සමථකරණ කටයුතු පරිපාලනමය දඩ අය කිරීම් මණ්ඩලය රැස් කිරීම සහ පරිපාලන දඩ අය කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය
- ධීවර යාත්‍රාංගන, ධීවර ආම්පන්න නිෂ්පාදන සැපයුම් හා ඇම සැපයුම් ආයතනවල පරීක්ෂා කිරීම්/ වැටලීම් සිදු කිරීම

- ධීවර නිෂ්පාදන පිරිසැකසුම් හා සැපයුම් ආයතන පරීක්ෂා කිරීම් හා වැටලීම් සිදු කිරීම
- ගුවන් විදුලි මධ්‍යස්ථාන සහ අන්තර්ජාතික ධීවර කටයුතු ඒකක පරීක්ෂා කිරීම /විමර්ශනය කිරීම
- විශේෂ විමර්ශන ප්‍රකාශයට පත් කිරීම සඳහා හදිසි කැඳවුම් නියෝග නිලධාරීන්ට ලබා දීම
- සියලුම විමර්ශන සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණයක් සිදු කිරීම
- රාජ්‍යය බුද්ධි අංශය සහ වෙනත් ආයතන මගින් ක්‍රියාත්මක කෙරෙන විමර්ශන සඳහා ඉල්ලුම් කරනු ලබන තොරතුරු වාර්තා ලබා දීම

පුහුණු ඒකකය

- දෙපාර්තමේන්තුවේ වාර්ෂික පුහුණු හා දැනුවත් කිරීමේ වැඩ සටහන් සැලැස්ම සකස් කිරීම
- ජාතික මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමෙන් ධීවර කාර්මිකයින් හා පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ වැඩ සටහන් සංවිධානය කිරීම
- ධීවර යාත්‍රා නියමුවන් සඳහා පුහුණු පාඨමාලා සකස්කිරීම හා දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වෙන නියමු පුහුණු වැඩසටහන් අධීක්ෂණය
- ධීවර යාත්‍රා නියමුවන්/ ධීවර කාර්මිකයින් සඳහා ප්‍රථමාධාර පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය
- ධීවර පවුල්වල සාමාජිකයින්ගේ ව්‍යක්තිය අධ්‍යාපනය ඉහළ නැංවීම, ධීවර කාන්තාවන් සඳහා විකල්ප අදායම් උත්පාදන වැඩසටහන් හා නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
- විශ්වවිද්‍යාල කාර්මිකවිද්‍යාල වලින් ධීවර ක්ෂේත්‍රය පිළිබඳව කාර්මික/ සීමාවාසික පුහුණුව ලබා ගැනීම සඳහා යොමු කරන සිසුන් සඳහා පුහුණුව ලබා දීම හා සම්බන්ධීකරණය
- සියලුම නිලධාරීන් සඳහා දේශීය පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම
- පුහුණු වැඩ සටහන් හා දැනුවත් කිරීමේ වැඩ සටහන් සම්බන්ධ ප්‍රතිපෝෂණය හා විශ්ලේෂණය
- දැනුවත් කිරීම් සම්බන්ධ පත්‍රිකා, පොත් පිංච සහ වීඩියෝ පට නිර්මාණය සහ පිරිවිතරයන් සහ අත් පිටපත් (Script) සැකසීම.

4.3 විමර්ශන හා පුහුණු අංශය -2025 ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා ප්‍රගතිය

වගුව 08: විමර්ශන ඒකකය 2025 ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා ප්‍රගතිය

අනු අං	අංශයේ කාර්යය	කාර්ය දර්ශක	අපේක්ෂිත ඉලක්කය	ප්‍රගතිය
1	දිස්ත්‍රික්මට්ටමේ වැටලීම් සහ නීති විරෝධී ධීවර කටයුතුවලට එරෙහි විමර්ශන හා නෛතික කටයුතු සූපරීක්ෂණය	දිස්ත්‍රික් මට්ටමේ නෛතික කටයුතු පිළිබඳව පවත්වා ගන්නා යාවත්කාලීන දත්ත වාර්තාව	නිශ්චිත ඉලක්ක ලබාදිය හැකි	425
2	පරිපාලන දඩ පැනවීම සඳහා සියලු දිස්ත්‍රික් කාර්යාලවලින් යොමු වන ඉල්ලීම්, අදාළ ක්‍රියාවලියට අනුව පරිපාලන දඩ පැනවීම සඳහා යොමු කිරීම.	පරිපාලන දඩ පැනවීමට යටත් කරන ලද නඩු සංඛ්‍යාව		22
3	යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මඟින් හඳුනාගන්නා ලද සැක කටයුතු සිදුවීම් සඳහා වන විමර්ශන කටයුතු සිදු කිරීම.	යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මඟින් හඳුනාගන්නා ලද සැක කටයුතු සිදුවීම් සඳහා වන විමර්ශන ගණන		676
4	විශේෂ වැටලීම් සිදු කිරීම.	සැලසුම්කරන ලද වැටලීම් ප්‍රමාණය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිශතය	5	1
5	ධීවර යාත්‍රා, වරාය, ධීවර ආම්පන්න, නිෂ්පාදන සහ ධීවර ඇම සැපයුම් ආයතන සම්බන්ධ පරීක්ෂා කිරීම් සහ විමර්ශන කටයුතු.	1.පරීක්ෂාවන්ගණන	7	0
		2.නඩු පැවරීම් ගණන	නිශ්චිත ඉලක්ක ලබාදිය නොහැක	0

වගුව 09: පුහුණු ඒකකය 2025 ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා ප්‍රගතිය

අනු අං	අංශයේ කාර්යය	කාර්ය දර්ශක	අපේක්ෂිත ඉලක්කය	ප්‍රගතිය	සහභාගී වූසංඛ්‍යාව
1	අදාළ පාර්ශවකරුවන්(stake holder) සඳහා ධීවර නීතිය සහ නීත්‍යානුකූල ධීවර යෙදවුම් පිළිබඳව දැනුවත් කිරීම් සිදු කිරීම.	අදාළ පාර්ශ්වකරුවන් (stake holder) දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	3	8	347
2	දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම.	නිලධාරීන් සඳහා සකස්කළ අදාළ වැඩසටහන් සංඛ්‍යාව	38	33	1280
3	දිස්ත්‍රික්මට්ටමින් සිදු කරන ධීවර කාර්මික දැනුවත් කිරීම් සංවිධානය කිරීම.	දිස්ත්‍රික් මට්ටමින් සිදුකරන දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	46	68	2961
4	දෙපාර්තමේන්තුවේ නිළධාරීන් බාහිර ආයතන වල පැවැත්වෙන පුහුණු වැඩසටහන්/ පශ්චාත් උපාධි/ ඩිප්ලෝමා පාඨමාලා වෙත යොමු කිරීම.	බාහිර ආයතන සම්බන්ධීකරණය කරමින් සිදුකල පුහුණු කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	15	13	58
5	විශ්ව විද්‍යාල /කාර්මික විද්‍යාල සිසුන් සඳහා කර්මාන්ත ක්ෂේත්‍ර පුහුණුව ලබාදීම සම්බන්ධ බාහිර අධීක්ෂක ලෙස ක්‍රියා කිරීම.	විශ්ව විද්‍යාල /කාර්මික විද්‍යාල සිසුන් සඳහා කර්මාන්ත ක්ෂේත්‍ර පුහුණුව ලබාදීම සම්බන්ධ සමීක්ෂණය කල සංඛ්‍යාව	නිශ්චිත ඉලක්ක ලබාදිය නොහැක	0	*

රූපය 4: විශේෂ වැටලීම් සිදු කිරීම පොකිරිස්සන් ඇල්ලීමට තහනම් කාලයේදී පොකිරිස්සන් අනවසරයෙන් සන්තකයේ තබා ගැනීම

රූපය 5: අදාළ පාර්ශ්වකරුවන් (stake holder) සඳහා ධීවර නීතිය සහ නීත්‍යානුකූල ධීවර යෙදවුම් පිළිබඳව දැනුවත් කිරීම් සිදු කිරීම,

රූපය 6: මැදවච්චිය, පූනෑව, ශික්ෂා නාවික හමුදා කඳවුරෙහි පුහුණු නාවික හමුදා නිලධාරීන් සඳහා පැවැත්වූ වැඩසටහන්

5.0 තොරතුරු තාක්ෂණ අංශය

5.1 අරමුණ

මෙම අංශයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ධීවර සම්පත් කළමනාකරණය කිරීම සඳහා මාර්ගගත යෙදුම් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාමයි. දෙපාර්තමේන්තු ජාලය නඩත්තු කිරීම, මාර්ගගත යෙදුම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම, අදාළ දෘඩාංග හැසිරවීම, පුළුල් දත්ත විශ්ලේෂණය හා වාර්තා කිරීම, තොරතුරු තාක්ෂණය පිළිබඳ පුහුණුව ප්‍රධාන අවධානය යොමු කළයුතු අංශවේ.

5.2 ප්‍රධාන ක්‍රියාකාරකම්

- දෙපාර්තමේන්තු සේවාදායකයන් තුළ දෙපාර්තමේන්තු ජාල මෘදුකාංග ක්‍රියාත්මක කිරීම.
- දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ නඩත්තුව සහ අන්තර්ගත කළමනාකරණය.
- දෙපාර්තමේන්තු ජාලය සහ මූලික තොරතුරු තාක්ෂණය පිළිබඳ නිලධාරී පුහුණුව.
- ඊ- ලොග් පද්ධතියේ භාවිතය වැඩිදියුණු කිරීම සඳහා ඊ කණ්ඩායම් අධීක්ෂණය සහ සහායදීම.
- ගතික වාර්තාකරණ පද්ධතිය හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම.
- දත්ත විශ්ලේෂණය සඳහා මෘදුකාංග භාවිතය වැඩිදියුණු කිරීම.
- කාර්යමණ්ඩල පාදක නිරීක්ෂක පද්ධතිය ක්‍රියාත්මක කිරීම
- දෙපාර්තමේන්තු පරිගණක දෘඩාංග හා මෘදුකාංග නඩත්තු කිරීම.
- යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය හඳුන්වාදීම එහි නඩත්තුව සහ අධීක්ෂණය කිරීමේ කටයුතු සැලසීම.

5.3 දෙපාර්තමේන්තුවේ සේවාවන් ජාලගත මෘදුකාංගය මගින් ක්‍රියාත්මක කිරීම

දෙපාර්තමේන්තු ජාල මෘදුකාංගය මගින් දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන් 30 කට වැඩි ප්‍රමාණයක් ඩිජිටල් ක්‍රියාවලියක් බවට පරිවර්තනය කර සාර්ථකව ක්‍රියාත්මක කරමින් පවතී කිරීමටයි.ධීවරයින් ලියාපදිංචි කිරීම, බෝට්ටු ලියාපදිංචි කිරීම, විද්‍යාත්මක දත්ත එක්රැස් කිරීම යනාදිය හා තවත් බොහෝ ක්‍රියාදාමයන් ඊට ඇතුළත්ය. දෙපාර්තමේන්තු ජාල මෘදුකාංගය වෙබ් යෙදුමක් ලෙස Cloud සර්වර් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන අතර එය http://msdfar.com භාවිතයෙන් ප්‍රවේශවිය හැකිය. දෙපාර්තමේන්තු ජාල මෘදුකාංගය භාවිතා කරමින් ධීවරයින් 62,000 ක්, යාත්‍රාංගන 99ක් (පැරණි දත්ත ඇතුළුව), බෝට්ටු 45,000කට වැඩි ප්‍රමාණයක්, නියමුවන් 7300ක් දැනටමත් ලියාපදිංචි කර ඇති අතර මෙහෙයුම් බලපත්‍ර 15,000කට වැඩි ප්‍රමාණයක් නිකුත්කර ඇත. 2025 වර්ෂය සඳහා මාර්ගගත පිටත්කිරීමේ පද්ධතිය හරහා මාර්ගගත පිටත්කිරීම් 50,000 කට වැඩි ප්‍රමාණයක් සිදුකරනලදී. මෙම ක්‍රියාවලිය 2021 වර්ෂයේ සිට අඛණ්ඩව සිදුකරමින් පවතී. 2022 වර්ෂයේ හොඳම ජාලගත මෘදුකාංගය ලෙස MSDFAR පද්ධතිය සඳහා ජාලගත මෘදුකාංග භාවිතා කරන රාජ්‍ය ආයතන තේරීමේ තරගාවලියෙන් ලෝකඩ පදක්කමක් ද, 2024 රාජ්‍ය සේවා හොඳම නව්‍ය නිෂ්පාදනය/ ව්‍යාපෘතිය තේරීමේ තරඟාවලියෙන් දෙවන ස්ථානය ද හිමි විය.

5.4 දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ නඩත්තුව සහ අන්තර්ගත කළමනාකරණය www.fisheriesdept.gov.lk.

දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ නඩත්තුව සහ අන්තර්ගත කළමනාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ අංශය වගකීම දරයි. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය දිනපතා යාවත්කාලීන වන අතර දෙපාර්තමේන්තු ක්‍රියාදාමයන් පිළිබඳ විස්තර ඇතුළත් වේ. දෙපාර්තමේන්තුවේ සෑම අංශයකටම තමන්ගේම පිටුවක් ඇති අතර එහි එම අංශය වගකිවයුතු ක්‍රියාකාරකම් ඇතුළත් කර තිබේ. නිලධාරීන්ගේ සම්බන්ධතා තොරතුරු වෙබ් අඩවියෙන් ලබාගත හැකි අතර ඒවා නිරන්තරයෙන් යාවත්කාලීන වේ. වෙබ් අඩවියේ ඇති ප්‍රවේශය හරහා නිලධාරීන්ට දෙපාර්තමේන්තුවේම සියලුම පද්ධතියනට ප්‍රවේශවිය හැකිය. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හොඳම සිංහල වෙබ් අඩවිය සඳහා රන් පදක්කම සහ 2020 හොඳම (.LK) වෙබ් තරඟයේ හොඳම රජයේ වෙබ් අඩවිය සඳහා කුසලතා ත්‍යාගය දිනාගත්තේය.

5.5 දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ජාලගත මෘදුකාංගය භාවිතය පිළිබඳ ඇගයීම

දෙපාර්තුමේන්තු ජාලගත මෘදුකාංග (MSDFAR) පද්ධතිය භාවිතා කරමින් සිය රාජකාරීන් ඉටු කළ නිලධාරීන් සඳහා ඇගයීමක් ලෙස ලකුණු ලබා දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ අතර ඉන් වැඩි ලකුණු ලබාගත් නිලධාරීන් සඳහා දිරිගැන්වීමක් ලෙස නවතම වර්ගයේ ටැබ්ලොයිඩ් යන්ත්‍ර ලබාදෙන ලදි. ඒ මගින් සියලුම නිලධාරීන් මෙම පද්ධතිය ඔස්සේ රාජකාරී ඉටු කිරීමට යොමු කරවන ලදි.

5.6 දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ජාලගත මෘදුකාංග භාවිතය පිළිබඳව නිලධාරී පුහුණුව

යීවර දිස්ත්‍රික්ක 15හි මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කරන ආකාරය වෙන වෙනම නිරීක්ෂණය කරන අතර ඒ සඳහා අප අංශයේ නිලධාරීන් කැපවී සිටී. ඔවුන්ට ඇතිවන ගැටළු කඩිනමින් ඉටුකරන අතර පුහුණුවක් අවශ්‍ය බව දන්වන ලද සියලුම දිස්ත්‍රික්ක සඳහා පුහුණුවීම් පවත්වන ලදි.

5.7 පද්ධතියේ වැඩි දියුණු කිරීම

දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක මෘදුකාංග නිර්මාණය තොරතුරු තාක්ෂණ අංශයේ මෘදුකාංග සකසන නිලධාරීන් අතින් සිදුවීම විශේෂ කරුණකි. මෙතෙක් කරන ලද මෘදුකාංග නිර්මාණයන්ට අමතරව පහත සඳහන් කොටස් නිර්මාණය කර MSDFAR පද්ධතියට එකතු කිරීම මෙම වසරේදී සිදු විය.

- මාර්ගගත මුදල් අයකිරීම්
- මාර්ගගත අතිකාල දීමනා ලබාදීමේ පද්ධතිය
- ප්‍රධාන කාර්යාලයෙන් නිකුත් කරනු ලබන විශේෂ කළමනාකරණ බලපත්‍ර මාර්ගගතව ලබාදීම
- මාර්ගගත නාවුක ඉංජිනේරු වාර්තා ලබාදීම්
- දෙපාර්තමේන්තු මාර්ගගත ලේඛණ ගබඩාව

සර්වර් පද්ධතියෙහි සහ යෙදුම්වල ඇති අවදානම් හඳුනාගැනීම සහ අවම කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය දෙපාර්තමේන්තුවේ සේවාදායකයන්, ජාල මෘදුකාංග සහ සියලුම දෙපාර්තමේන්තුවේ යෙදුම පිළිබඳ ආරක්ෂක තක්සේරුවක් සංවිධානය කෙරුණි. මෙම තක්සේරුවෙන් හඳුනාගත් අඩුපාඩු අවම කරවා ගැනීම සඳහා වන පද්ධති දියුණු කිරීම්ද තොරතුරු තාක්ෂණ අංශයේ මෘදුකාංග සකසන නිලධාරීන් මගින් සිදුවිය. මෙම තක්සේරුවේ නිර්දේශ පරිදි මෙතෙක් භෞතික සර්වර් පද්ධතියක ක්‍රියාත්මක වූ MSDFAR පද්ධතිය cloud server පද්ධතියක් වෙත සම්ප්‍රේෂණය කරන ලදී. එබැවින් සයිබර් ආරක්ෂාව පිලිබඳ මූලික කටයුතු සියල්ල සකසා අවසන් කර ඇත.

5.8 යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය

ජාත්‍යන්තර මුහුදු වෙත මසුන් මැරීම සඳහා යන සියලු බහුදින යාත්‍රා වන්දිකා තාක්ෂනය ඔස්සේ අධීක්ෂණය කිරීම අන්තර්ජාතික නීති රීති වල අනිවාර්ය අංගයකි. 2015 වසරේදී මෙටරට පනවන ලද යුරෝපිය කොමිසම් අපනයන තහනමට ප්‍රධාන හේතුවක් වුයේද මෙරටට සුදුසු යාත්‍රා නිරීක්ෂණ (VMS) ක්‍රමවේදයක් නොපැවතීමයි. කෙසේ වුවද 2015 වර්ෂයේ සිට ජාත්‍යන්තර මුහුදේ මෙහෙයුම් බලපත්‍ර ලද යාත්‍රා පමණක් VMS මගින් නිරීක්ෂණය කලද ඉහත ජාත්‍යන්තර නීති රීති සහ මත්ස්‍ය අපනයන අවශ්‍යතා අනුව සියලුම බහුදින යාත්‍රා VMS මගින් ආවරණය කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී තිබුණි. බහුදින යාත්‍රා මගින් සිදුකරන යීවර නොවන අනෙක් නීති විරෝධී කටයුතු (උදා; නීති විරෝධී සංක්‍රමණ, මත්ද්‍රව්‍ය ප්‍රවාහන) හඳුනා ගැනීමේ වියදම් අඩු ක්‍රමවේදයක් ලෙසද මෙම අවශ්‍යතාවය මතුවී තිබිණි.

ඒ අනුව ඉහත අවශ්‍යතාවයට සරිලන VMS ඒකක 4,200 මිලදී ගැනීම සඳහා අරමුදල් ලබාදීමට ඕස්ට්‍රේලියානු රජය එකඟ විය. ඒ අනුව යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය 2021 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. මෙහිදී Blue Tracker VMS ට්‍රාන්ස්පොන්ඩරය වන්දිකා සේවාවක් ලෙස ඉරිඩියම් භාවිතා කරයි,. "Second Screen" ලෙස හැඳින්වෙන VMS පද්ධති මෘදුකාංගය නවීන පහසුකම් සහිත මෙන්ම ඉතා සක්‍රියව යාත්‍රා අධීක්ෂණය කිරීමේ පහසුකම් සහිතය. මෙමගින් VMS පද්ධතිය හරහා යීවරයින්ට ඵලදායී සේවා සැපයීමට හැකි වන පරිදි වෙබ් පාදක (Web based) පද්ධතියක් හරහා දිවයින වටා පිහිටි වරාය කාර්යාල වෙතද අධීක්ෂණ පහසුකම ලබා දී ඇත. 2021 වර්ෂයට පසුව යාත්‍රා නිෂ්පාදනය කල යාත්‍රා නිමියන් නව VMS යන්ත්‍ර මිලදී ගත යුතු වේ.

VMS පද්ධතියට අදාළ සියලුම වරාය කාර්යාල හරහා ප්‍රවේශ විය හැකි අතර ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පිහිටා ඇති ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය (FMC) මගින් මධ්‍යගතව කළමනාකරණය කරයි. ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය සියලු නවීන තාක්ෂණයෙන් ද නවීකරණය කර ඇත. මෙයට අමතරව යාත්‍රා හිමියන්ට මොබයිල් ඇප් (Mobile App) එකක් මගින් තම යාත්‍රාවල විස්තර බලා ගැනීම සඳහා පද්ධතියට පිවිසිය හැක. දැනට FMC 24x7 පුරා ක්‍රියාත්මක වේ. නීතිවිරෝධී ධීවර කටයුතු, මිනිස් ජාවාරම්, මත්ද්‍රව්‍ය ජාවාරම් සහ දේශසීමා තරණය වැනි නීතිවිරෝධී ක්‍රියාකාරකම් සිදුවිය හැකි අවදානම් යාත්‍රා හඳුනා ගැනීම සඳහා මෙම පද්ධතියේ පිවිසුම් නාවුක හමුදාවටද ලබාදී ඇත.

මේවන විට ඉන්දියන් සාගරයේ ධීවර මෙහෙයුම් වල යෙදෙන මෙරට අඩි 34 ට වැඩි බහුදින යාත්‍රා සියල්ලම එනම් යාත්‍රා 4,800ක පමණ ප්‍රමාණයක් මෙම පද්ධතිය මගින් නිරතුරුවම අධීක්ෂණය වේ. පසුගිය දා මෙරට පරීක්ෂාවක යෙදුනු යුරෝපිය කොමිසම් නියෝජිතයින්ගේද ප්‍රසංශාවට මෙරට VMS පද්ධතිය පත්වූ අතර, මේවන විට ආසියාවේ ඇති අති නවීන අධීක්ෂණ ක්‍රමවේදයක් ලෙස හඳුනාගෙන ඇත.

6.0 මෙහෙයුම් අංශය

6.1 ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ හුවමාරුව සඳහා සන්නිවේදන පහසුකම් ලබාදීම

ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවුඩ හුවමාරු සන්නිවේදන පහසුකම් ලබාදීමේ කටයුතු ප්‍රාදේශීය ගුවන් විදුලි මධ්‍යස්ථාන හරහා කොළඹ ප්‍රධාන මෙහෙයුම් මැදිරිය විසින් සම්බන්ධීකරණය කරනු ලැබේ. සන්නිවේදන පහසුකම් වැඩි දියුණු කරමින් ගොඩබිම හා ධීවර යාත්‍රා අතර සම්බන්ධතාවක් පැය 24 පුරා තබා ගැනීමට කටයුතු කර ඇත. මෙමගින් ධීවර යාත්‍රා සඳහා කාලගුණ වාර්තා සහ හදිසි අයහපත් කාලගුණ තත්ත්ව පිළිබඳ පූර්ව අනතුරු ඇගවීම් දෛනිකව ලබාදෙන අතර යාත්‍රා හිමියන් විසින් මුහුදේ ඇති තම යාත්‍රාව සමග සිදුකරනු ලබන අත්‍යවශ්‍ය පණිවුඩ හුවමාරු කටයුතු සිදු කිරීම සඳහා පහසුකම් සපයනු ලබයි. ධීවර යාත්‍රාවලින් හදිසි පණිවුඩ ලැබුණු අවස්ථාවේ සිට සහන/මුදාගැනීම් කටයුතු සිදුකරන අවස්ථාව දක්වා ශ්‍රී ලංකා නාවික හමුදාව, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ කලාපීය සමුද්‍රීය බේරාගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සමග අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකරනු ලබයි. මෙම කාර්යයන් සඳහා කොළඹ ප්‍රධාන කාර්යාලය සමග ප්‍රාදේශීය ගුවන් විදුලි මධ්‍යස්ථාන 19 කටයුතු කරනු ලබයි.

මෑතකදී ආරම්භ කරන ලද මයිලඩි, දික්ඕවිට, වෙල්ලමන්කරය, කලමැටිය සහ කප්පරතොට යන ධීවර වරායන් වල ප්‍රාදේශීය ගුවන් විදුලි මධ්‍යස්ථාන ආරම්භ කිරීමට යෝජිතව ඇත. ධීවර දෙපාර්තමේන්තුව සතුව පවතින පැරණි ගුවන් විදුලි යන්ත්‍ර උපයෝගී කරගෙන දැනට සෝදිසි මෙහෙයුම් කටයුතු සාමාන්‍ය පරිදි සිදු කරනු ලබන අතර ඉහත ධීවර වරායන් සඳහා නව ගුවන් විදුලි යන්ත්‍ර වල අවශ්‍යතාවය දැඩි ලෙස ඇති වී ඇත.

6.2 ධීවර යාත්‍රාවල සන්නිවේදන කටයුතු සඳහා බලපත්‍ර ලබාදීමට හා ඇමතුම් සංඥා ලබාදීමට කටයුතු කිරීම.

අන්තර්ජාතික නීති රීතිවලට අනුකූලවීම සඳහා මහ මුහුදේ ධීවර කටයුතුවල නිරත ධීවර යාත්‍රා සඳහා අන්තර්ජාතික ඇමතුම් සංඥා ලබාදීම ධීවර දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතියට යටත්ව සිදුකරනු ලබයි. ධීවර යාත්‍රා හිමියන්ගේ අයදුම්පත් ලබාගෙන විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා එක්ව කටයුතු කරමින් ධීවර යාත්‍රාවල ගුවන් විදුලි පණිවිඩ හුවමාරුකිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම කඩිනම් කිරීම සඳහා සෝදිසි මෙහෙයුම් අංශය මැදිහත්වී කටයුතුකරනු ලබයි.

වගුව 10: ඉල්ලුම්පත් ප්‍රමාණය

ලබා දෙන ලද ගුවන් විදුලි පණිවුඩ හුවමාරු යන්ත්‍ර බලපත්‍ර සඳහා ඉල්ලුම්පත් ප්‍රමාණය (2025 ජනවාරි සිට 2025 අගෝස්තු 31 දක්වා)	356

6.3 ධීවර යාත්‍රා හා ධීවර කාර්මිකයින්ට වන අනතුරු වලදී රක්ෂණ ආවරණ ලබාගැනීමට අවශ්‍ය තොරතුරු සනාථ කර දීම.

ධීවර යාත්‍රාවලට හා ධීවර කාර්මිකයින්ට වන අනතුරුවලදී ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී හා ඔවුන් විසින් රක්ෂණ වන්දි ලබාගැනීමේදීද රක්ෂණ ආයතන වලට ධීවර යාත්‍රාවන් විසින් ලබාදෙන සියලු පණිවිඩ හුවමාරු තොරතුරු අදාළ ප්‍රාදේශීය කාර්යාල වලින් හා ප්‍රධාන කාර්යාලයෙන් ලබාගන්නා සටහන් ද භාවිතා කොට සහතික කර ඉදිරිපත් කරනු ලබයි.

මෙම දෙපාර්තමේන්තුව සතුව ආපදාවට ලක්වන ධීවර යාත්‍රා හා ධීවර කාර්මිකයන් බේරා ගැනීම, හදිසි ප්‍රතිකාර ලබා දීමට හා කඩිනමින් ගොඩබිමට රැගන ඒමට මුදාගැනීමේ යාත්‍රා නොමැති බැවින් නාවික හමුදාවේ සහ වෙරල ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහය ලබා ගනු ලබයි.

වගුව 11: අනතුරු සංඛ්‍යාව (2025 ජනවාරි සිට 2025 අගෝස්තු 31 දක්වා)

මහ මුහුදේදී වාර්තා වූ හදිසි අනතුරු සංඛ්‍යාව	160
මහ මුහුදේ සිදු වූ පුද්ගල මරණ සහ අතුරුදහන් වීම්	18
හදිසි අනතුරු නිසා විනාශයට පත් ධීවර යාත්‍රා සංඛ්‍යාව	05

6.4. විදේශීය රටවලදී අත්අඩංගුවට පත් ධීවරයින් හා යාත්‍රා මුදාගැනීම හා මෙරටට ගෙන්වා ගැනීම

වගුව :12 විදේශීය රටවලදී අත්අඩංගුවට පත් ධීවරයින් හා යාත්‍රා මුදාගැනීම හා මෙරටට ගෙන්වා ගැනීම (2025 ජනවාරි සිට 2025 අගෝස්තු 31 දක්වා)

රට	අත්අඩංගුවට පත් ධීවරයින් සංඛ්‍යාව	අත්අඩංගුවට පත් යාත්‍රා සංඛ්‍යාව	මුදාගත් ධීවරයින් සංඛ්‍යාව	මුදාගත් යාත්‍රා සංඛ්‍යාව
ඉන්දියාව	05	02	00	00
මාලදිවයින	31	06	25	03
සීසේල්ෂ්	06	01	00	00
මැඩගස්කර්	07	01	00	00

මෙම නිදහස් කර ගැනීම් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය මගින් ඉන්දියාව, මාලදිවයින, ප්‍රංශය මෙන්ම ලන්ඩනයේ පිහිටි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලවල සහය ලබා ගනු ලබයි.

6.5 දේශීය, ජාත්‍යන්තර හා විදේශ රටවලට අයත් මුහුදු සීමාවන්හී පාවී යමින් තිබෙන යාත්‍රා බේරා ගැනීමට කටයුතු කිරීම.

වගුව 13: මුදාගත් ධීවරයින්, යාත්‍රා සංඛ්‍යාව (2025 ජනවාරි සිට 2025 අගෝස්තු 31 දක්වා)

මුදාගත් ධීවරයින් සංඛ්‍යාව	මුදාගත් යාත්‍රා සංඛ්‍යාව	අත්හැර දමන ලද යාත්‍රා සංඛ්‍යාව
948	158	02

එන්ජින් අක්‍රියවීම නිසා ආසන්න රටවල්වල මුහුදු සීමාවන්ට පාවී යන ලද, මුහුදේදී හදිසි අනතුරුවලට ලක් වන ලද, ධීවර යාත්‍රා හා හදිසි අසනීප තත්වයන්ට පත් වූ ධීවර කාර්මිකයින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ/වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ යාත්‍රා, වෙළෙඳ නැව් හා ධීවර යාත්‍රා මගින් බේරා ගැනීම් කටයුතු සිදු කරන ලද අතර වෛද්‍ය ප්‍රතිකාර සඳහා කඩිනමින් රෝහල් ගත කරන ලදි.

6.6 කුඩා / එක්දින යාත්‍රා සඳහා සන්නිවේදන පහසුකම් ලබාදීම

වෙරළාසන්න ධීවර රැකියාවේ යෙදෙන කුඩා යාත්‍රා හා ධීවර පිරිස් වෙත හදිසි කාළගුණික වෙනස්වීම් පූර්ව කාළගුණික අනතුරු ඇඟවීම් ඉක්මණින් ධීවර ප්‍රජාව වෙත ලබා දී ජීවිත හානි වළක්වා ගැනීමේ අරමුණින් යුතුව ඩයලොග් ආයතනය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා මෙම දෙපාර්තමෙන්තුව ගිවිසුම් ගත විය. ඒ අනුව 2025 වර්ෂයේ මේ වන විට ධීවර කාර්මිකයින් සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් 120,000ක් පමණ මෙම ඩයලොග් තොරතුරු සේවාවේ ලියාපදිංචි වී ඇති අතර ඔවුන් මෙහි ප්‍රතිලාභ භුක්ති විඳිමින් සිටි.

6.7 ධීවර ප්‍රජාව දැනුවත් කිරීම

ධීවර ප්‍රජාව/ ධීවර කාර්මිකයින් හා යාත්‍රා අයිතිකරුවන් දැනුවත් කිරීම් සිදු කිරීම අත්‍යාවශ්‍ය කරුණක් වුවද ධීවර කාර්මිකයින්ගේ ජීවිත ආරක්ෂාව සඳහා වන උපදෙස් හා හදිසි අනතුරකදි අනුගමනය කළ යුතු ආකාරය මෙන්ම ගොඩබිම හා සම්බන්ධ වී හදිසි උපකාර සේවා ලබා ගන්නා ආකාරයද හදිසි කාලගුණ විපර්යාසයන්ට අනුව ඇතිවන සුලි කුණාටු වලදි ජීවිත ආරක්ෂා කිරීමට අනුගමනය කරන ක්‍රමවේදයන් හා ගුවන් විදුලි යන්ත්‍ර සඳහා බලපත් ලබා ගන්නා ආකාරය පිළිබඳව දැනුවත් කිරීම් සිදුකිරීමට අත්‍යාවශ්‍ය බව පෙනී ගියද මෙරට තුළ පවතින ආර්ථික අර්බුද තත්ත්වය මත නිසියාකාරව ඉටුකර ගැනිමට නොහැකිවිය.

ඇතැම් ධීවරයින්ගේ මත් ද්‍රව්‍ය භාවිතාව ඉහල යාම හා එමගින් ඇති වූ අහිතකර ප්‍රවණතාවක් ලෙස නැව් මාර්ගයේ අනතුරු සිදුවීම් ඉහල ගොස් ඇති අතර ජීවිත හානි/යාත්‍රා විනාශවීම් වැඩි වී ඇත. එමෙන්ම සංවිධානාත්මක අනවසර සංක්‍රමණ සඳහා යාත්‍රා යොදා ගැනිම බහුල වී ඇත. යාත්‍රා විශාල ප්‍රමාණයක් මහමුහුදේදි යාන්ත්‍රික දෝෂ සහිත වීම ඉහල ගොස් ඇති අතර විශේෂයෙන්ම වෙනත් රටවල මුහුදු සිමා ආසන්නයේ සිදු වන ආපදා තත්වයන් වැඩී වී ඇති බැවින් වෙනත් රටවල් සමගින් නිරන්තරයෙන් රාජතාන්ත්‍රික මැදිහත්වීම් මගින් ඒ ඒ රටවල බේරා ගැනිමේ මධ්‍යස්ථාන වෙත දන්වා යැවීමට සිදුවී ඇත. එබැවින් යාත්‍රා හිමියන් යාත්‍රා පිටත් කර යැවීමට ප්‍රථම නැවතත් තම යාත්‍රා නාවික ගමන් සඳහා යෝග්‍ය තත්ත්වයක පවතිද යන්න පරීක්ෂා කිරිම සඳහා උනන්දු කරවීමට දැනුවත් කිරීම් කළ යුතුය.

වගුව 14: එක් එක් වරායෙන් පිටත් වූ ධීවර යාත්‍රා සඳහා ලබා දුන් පිටත්වීම් ගණන (2025 ජනවාරි සිට 2025 අගෝස්තු 31 දක්වා)

	වරාය	පිටත්වීම් ගණන
1	කල්පිටිය	255
2	මීගමුව	3,777
3	දික්ඕවිට	837
4	බෙරුවල	4,041
5	අම්බලන්ගොඩ	844
6	හික්කඩුව	663
7	ගාල්ල	4,720

	වරාය	පිටත්වීම් ගණන
14	තංගල්ල	1,023
15	හම්බන්තොට	607
16	කිරින්ද	415
17	වාලච්චේන	12,152
18	ත්‍රිකුණාමලය	2,312
19	පොයින්ටිපේදුරු	161
20	මයිලඩි	111

8	මිරිස්ස	2,454
9	දෙවිනුවර	3,131
10	කෝට්ටෙගොඩ	890
11	නිල්වැල්ල	1,907
12	කුඩාවැල්ල	3,853
13	සයින්දමර්දූ	846

21	වෙල්ලමන්කරය	779
22	කප්පරතොට	407
23	ගන්දර	1,882
24	කලමැටිය	345
25	හලාවත	277

6.8 වාර්තා සහ යාත්‍රා ඡායාරූප දත්ත ගබඩාවට ඇතුලත් කිරීම හා කළමනාකරණය

වගුව 15: ලොග් වාර්තා සහ යාත්‍රා ඡායාරූප දත්ත ගබඩාවට ඇතුළත් කිරීම හා කළමනාකරණය (2025 ජනවාරි සිට 2025 අගෝස්තු 31 දක්වා)

1.	ධීවර මෙහෙයුම්වලට අදාළව ඒකකය වෙත ලැබුණු ලොග් පිටපත් ගණන	3,678
2.	මෙහෙයුම්වලට අදාළව නිකුත් කරන ලද සත්‍යාපන වාර්තා ගණන	3,678
3.	ලොග් දත්ත ගබඩාව වෙත ඇතුළු කරන ලද ලොග් පිටපත් ගණන	24,025
4	IOTC අවශ්‍යතා සඳහා පවත්වා ගන්නා යාත්‍රා ඡායාරූප දත්ත පද්ධතිය වෙත ඇතුලත් කරන ලද වාර්තා ගණන	122

2015 වරාය රාජ්‍ය පියවරයයන් ක්‍රියාත්මක කිරීමේ නියෝග මාලාවට අනුව ශ්‍රී ලංකාවේ වරාය පහසුකම් ලබාගැනීමට මසුන් ගොඩබැමට හෝ ප්‍රති නැව්ගත කිරීමට පැමිණෙන විදේශීය ධීවර යාත්‍රා සඳහා බලපත්ර නිකුත් තිරීම් හා යාත්‍රා පරීක්ෂාවන් සිදු කරනු ලබයි. ඉන්දියානු සාගර ටුනා කොමිසමේ 16/11 සම්මුතියට අනුව ශ්‍රී ලංකාවේ වරායවලට පිවිසෙන විදේශීය ධීවර යාත්‍රාවලින් අවමය 5% කට අදාළව සිදු කරනු ලබන පරීක්ෂණ වාර්තා ඉන්දියානු සාගර ටුනා කොමිසම වෙත ඉදිරිපත් කළ යුතුව ඇත.

වගුව 16: සේවාවන් (2025 ජනවාරි සිට 2025 අගෝස්තු 31 දක්වා)

සේවාවන්	**නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව**	**පරීක්ෂාවන් සංඛ්‍යාව**
මසුන් ප්‍රති නැව් ගත කිරීම	08	08
නඩත්තු කටයුතු හා සැපයුම් සේවා	08	01
ආරක්ෂ නිලධාරීන් හා විදේශී ධීවර කාර්මිකයින් භුවමාරු කටයුතු සේවා	08	01
එකතුව	**24**	**10**

ඒලෙස 2025.01.01 – 2025.08.31 කාලය තුළ දී මීටර 24 ට වඩා වැඩි දිගින් යුතු යාත්‍රා සඳහා යෙදවූ නිරීක්ෂකයින් සංඛ්‍යාවත්, එම යාත්‍රා සිදුකළ මෙහෙයුම් සංඛ්‍යාවත් පහත වගුවේ පරිදි වේ.

වගුව :17 ධීවර යාත්‍රා

මුළු ධීවර යාත්‍රා සංඛ්‍යාව 24m ට වැඩි	**සක්‍රිය යාත්‍රා සංඛ්‍යාව**	**මුළු ධීවර මෙහෙයුම් ගණන**	**විද්‍යාත්මක ධීවර යාත්‍රා නිරීක්ෂණ සංඛ්‍යාව**
05	04	05	00

6.9 ඉන්දියනු සාගර ටුනා කොමිසම (IOTC), ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO), යුරෝපා සංගමය (EU) වැනි ජාත්‍යන්තර ආයතන හා සඳහා කාලීන වාර්තා සැපයීම සහ වාර්ෂික රැස්වීම් සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.

- ඉන්දියනු සාගර ටුනා කොමිසම සඳහා වාර්ෂිකව සැපයිය යුතු වාර්තා අදාළ දින වකවානුවලට යටත්ව සපයනු ලබයි.
- ඉන්දියානු සාගර ටුනා කොමිසමෙහි 10/11 සම්මුතියට අනුව සංවර්ධනය වෙමින් පවතින සාමාජික රටවලට කමිටු රැස්වීම් සහ සැසිවාර වලට සහභාගීවීම සඳහා ලබාදෙන අරමුදල් යටතේ අදාළ තාක්ෂණික නිලධාරීන් වාර්ෂික රැස්වීම සඳහා සහභාගී වන ලදී.
- ඒ අනුව ශ්‍රී ලංකාව 2010 වසරේ සිට පහත පරිදි අනුකූලතා ප්‍රගතිය පෙන්නුම් කර ඇත.

වගුව 18: අනුකූලතා ප්‍රගතිය

2010	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
5%	18%	47%	51%	60%	74%	77%	82%	87%	90%	86%	76%	83%	73.8 %	%71.2

6.10 බහුදින ධීවර යාත්‍රා සඳහා ධීවර යාත්‍රා නිරීක්ෂණ උපකරණ 4200ක් (VMS) සවි කිරීම

මේ වන විට අවසාන අදියරට අදාළ VMS උපකරණ 82ක් සවිකරමින් පවතියි.

තවද, VMS උපකරණ හරහා බෝට්ටු හිමිකරුවන්ට ලාභදායී සහ කාර්යක්ෂම සේවා සැපයීමේ හැකියාව ඇත. මෙහිදී යාත්‍රාවේ සවි කර ඇති ඇන්ටනාව ඉතා අඩු බල අවශ්‍යතාවයකින් (2W) ක්‍රියා කරන අතර ප්‍රධාන බල සැපයුම නොමැති විට දින 3ක් දක්වා එහි උපස්ථ බලය භාවිතා කිරීමට හැකියාව ඇත. FMC කාර්ය මණ්ඩලයට පහසු සහ සුමට ලෙස මෙහෙයුම් සිදු කිරීමට එමගින් ඉඩ සැලසෙන අතර බෝට්ටුව වෙනත් රටවල EEZ කලාපය වැනි පාලිත ප්‍රදේශ අසල ඇති විට ස්වයංක්‍රීය අනතුරු ඇඟවීම් නිර්මාණය කරයි.

VMS පද්ධතියට අදාළ සියලුම වරාය කාර්යාල හරහා ප්‍රවේශ විය හැකි අතර DFAR හි ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පිහිටා ඇති ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය (FMC) මගින් මධ්‍යගතව කළමනාකරණය කරයි. දැනට ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය (FMC) මගින් යාත්‍රා 24x7 නිරීක්ෂණය කරයි. විදේශ රටවලට ඇතුළු වීම, VMS හානි කිරීම වැනි සැක කටයුතු හැසිරීම් හඳුනා ගැනීම FMC හි ප්‍රධාන රාජකාරිවලින් එකකි. FMC දිනපතා සංඥා නොමැති හෝ අඩු සංඥා සහිත යාත්‍රා (නිහඬ යාත්‍රා ලෙස හැඳින්වේ) හඳුනාගෙන ඔවුන්ගේ යාත්‍රාව නැවත අදාළ ක්‍රමවේදයට ඇතුලත් වන තුරු යාත්‍රා පිටත්වීම අවලංගු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

දීර්ඝ කාලසීමාවක් සහිත VMS අක්‍රිය යාත්‍රා ඇතුළු සියලු සැක කටයුතු යාත්‍රා පිළිබඳ තොරතුරු පරීක්ෂණ පැවැත්වීම සඳහා විමර්ශන අංශය වෙත යොමු කරනු ලැබේ. මිනිස් ජාවාරම්, මත්ද්‍රව්‍ය ජාවාරම් සහ දේශසීමා තරණය වැනි නීතිවිරෝධී ක්‍රියාකාරකම් සඳහා යොදා ගත හැකි අවදානම් යාත්‍රා හඳුනාගැනීම සඳහා අඛණ්ඩව කටයුතු කරයි.

ඔස්ට්‍රේලියාව-ශ්‍රී ලංකා VMS ව්‍යාපෘතිය යටතේ FMC සියලු නවීන තාක්ෂණයෙන් ද නවීකරණය කර ඇති අතර ඒ අනුව ශ්‍රී ලංකා FMC ආසියාවේ අති නවීන අධීක්ෂණ මධ්‍යස්ථානයක් ලෙස හඳුනාගෙන ඇත.

03
ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA)

දැක්ම

තිරසර හා අපනයනය අරමුණු කරගත් ජලජීවී වගාව තුළින් ජාතික ආහාර සුරක්ෂිතතාව සහ ආර්ථික සමෘද්ධිය සඳහා දායක වෙමින් දකුණු ආසියාවේ ප්‍රමුඛතම ජලජීවී වගා සේවා සපයන්නා වීම.

අපගේ මෙහෙවර

1. ජාතියේ ආහාර සුරක්ෂිතතාව සහතික කරන දිගුකාලීන තිරසර ජලජීවී වගා පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම

2. අපනයනය කේන්ද්‍ර කරගත් ජලජීවී වගාවන් සඳහා සහාය වීමෙන් ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීම් වැඩි කිරීම

3. ජලජීවී වගා අංශයේ වර්ධනය සඳහා නව්‍ය, කාර්යක්ෂම සහ පරිසර හිතකාමී සේවාවන් සැපයීම

4. තාක්ෂණික සහාය, ධාරිතා වර්ධනය සහ සම්පත් කළමනාකරණය තුළින් ප්‍රජාවන් සහ පාර්ශවකරුවන් බල ගැන්වීම

ආහාර සුරක්ෂිතතාව සහ ග්‍රාමීය ප්‍රජාවන්ගේ සමාජ-ආර්ථික යහපැවැත්ම උදෙසා ජලජීවී වගාව සහ මිරිදිය ධීවර කර්මාන්තයේ තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ නියාමනය කිරීම ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇත. 2025 වසරේ දී, අධිකාරිය උපායමාර්ගික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නිෂ්පාදන පද්ධති පුළුල් කිරීම සහ ජලාශ ධීවර කළමනාකරණය සහ ජලජීවී වගාව සඳහා ප්‍රජා සහභාගීත්වය වැඩි දියුණු කිරීම මගින් මිරිදිය ධීවර හා ජලජීවී වගාවේ ප්‍රමුඛ ආයතනය ලෙස එහි භූමිකාව ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදු කරයි.

මෙම කාර්ය සාධන වාර්තාව වසර තුළ මේ දක්වා වන ප්‍රගතිය දක්වා ඇති අතර, ජාතික සංවර්ධන ප්‍රමුඛතා සඳහා අධිකාරියෙහි හි දායකත්වය මෙමඟින් ඉස්මතු කරයි.

මිරිදිය ධීවර හා ජලජීවී වගා නිෂ්පාදනය



2025 වසරේ මුල් මාස අට තුළ, ශ්‍රී ලංකාවේ මිරිදිය ධීවර හා ජලජීවී වගා නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 39,590 ක් වූ අතර එය වාර්ෂික නිෂ්පාදන ඉලක්කය වන මෙට්‍රික් ටොන් 102,000 න් 39% ක් වේ.

- මිරිදිය ධීවර නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 32,810 ක් වූ අතර එය එහි ඉලක්කය වන මෙට්‍රික් ටොන් 85,000 න් 39% කි. 2025 අගෝස්තු මාසය දක්වා වූ සමස්ත මිරිදිය ධීවර හා ජලජීවී වගා නිෂ්පාදනයෙන් 83% ක දායකත්වයක් මෙම අංශය තුළින් සපයා ඇත.
- කිවුල්දිය සහ සමුද්‍ර ජලජීවී වගා නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 6,780 ක් වූ අතර වාර්ෂික ඉලක්කය වන මෙට්‍රික් ටොන් 17,000 න් 40% ක් වේ.
- මෙම කාලපරිච්ඡේදය තුළ මෙම අංශය සමස්ත මිරිදිය ධීවර හා ජලජීවී වගා නිෂ්පාදනයට 16% ක දායකත්වයක් ලබා දී ඇත.

ඉදිරි මාසවලදී කාලීන ජලාශ වල මත්ස්‍ය නිෂ්පාදනය ආරම්භ වීමත් සමඟ මිරිදිය ධීවර නිෂ්පාදනය සැලකිය යුතු ලෙස ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර, මෙමඟින් වසරේ දෙවන භාගයේ දී නිෂ්පාදනය ඉහළ නංවයි.

මිරිදිය ජීවර සංවර්ධනය

සංවර්ධන කාර්යයන්

මත්ස්‍ය ඇඟිල්ලන් හා මිරිදිය ඉස්සන් පසුකීටයන් තැන්පත් කිරීම



<u>මත්ස්‍ය බීජ තොග සඳහා රජයේ විශේෂ ආධාර වැඩසටහන</u>

2025 වර්ෂය සඳහා මත්ස්‍ය බීජ තැන්පත් කිරීමේ වැඩසටහන සඳහා රජය රුපියල් මිලියන 200 ක් වෙන් කර ඇත. මෙම වැඩසටහන යටතේ මත්ස්‍ය පසුකීටයන් මිලියන 16ක්, මත්ස්‍ය ඇසිත්තන් මිලියන 51ක් සහ මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 16ක් තැන්පත් කිරීමට සැලසුම් කර ඇති අතර එහි ප්‍රගතිය පහත පරිදි වේ.

වගුව 1: මත්ස්‍ය බීජ තැන්පත් කිරීමේ වැඩසටහනේ ප්‍රගතිය

විස්තරය	ඉලක්කය (මිලියන)	ප්‍රගතිය (මිලියන) 31.08.2025		වටිනාකම (රු .මිලි)
පසුකීටයන් නිකුත් කිරීම	16	11.79	74%	8.84
මත්ස්ය ඇසිත්තන් නිකුත් කිරීම	51	31.80	62%	49.30
මත්ස්‍ය ඇඟිල්ලන් නිකුත් කිරීම	16	11.40	71%	74.75
එකතුව				**132.89**

සෑම නිත්‍ය ජලාශයක් සඳහාම ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම

දිගුකාලීන, තිරසර මිරිදිය ධීවර ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා, අධිකාරිය විසින් 2025 වසරේ දී රජයේ සංවර්ධන උපායමාර්ගයන්ට අනුව නව යාන්ත්‍රණයක් හඳුන්වා දෙන ලදී. සුදුසු ප්‍රමාණයන්ගෙන් සහ විශේෂයන්ගෙන් යුත් මත්ස්‍ය ඇඟිල්ලන් අඛණ්ඩව තැන්පත් කිරීම තුළින් ජලාශ වල මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම මෙම වැඩසටහනේ අරමුණයි. මෙම යාන්ත්‍රණය යටතේ, තෝරාගත් සෑම ජලාශයක් සඳහාම විද්‍යාත්මකව සකස් කරන ලද ඇඟිල්ලන් තැන්පත් කිරීමේ සැලැස්මක් සහ වගා පාදක ධීවර කර්මාන්තයේ තිරසරභාවය සහතික කිරීම සඳහා මුදල් ප්‍රවාහ සැලැස්මක් ඇතුළත් පුළුල් ව්‍යාපාර සැලැස්මක් යටතේ ක්‍රියාත්මක වනු ඇත.

2025 වර්ෂය සඳහා, නිත්‍ය ජලාශ 115ක් තෝරා ගන්නා ලද අතර, අගෝස්තු මාසය වන විට, ජලාශ 75ක් සඳහා ව්‍යාපාර සැලසුම් සකස් කර ඇත.

මෙම උපායමාර්ග ඔවුන්ගේ ක්‍රියාකාරකම් වලට ඒකාබද්ධ කිරීමෙන්, ධීවර සංවිධාන පහත සඳහන් කරුණු පිළිබඳ වඩාත් ස්ථාවර මට්ටමකට පැමිණේ :

- සාමූහික ක්‍රියාකාරකම් සහ ව්‍යුහගත සැලසුම්කරණය තුළින් ක්‍රියාකාරීත්වය සහ ඵලදායිතාව ශක්තිමත් කිරීම.
- දිගුකාලීන තිරසරභාවය සහතික කරමින් මූල්‍ය ස්ථාවරත්වය ළඟා කර ගැනීම
- ස්වයං විශ්වාසය හා වර්ධනය අපේක්ෂා කරන අනෙකුත් ධීවර සමිති සඳහා ආදර්ශයක් ලෙස ක්‍රියා කිරීම

මිරිදිය මත්ස්‍ය බීජ නිෂ්පාදනය

මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ජලාශ වල තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මත්ස්‍ය බීජ නිෂ්පාදනය කිරීම අධිකාරියේ ප්‍රධාන කාර්යභාරයක් වේ. ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන විසින් මත්ස්‍ය පසු කීටයන්, ඇසිත්තන් සහ ඇඟිල්ලන් නිෂ්පාදනය කරනු ලැබේ. මත්ස්‍ය පසුකීටයන් සහ ඇසිත්තන් මත්ස්‍ය ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීමට පෞද්ගලික පොකුණු, කූඩු, ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක සඳහා ලබා දේ. මීට අමතරව පම්බල, කහඳමෝදර හා කල්ලරාව මධ්‍යස්ථාන වල මිරිදිය ඉස්සන් පසුකීටයන් නිෂ්පාදනය කරනු ලැබේ. 2025 අගෝස්තු මාසය දක්වා වන මත්ස්‍ය බීජ නිෂ්පාදනය සහ බෙදා හැරීම රූපසටහන 3හි දක්වා ඇත.



සටහන 3: ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වල මත්ස්‍ය බීජ නිෂ්පාදනය සහ බෙදා හැරීම



රූපසටහන 4: පෞද්ගලික පොකුණු , කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක, කූඩු, කොටු වල මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය

මිරිදිය ධීවර කර්මාන්තය සඳහා විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාවන්ගේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීම් සහතික කිරීම සඳහා ස්වයං තිරසර වගා පාදක මිරිදිය ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය සමඟ එක්ව, මිරිදිය ධීවර කර්මාන්තය ශක්තිමත් කිරීම සහ ග්‍රාමීය ජීවනෝපායන් වැඩිදියුණු කිරීම සඳහා ජපාන රජය විසින් එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) සමඟ එක්ව අරමුදල් සපයා ඇත. මෙම ව්‍යාපෘතිය 2024 වසරේ අප්‍රේල් මාසයේදී ආරම්භ වූ අතර 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී අවසන් කිරීමට නියමිතය. 2025 වසර තුළ පහත සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

- **අධිකාරිය සතු ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන හතරක් වැඩිදියුණු කිරීම**

ඉඟිනියාගල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයේ අභිජනනාගාර පහසුකම් වැඩිදියුණු කිරීම

දඹුල්ල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයේ මව් මත්ස්‍ය පොකුණු 3ක් සහ මඩ පොකුණක් ප්‍රතිසංස්කරණය කිරීම

ඉරණමඩු ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයේ ජල ගබඩා ටැංකිය කොන්ක්‍රීට් කිරීම

උඩවලව කාප් ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයේ වර්ධක ටැංකි පද්ධතිය සඳහා සෙවන දැල් යෙදීම

- **අභිජනනය සහ වර්ධනය කිරීමේ ධාරිතාව වැඩි කිරීම සඳහා එක්ගල් ඔය කුඩා අභිජනන ඒකක පහසුකම් වැඩිදියුණු කිරීම**

පසුකීටයන් වර්ධනය කිරීම සඳහා මඩ පොකුණු 3ක් කොන්ක්‍රීට් කිරීම

- **අධිකාරිය සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රවාහනය සඳහා බවුසර් රථ 3 ලබා දීම**

- **මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම**

දිස්ත්‍රික්කය	මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම මිලියන (ජන- අගෝ)
අනුරාධපුර	0.44
මඩකළපුව	1.12
මොණරාගල	0.49
මුලතිව්	0.65
එකතුව	**2.70**

- **ප්‍රජා මූලික කුඩා පරිමාණයේ අභිජනන ඒකක 3ක් පිහිටුවීම.**

ශ්‍රී ලංකාවේ වගා පාදක ධීවර කර්මාන්තයේ තිරසර වර්ධනයට ඇති ප්‍රධාන බාධාව වන්නේ මත්ස්‍ය ඇඟිල්ලන්, විශේෂයෙන් කාප් මත්ස්‍ය විශේෂ හිඟයයි. පවතින නිෂ්පාදන පහසුකම් ඉඩකඩ සහ ධාරිතාව සීමිත වන අතර එම නිසා, වගා පාදක ධීවර කර්මාන්තය සඳහා අඛණ්ඩ මත්ස්‍ය බීජ සැපයුමක් සහතික කිරීම සඳහා ප්‍රජා මූලික අභිජනන සහ වර්ධනය කිරීමේ ඒකක ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ.

ඒ අනුව මොණරාගල දිස්ත්‍රික්කයේ මුතුකණ්ඩිය, මඩකලපුව දිස්ත්‍රික්කයේ පුළුකුණාව සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය යන ප්‍රදේශවල කුඩා පරිමාණයේ අභිජනන ඒකක තුනක් ඉදිකරමින් පවතී.

පුළුකුණාව, මඩකළපුව දිස්ත්‍රික්කය

මුතුකන්ඩිය, මොණරාගල දිස්ත්‍රික්කය

පදවිය, අනුරාධපුර දිස්ත්‍රික්කය

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක අම්පාර දිස්ත්‍රික්කයේ ස්වයං තිරසර වගා පාදක මිරිදිය ධීවර පොකුරු ආකෘතියක් ස්ථාපිත කිරීම සඳහා තාක්ෂණික සහාය

මෙම ව්‍යාපෘතිය යටතේ, අම්පාර දිස්ත්‍රික්කයේ පන්නල්ගම, එක්ගල් ඔය, නාමල් ඔය, හිමිදුරාව සහ කොන්ඩුවටුවාන ජලාශ මෙන්ම එක්ගල් ඔය කුඩා පරිමාණ මත්ස්ය අභිජනන ඒකකය සහ රජ වැව කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකකය සංවර්ධනය සඳහා තෝරා ගන්නා ලදී. ව්‍යාපෘතිය 2024 වසරේ දී ආරම්භ කරන ලද අතර 2025 වසරේ සැප්තැම්බර් 15 වන දින නිම කිරීමට නියමිතය. 2025 වසර තුළ පහත සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන ලදී:

මව් මසුන් ආනයනය කිරීම

2025 ජූලි 28 වන දින, රෝහු, කැට්ලා, මිරිගල් සහ තණකොළ කාපයා ඇතුළත් සජීවී මත්ස්‍යයින් 11,546 ක් බංග්ලාදේශයෙන් මෙරටට ආනයනය කරන ලදී. නිරෝධායන කාලයෙන් පසුව සහ සෞඛ්‍ය තත්ත්ව තහවුරු කිරීමෙන් පසු, තෝරාගත් ප්‍රධාන ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වෙත මසුන් බෙදා හරිනු ලැබේ.

- **ජලාශවලින් මවු මසුන් එකතු කිරීම**

මෙහි දී මව් සතුන් ලෙස වර්ධනය කිරීම සඳහා පරිණත මසුන් ජලාශවලින් අල්ලා ගැනීම සිදු කෙරේ. එක්ගල්ඔය කුඩා අභිජනනාගාරය සඳහා අවශ්‍ය පැටවුන් අම්පාර දිස්ත්‍රික්කයේ ජලාශයෙන් එකතු කිරීමට සැලසුම් කල අතර ඒ අනුව අම්පාර දිස්ත්‍රික්කයේ එක්ගල්ඔය, නාමල්ඔය, ජයන්ති වැව, කණ්ඩිකුඩි ආරු යන ජලාශවලින් මසුන් 144ක් එකතු කරන ලදී

- **ධීවර ප්‍රජාව සඳහා පොත් තැබීම සහ වාර්තා තබා ගැනීම පිළිබඳ පුහුණුව**

අරමුදල් කළමනාකරණය කිරීම, මත්ස්‍ය බීජ තැන්පත් කිරීම සහ දෛනික අස්වැන්න සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම, සාමාජිකයින් අතර විශ්වාසය පවත්වා ගැනීම, විගණන සඳහා සූදානම් වීම, බාහිර අරමුදල් ආකර්ෂණය කර ගැනීම සහ දිගු කාලීන සංවර්ධන කටයුතු සහතික කිරීම සඳහා නිසි පොත් තැබීම සහ වාර්තා තබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

වර්තමානයේ බොහෝ ධීවර සමිතිවලට නිවැරදි මූල්‍ය වාර්තා පවත්වා ගැනීමේ හැකියාව නොමැති අතර, එමඟින් අකාර්යක්ෂමතාව, දුර්වල වගවීම සහ සංවර්ධන අවස්ථා මඟ හැරීම සිදු වේ. මෙම දැනුම ලබා දීම සඳහා, ධීවර සමිතිවල නිලධාරීන්, භාණ්ඩාගාරිකවරුන් සහ සුදුසු සාමාජිකයින් ඉලක්ක කර ගනිමින් පොත් තැබීමේ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

- **ධීවර කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම**

ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ජලාශ පහක ධීවර ප්‍රජාව සඳහා ජලාශ වල ධීවර කළමනාකරණය සහ ව්‍යාපාර සැලසුම් සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳව යාවත්කාලීන කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පහක් පවත්වන ලදී.

- **මත්ස්‍ය ආහාර සැපයීම සහ ආහාර කළමනාකරණ පුහුණුව**

අම්පාර දිස්ත්‍රික්කයේ ධීවර ප්‍රජාව සඳහා ආහාර සහ ආහාර කළමනාකරණය පිළිබඳ දින දෙකක පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදී. පුහුණු වැඩසටහන් සඳහා කළුගල්ඔය, කංචිකුඩි ආරු, වලතාපිටිය, කරංගාව, දූමන, වලගම, කරගස් වැව, හේනානිගල සහ මහ වනවල යන ජලාශවලින් ධීවරයින් 60 දෙනෙකු සහභාගි වූහ.

වෙරළබඩ ජලජීවී වගා සංවර්ධනය

වෙරළබඩ ජලජීවී වගා නිෂ්පාදනය (ජනවාරි – අගෝස්තු 2025)

කිවුල්දිය ඉස්සන්

නිෂ්පාදනය - මෙ. ටොන් 4,930

මුහුදු කූඩැල්ලන්

- නිෂ්පාදනය - මෙ. ටොන් - 382 (තෙත් බර)

මොදා

නිෂ්පාදනය - මෙ. ටොන් 756

මුහුදු පැළෑටි

- නිෂ්පාදනය - මෙ. ටොන් 546 (තෙත් බර)

සංවර්ධන කාර්යයන්

යාපනයේ මුහුදු කූඩැල්ලන් අභිජනනාගාරයක් ස්ථාපිත කිරීම

මුහුදු කූඩැල්ලන් වගාව ශ්‍රී ලංකාවේ ජලජීවී වගා ක්ෂේත්‍රය තුල ප්‍රචලිත වෙමින් පවතින අංශයකි. විශේෂයෙන් චීනය සහ අනෙකුත් නැගෙනහිර ආසියාතික රටවල ප්‍රණීත ආහාරයක් ලෙස සලකනු ලබන සහ ඖෂධීය ගුණ ඇති මුහුදු කූඩැල්ලන් සඳහා ජාත්‍යන්තර වෙළඳපොළේ ඉහළ මිලක් පවති.

ශ්‍රී ලංකාවේ මුහුදු කූඩැල්ලන් කර්මාන්තය මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් වන්නේ ජලජීවී වගාව සඳහා අවශ්‍ය මුහුදු කූඩැල්ලන් පැටවුන් නොමැතිකමයි. මෙය මෙම කර්මාන්තයේ වර්ධනයට සහ තිරසරභාවයට බාධාවක් වී ඇත. මෙම ගැටළුව විසඳීම සඳහා, යාපනයේ වාණිජ පරිමාණයේ මුහුදු කූඩැල්ලන් අභිජනනාගාරයක් පිහිටුවීම සඳහා අයවැය යෝජනා යටතේ රුපියල් මිලියන 175 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

යෝජිත අභිජනනාගාරය මඟින් අක්කර 300ක නිෂ්පාදන වපසරියක් සඳහා වාර්ෂිකව මුහුදු කූඩැල්ලන් පැටවුන් මිලියන 1.08 ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කරනු ලැබේ. මෙමඟින් වසරකට මුහුදු කූඩැල්ලන් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 324 ක් (තෙත් බර) පමණ වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර, එමඟින් වාර්ෂික අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 9.72 ක් ඇස්තමේන්තු කර ඇත.

මෙහි අරමුණ වන්නේ ග්‍රාමීය ජීවනෝපායන් වැඩිදියුණු කිරීම, විකල්ප ආදායම් මාර්ගයක් සැපයීම සහ රටට බෙහෙවින් අවශ්‍ය විදේශ විනිමය උත්පාදනය කිරීමයි. තිරසර නිෂ්පාදන ක්‍රම හඳුන්වා දීමෙන් සහ තාක්ෂණික සහාය ලබා දීමෙන්, ප්‍රජා පාදක ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කරන අතරම ශ්‍රී ලංකාවේ ජලජීවී වගා නිෂ්පාදන අපනයන සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට මෙම අංශයට හැකි වේ.

ඉස්සන් ජලජීවී වගා කර්මාන්තය සඳහා විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති

<u>ඵලදායී ජෛව ආරක්ෂණ සහ ඩිජිටල් තාක්ෂණය ව්‍යාපෘතිය හරහා විධිමත් සහ තිරසර ජලජීවී වගාව (GCP/GLO/086/ROK) Smart and Sustainable Aquaculture through Effective Biosecurity and Digital Technology (GCP/GLO/086/ROK) Project</u>

කොරියානු රජය, එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) හරහා, "ඵලදායී ජෛව ආරක්ෂණය සහ ඩිජිටල් තාක්ෂණය තුළින් විධිමත් සහ තිරසර ජලජීවී වගාව" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සපයා ඇත. මෙම ව්‍යාපෘතිය ඉස්සන් ජලජීවී වගා කර්මාන්තයේ ජෛව ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා ශක්තිමත් ප්‍රවේශයක් අනුගමනය කරයි.

මෙම ව්‍යාපෘතිය ඉස්සන් කර්මාන්තයේ ජෛව ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ශක්තිමත් ප්‍රවේශයක් අනුගමනය කරයි. ස්මාර්ට් සහ ඩිජිටල් තාක්ෂණයන් උපයෝගී කර ගනිමින් ජෛව ආරක්ෂණ අවදානම් සන්නිවේදනය, අධීක්ෂණය සහ අවම කිරීම වැඩි දියුණු කිරීම එහි අරමුණයි. මෙම වැඩපිළිවෙල ජෛව ආරක්ෂණ පාලනය පද්ධති අනුවර්තනය කිරීමට සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සහාය වේ.

2025 වසර තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම්

- ඉස්සන් ගොවිපල ඩිජිටල්කරණය සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) පැතිකඩකරණය (profiling)

- එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් සංවර්ධනය කරන ලද ස්මාර්ට් ජලජීවී වගා දත්ත කළමනාකරණ (SADM) පද්ධතිය



සිතියම්ගත කිරීම සඳහා හඳුනාගත් ප්‍රදේශ



ඩිජිටල්කරණය කළ පොකුණු භාවිතයෙන් නිපදවන ලද හැඩ ගොනුව

විසිතුරු මත්ස්‍ය කර්මාන්තය

විසිතුරු මසුන් ඇති කිරීම ලෝකයේ වඩාත් ජනප්‍රිය විනෝදාංශයක් ලෙස ශ්‍රේණිගත කර ඇති අතර එය ඡායාරූපකරණයට පමණක් දෙවැනි වේ. මින්මැදුරු වල සෞන්දර්යාත්මක ආකර්ෂණය සහ අලංකාර බලපෑම, විසිතුරු මත්ස්‍යයන් සඳහා ඇති ඉල්ලුම වැඩිවීමට සැලකිය යුතු ලෙස දායක වී ඇත. ශ්‍රී ලංකාවේ, විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ජාතික ආර්ථිකය තුළ පහත පරිදි වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

විදේශ විනිමය ඉපැයීම: 2025 දී (ජනවාරි - ජූලි) ශ්‍රී ලංකාව ඇමරිකානු ඩොලර් මිලියන 13.93 ක් පමණ වටිනා සජීවී විසිතුරු මසුන් අපනයනය කර ඇත. මෙය ශ්‍රී ලංකාව ලෝකයේ ඉහළම අපනයනකරුවන් අතර ස්ථානගතව පවතී.

ජීවනෝපායන් නිර්මාණය කිරීම: මෙම කර්මාන්තය මඟින් අභිජනනය, වර්ධනය කිරීම, එකතු කිරීම, අපනයනය සහ සිල්ලර වෙළඳාම ඇතුළු විවිධ අංශ හරහා රැකියා අවස්ථා සපයන අතර එමඟින් බොහෝ පුද්ගලයින්ගේ ජීවනෝපායන්ට සහාය වේ.

ග්‍රාමීය සංවර්ධනයට දායක වීම: විශේෂයෙන් ම ග්‍රාමීය ප්‍රදේශවල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායිකයින් , මිරිදිය මත්ස්‍ය විශේෂ අභිජනනයෙහි නිරත වෙමින්, දේශීය ආර්ථිකය සහ ප්‍රජා සංවර්ධනයට දායක වේ.

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මෙම අංශයේ සංවර්ධනයට සහාය වීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. විසිතුරු මත්ස්‍ය නව ප්‍රභේද බිහිකිරීම, ජලජීවී වගා තාක්ෂණ සංවර්ධනය, මව් මසුන් සැපයීම, මත්ස්‍ය රෝග නිර්ණය, පුහුණුව සහ තාක්ෂණ උපදෙස් සැපයීම ආදී කාර්යයන් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් සිදුකරනු ලැබේ. විසිතුරු මත්ස්‍ය හා ජලජ ශාක වගාව ශක්තිමත් කරන අතරම අපනයනය වැඩිකිරීම මෙම සංවර්ධන කාර්යයන්හි අරමුණවේ.

අධිකාරිය විසින් රම්බඩගල්ල, ගිනිගත්හේන සහ සෙවනපිටිය යන ප්‍රදේශවල විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන ක්‍රියාත්මක කරන අතර, මෙම මධ්‍යස්ථාන මඟින් විසිතුරු මත්ස්‍ය සහ ජලජ ශාක නිෂ්පාදනය සිදු කෙරේ. 2025 අගෝස්තු මාසය දක්වා මෙම මධ්‍යස්ථාන නිෂ්පාදකයින්ට සහ අපනයනකරුවන්ට විසිතුරු මත්ස්‍යයන් මිලියන 2.26ක් අලෙවි කර ඇත. මීට අමතරව, රම්බඩගල්ල විසිතුරු මත්ස්‍ය අභිජනන සහ පුහුණු මධ්‍යස්ථානය, ධාරිතා වර්ධනය සහ ග්‍රාමීය සංවර්ධනය සඳහා දායක වෙමින්, විසිතුරු මත්ස්‍ය වගාව පිළිබඳ පුද්ගලයින් 1,660 දෙනෙකු පුහුණු කර ඇත.

අධිකාරිය විසින් නිෂ්පාදනය කරන ලද විසිතුරු මත්ස්‍ය නව ප්‍රභේද

Luminous Red Scissortail

Luminous Blue Scissortail

Silver Cobra

මෙම සංවර්ධන කාර්යයන් මඟින්, ගෝලීය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකාවේ විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ තරඟකාරිත්වය සහ තිරසර සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය දායක වේ.

04
ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතන (NARA)

දැක්ම

කලාපයෙහි ජලජ සම්පත් සංරක්ෂණය, කළමනාකරණය සහ සංවර්ධනය පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ සිදුකරන ප්‍රමුඛ ආයතනය වීම.

මෙහෙවර

විද්‍යා හා තාක්ෂණ දැණුම සහ සම්පත් පදනම උපයෝගී කර ගනිමින් ජලජ සම්පත් අංශයෙහි ජාතික සංවර්ධන ගැටළු සඳහා නවෝත්පාදන විසඳුම් සම්පාදනය කිරීම.

ප්‍රධාන කාර්යයන්

1. පර්යේෂණ සහ සංවර්ධන

නාරා ආයතනය සජීවී සහ අජීවී ජලජ සම්පත් සම්බන්ධයෙන් විද්‍යාත්මක පර්යේෂණ සිදුකරනු ලබයි. එහිදී සාගර සහ අභ්‍යන්තර ජලජ මසුන් ගහණ පිළිබඳ අධ්‍යයන, කොරල්පර සහ කඩොලාන වැනි වෙරළබඩ පරිසර පද්ධතිවල තත්ත්වය තක්සේරු කිරීම සහ මුහුදු කුඩැල්ලන් (sea cucumber) , මුහුදු පැළෑටි (Seaweed) වැනි නව සම්පත් සඳහා විභවයන් ගවේෂණය කිරීම ඇතුළත් වේ. ආයතනය මසුන් ඇල්ලීම සහ ජලජීවී වගාව සඳහා නව තාක්ෂණයන් සංවර්ධනය කරන අතර, පසු අස්වනු හැසිරවීම සහ නිෂ්පාදන සංවර්ධනය සඳහා වඩා හොඳ ක්‍රම පර්යේෂණ කරයි.

2. සංරක්ෂණය සහ කළමනාකරණය

ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම සහතික කිරීම නාරා ආයතනයේ කාර්යභාරයේ ප්‍රධාන කොටසක් වේ. ඔවුන් මත්ස්‍ය තොග නිරීක්ෂණය කිරීම සඳහා සමීක්ෂණ පවත්වයි, ධීවර රෙගුලාසි දැනුම් දීම සඳහා දත්ත රැස් කරයි, සහ රටේ පුළුල් සුවිශේෂී ආර්ථික කලාපය (EEZ) කළමනාකරණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති පිළිබඳව උපදෙස් දෙයි. අධික ලෙස මසුන් ඇල්ලීම වැළැක්වීම සහ වඳවීමේ තර්ජනයට ලක්ව ඇති විශේෂ ආරක්ෂා කිරීම සඳහා මෙය ඉතා වැදගත් වේ. තෙල් කාන්දුවීම් සහ දූෂණය වැනි පාරිසරික හදිසි අවස්ථා පිළිබඳව ද නාරා ආයතනය විමර්ශනය කරන අතර අවම කිරීම සහ ප්‍රතිසාධන උත්සාහයන් සඳහා විශේෂඥ උපදෙස් ලබා දෙයි.

3. උපදේශන සහ සම්බන්ධීකරණය

ධීවර හා ජලජ අංශයට අදාළ විද්‍යාත්මක හා තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් ධීවර අමාත්‍යාංශයට සහ අනෙකුත් රාජ්‍ය ආයතනවලට නාරා ආයතනය ප්‍රධාන උපදේශක ආයතනයක් ලෙස කටයුතු කරයි. දේශීය හා ජාත්‍යන්තර යන අංශයෙන් හා අනෙකුත් ආයතන සමඟ පර්යේෂණ කටයුතු සම්බන්ධීකරණය කිරීමේදී ද අප ආයතනය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. මෙය ජලජ සම්පත් කළමනාකරණය සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් සහතික කරන අතර දැනුම සහ විශේෂඥතාව බෙදා ගැනීමට ඉඩ සලසයි.

4. දැනුම ව්‍යාප්තිය සහ පුහුණුව

මහජනතාවට, ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ ධීවර ප්‍රජාවට විද්‍යාත්මක තොරතුරු රැස් කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ බෙදා හැරීම සිදුකරයි. නාරා ආයතනය ධීවරයින්ගේ සිට ජලජීවී වගා ව්‍යවසායකයින් දක්වා කොටස්කරුවන්ට නව තාක්ෂණයන් සහ හොඳම භාවිතයන් පිළිබඳව පුහුණු සහ ව්‍යාප්ති සේවා ද සපයයි. මෙම විද්‍යාත්මක සොයාගැනීම් ජලජ අංශයට සහ ආර්ථිකයට සෘජුවම ප්‍රතිලාභ ලබා දෙන ප්‍රායෝගික යෙදුම් බවට පරිවර්තනය කිරීමට උපකාරී වේ.

1. කළමනාකරණ ව්‍යාපෘති

1. සමුද්‍ර ජීවී සම්පත්, මුහුදු පක්ෂීන් සහ ශ්‍රී ලංකා ජලයේ ටූනා මසුන් විශේෂවල සමාජ-ආර්ථික අංශ නිරීක්ෂණය කිරීම සහ තක්සේරු කිරීම

මෙම ව්‍යාපෘතිය වෙරළබඩ හා විශාල සාමුද්‍රික ධීවර සම්පත් පිළිබඳ ධීවර කටයුතු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ශ්‍රී ලංකාවේ සමුද්‍ර සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. දික්ඕවිට, මීගමුව සහ බේරුවල වැනි ප්‍රධාන වරායන්හි බහුදින ධීවරයින් සඳහා ඉන්දියානු සාගර ටූනා කොමිසමේ (IOTC) විශාල සාමුද්‍රික මත්ස්‍ය දත්ත මත පදනම්ව හා සංරක්ෂණ පියවරවල සමාජ-ආර්ථික බලපෑම් ඇගයීමෙන් සාක්ෂි මත පදනම් වූ මග පෙන්වීමක් සැපයීම මෙහි අරමුණයි. බහුදින ධීවර කටයුතුවලදී ටූනා මසුන් ඉලක්ක කරගත් මරුවැල් පන්නය ආශ්‍රිත මුහුදු කර්මාන්තයේදී මුහුදු පක්ෂීන් පැටලීම සහ එම පන්නයේදී ඉලක්ක කර නොගන්නා (by catch) මසුන් වන මෝරුන් අල්ලා ගැනීම පිළිබඳ තක්සේරු කිරීම් ද පර්යේෂණයට ඇතුළත් වේ. මීට අමතරව, සමුද්‍ර ජෛව විවිධත්වය තක්සේරු කිරීම සඳහා වරාය හා මසුන් ගොඩබෑම් ස්ථාන ආශ්‍රිතව සාම්පල ලබා ගැනීම හා දත්ත ලබා ගැනීම වැනි සාම්ප්‍රදායික සහ සමුද්‍රීය පරිසරයේ අඩංගු වන DNA (eDNA) විශ්ලේෂණය සහ නව්‍ය ක්‍රමවල එකතුවක් මෙම ව්‍යාපෘතිය භාවිතා කරයි. දත්ත රැස් කිරීම වැඩිදියුණු කිරීම සඳහා, මසුන් ගොඩබෑමේ ස්ථානවල අල්ලාගනු ලබන මාළුන්ගේ දිග හා විද්‍යාත්මක දත්ත එක්රැස් කිරීම, නවීන තාක්ෂණය මුසුකොට අන්තර්ජාලය ඔස්සේ දත්ත ගබඩා කිරීම එක්රැස්කිරීම යාවත්කාලීන කර ඇත. මෙම පර්යේෂණයේ සොයාගැනීම් SDG 14.4.1 සහ NDC 3 සඳහා දායක වනු ඇති අතර කලාපීය ධීවර සංවර්ධනය හා පරිපාලනය එමගින් ශක්තිමත් කරනු ඇත.

බේරුවල සහ කල්පිටියෙන් මුහුදු ජල සාම්පලවලින් සහ හලාවත ඉස්සන් වගා භූමිවල ජල සාම්පල මඟින් ලබාගත් නිස්සාරණ වල DNA සාන්ද්‍රණයක් පෙන්නුම් කළ අතර, අනුක ජීව විද්‍යාත්මක පර්යේෂණ වලදී DNA භෂ්ම අනුපිලිවෙල නිර්ණය කිරීම සඳහා metagenomic amplicon sequencing, සඳහා යවා ඇති අතර එය ශ්‍රී ලංකා ජලයේ ජෛව විවිධත්වය නිරීක්ෂණය කිරීමේදී eDNA විශ්ලේෂණය භාවිතා කිරීම සඳහා ප්‍රබල විභවයක් පෙන්නුම් කරයි. කවකාවා (*Euthynnus affinis)* නිදර්ශක දෙකක් සහ රූප විද්‍යාත්මක වෙනස්කම් පෙන්වන ගෘපර් (*Epinephelus faviatus*) සාම්පල 21 ක් අණුක හඳුනාගැනීම සඳහා යවන ලද අතර එමඟින් ගෘපර් විශේෂ හතරක් තහවුරු වූ අතර ශ්‍රී ලාංකික සහ ගෝලීය ගෘපර් DNA දත්ත ගබඩා පුළුල් කිරීමට දායක විය. බටහිර සහ දකුණු වෙරළ තීරයේ සමීක්ෂණය හරහා ටූනා මරුවැල් පන්නය ආශ්‍රිත පක්ෂි පැටලීම් 10 ක් වාර්තා විය. ක්ෂේත්‍ර සමීක්ෂණ මගින් මෝර විශේෂ 13 ක් හඳුනාගෙන ඇති අතර, සිල්කි මෝරා silky shark (48.5%) ප්‍රමුඛ විශේෂය ලෙස හඳුනාගෙන ඇති අතර, පසුව නිල් මෝරා blue shark (26.4%) සහ කෙටි වරල් මාකෝ මෝරා shortfin mako sharks (18.1%); දිග-සංඛ්‍යාත දත්තවලින් පෙනී යන්නේ සිල්කි මෝරුන් silky shark බොහෝ දුරට නොමේරූ බවයි, නමුත් පරිණත නිල් මෝරා blue and කොටි මෝරා tiger sharks ඇතුළත් විය. බහුදින බෝට්ටු ලොග් පත්‍ර සහ ප්‍රකාශිත බෙදා හැරීමේ දත්තවල අඛණ්ඩ විශ්ලේෂණයන් හා සාගර විද්‍යාත්මක පරාමිතීන් සම්බන්ධයෙන් මුහුදු පක්ෂි අන්තර්ක්‍රියා සඳහා විභව ඉහළ අවදානම් කලාප හඳුනා ගැනීම අරමුණු කරයි.

2. ජීවමාන සාගර සම්පත් පිළිබඳ ධීවර ස්වාධීන සමීක්ෂණ (ධ්වනි සහ ට්‍රෝලර්) R/V සමුද්‍රිකා යාත්‍රාව (ශ්‍රී ලංකා නෝර්වේ ද්විපාර්ශ්වික ව්‍යාපෘතිය - (WP3)

වෙරළබඩ ප්‍රදේශවල අධික ලෙස අස්වනු නෙලාගැනීම මෙන්ම මත්ස්‍ය තොග නිරීක්ෂණය කිරීම සඳහා විශ්වාසදායක දත්ත නොමැතිකම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සැලකිය යුතු අභියෝගවලට මුහුණ දෙයි. කුඩා පෙලජික් මත්ස්‍යයන් වැනි ප්‍රධාන විශේෂවල තත්ත්වය අවබෝධ කර ගැනීම සහ තිරසාර කළමනාකරණ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා ධීවර ස්වාධීන සමීක්ෂණ ඉතා වැදගත් වේ.

කුඩා සාමුද්‍රික මසුන් වල බහුලත්වය ඇස්තමේන්තු කිරීම සඳහා NARA හි RV සමුද්‍රිකා යාත්‍රාව විසින් ඊසානදිග, නිරිතදිග සහ වයඹ වෙරළබඩ ජලයේ ධ්වනි සමීක්ෂණ තුනක් සිදු කර ඇත. මෙම සමීක්ෂණ

ichthyoplankton (මාළු කීටයන්) අධ්‍යයනය කිරීම සහ මත්ස්‍ය අභිජනන ස්ථාන හඳුනා ගැනීමට සහ ආරක්ෂා කිරීමට උපකාරී වන සාගර විද්‍යාත්මක පරාමිතීන් මැනීම සඳහා ප්ලවාංග සාම්පල මගින් අනුපූරක වේ. ධ්වනි සොයාගැනීම් වලංගු කිරීම සඳහා සමාන්තර මත්ස්‍ය ගොඩබෑමේ සමීක්ෂණයකද පවත්වන ලදී.

කල්පිටිය ට්‍රෝලර් භූමියේ ඉස්සන් ජෙව ස්කන්ධය සහ ඒ ආශ්‍රිත අතුරු ඇල්ලීමේ විශේෂ නිරීක්ෂණය කිරීම සඳහා අඛණ්ඩව සිව්වන වසරටත් ඉස්සන් ට්‍රෝලර් සමීක්ෂණයක් සිදු කර ඇත. නවතම ප්‍රතිඵලවලින් පෙන්නුම් කරන්නේ පෙර වසරවලට අනුකූලව, ඉස්සන් ප්‍රමාණය අඛණ්ඩව අඩු මට්ටමක පවතින අතර, කාරල්ලා මසුන් වඩාත් සුලභ අල්ලා ගැනීම ලෙස පවතී.

මෙම ස්වාධීන සමීක්ෂණවලින් ජනනය කරන ලද කාල ශ්‍රේණි දත්ත, ජෙව ස්කන්ධයේ සහ බහුලත්වයේ වෙනස්කම් නිරීක්ෂණය කිරීම, අස්වනු නෙලාගැනීමේ මට්ටම පිළිබඳ අවබෝධයක් ලබාදීම සහ අධික ලෙස අස්වනු නෙලාගැනීමට ලක් වූ සම්පත් නැවත ගොඩනැගීමේ උත්සාහයන් මෙහෙයවීම සඳහා ඉතා වැදගත් වේ. අඛණ්ඩ සමීක්ෂණ සහ විශ්ලේෂණයන් අවසන් වූ පසු සවිස්තරාත්මක සොයා ගැනීම් සහ වාර්තා ලබා ගත හැකිය.

3. ශ්‍රී ලංකාව අවට මුහුදු මට්ටම නිරීක්ෂණය

එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමු සම්මුතිය (UNFCCC) සහ තිරසාර සංවර්ධනය සඳහා වූ එක්සත් ජාතීන්ගේ සාගර විද්‍යාවේ දශකය (2021–2030) වැනි ජාත්‍යන්තර කැපවීම්වලට අනුකූලව.වෙරළබඩ උපද්‍රව වලට ගොදුරු වීමේ වැඩි අවදානමක් ඇති දූපත් රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාව, පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති, ආපදා අවදානම් අඩු කිරීම, තිරසාර වෙරළබඩ යටිතල පහසුකම් සංවර්ධනය සහ ප්‍රතිපත්ති සැලසුම් කිරීම සඳහා විද්‍යාත්මක පදනමක් සපයයි.
නාරා ආයතනය දැනට ත්‍රිකුණාමලය, පේදුරු තුඩුව, කොළඹ, මීරිස්ස, දෙවුන්දර සහ හම්බන්තොට යන ප්‍රදේශවල පිහිටි ස්වයංක්‍රීය මුහුදු මට්ටමේ නිරීක්ෂණ මධ්‍යස්ථාන හයක් ක්‍රියාත්මක කරයි (රූපය 1). මුහුදු මට්ටමට අදාළ අනතුරුදායක සිදුවීම් පිළිබඳ මාසික වාර්තා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට (DMC) ඉදිරිපත් කරනු ලබන අතර, මුහුදු මට්ටමේ දත්ත නිෂ්පාදන හැට හතරක් ජාතික සහ ජාත්‍යන්තර පරිශීලකයින් සඳහා නාරා වෙබ් අඩවිය හරහා ලබා ගත හැකිය. සියලුම මධ්‍යස්ථාන නාරා වෙබ් අඩවියට සම්බන්ධ තත්‍ය කාලීන තොරතුරු පද්ධතියකට ඒකාබද්ධ කර ඇති අතර එමඟින් තත්‍ය කාලීන මුහුදු මට්ටමේ දත්ත ග්‍රහණය කර ගැනීම, ගබඩා කිරීම, විශ්ලේෂණය කිරීම සහ බෙදා හැරීමට හැකියාව ලැබේ. මෙම පද්ධතිය ප්‍රවණතා විශ්ලේෂණයන්, ඍතුමය විචලන අධ්‍යයනයන් සහ පර්යේෂණ ප්‍රතිදානයන් සඳහා සහාය වන අතර එමඟින් පර්යේෂකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සාමාන්‍ය ජනතාව සඳහා ප්‍රවේශතාව වැඩි දියුණු කරයි. මීට අමතරව, ස්මාර්ට් ජලජීවී වගා සංවර්ධනයට සහාය වීම සඳහා කලපු පාදක නිරීක්ෂණ මධ්‍යස්ථාන සමඟ උෂ්ණත්වය සහ ලවණතාව නිරීක්ෂණය ඇතුළත් කිරීමෙන් මෙම ජාලය වඩාත් පුළුල් සාගර නිරීක්ෂණ පද්ධතියක් බවට උත්ශ්‍රේණි කිරීමේ ක්‍රියාවලියක NARA නිරත වේ.



රූපය 1: 2006 සිට 2025 අගෝස්තු දක්වා කොළඹ මුහුදු මට්ටමේ කාල ශ්‍රේණියේ සංසන්දනය. නිල් රේඛාව කොළඹ වඩදිය මාපක නිරීක්ෂණ නියෝජනය කරන අතර, මැජෙන්ටා රේඛාව කොළඹ මුහුදු මට්ටමේ නිරීක්ෂණ ස්ථානයට ආසන්නතම ජාලක ලක්ෂ්‍යයේ කොපර්නිකස් සමුද්‍ර සේවා චන්ද්‍රිකා දත්ත පෙන්වයි. කහ පැහැති ඉරි සහිත රේඛාව කාල ශ්‍රේණියේ ප්‍රවණතා රේඛාව පෙන්වයි.

4. දේශගුණික විපර්යාස ශ්‍රී ලංකාවේ සංවේදී වෙරළබඩ පරිසර පද්ධති කෙරෙහි බලපෑම

සාගර ආම්ලිකතාවය නිරීක්ෂණය කරන තිරසාර සංවර්ධන ඉලක්කයේ (SDG) 14.3.1 දර්ශකයේ අවශ්‍යතා සපුරාලීම සඳහා වන පුළුල් ප්‍රයත්නයක කොටසක් වන ශ්‍රී ලංකාවේ වෙරළබඩ පරිසර පද්ධති පිළිබඳ අධ්‍යනයකදී ජලයේ ගුණාත්මක භාවයේ සැලකිය යුතු වෙනස්කම් කල්පිටිය සහ මීගමුව-කොළඹ ප්‍රදේශ අතර නිරීක්ෂණය විය. මෙය පෝෂක සාරවත් බව (nutrient enrichment) ජීව විද්‍යාත්මක ඵලදායීතාවයට බලපාන ආකාරය ඉස්මතු කරයි. දත්ත රැස් කිරීම ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන්හි (NDC) 7 ව්‍යාපෘති සඳහාද සිදු කරන අතර එය IOC-UNESCO සමඟ සහයෝගීව සිදු කෙරේ.

කල්පිටිය ප්‍රදේශයේ පිහිටි කලා ඔය මෝය කට සහ ගඟේ වාඩිය ආශ්‍රිතව ඉහල පෝෂක සාන්ද්‍රණයක් වාර්තා විය. එහිදී සිලිකේට් (Si) 435.55 µg /L දක්වා, පොස්පේට් (P) 21.65 µg /L දක්වා සහ නයිට්‍රයිට් (N) 16.83 µg /L දක්වාද ඉහළ අගයන් දැක්වීය. මෙය අවලම්භන ද්‍රව්‍ය (Total Suspended Solid-TSS) 24.6 mg/L ක් වූ ඉහළ බොරබවක් සහිත තත්වයක් (turbidity) හා මීටර 0.5 ක් වැනි අඩු සෙචී ගැඹුරක් (Secchi depth) සමඟ සම්බන්ධකම් දක්වයි. පෝෂක ගලනය ජීව විද්‍යාත්මක වර්ධනය උත්තේජනය කරන අතර, එය කළපුව තුළ වඩාත් ඉහළම ක්ලෝරෝෆිල්-ඒ සාන්ද්‍රණය (14.50 mg/L) ට හේතු විය. මෙය සමෘද්ධිමත් ශාක ප්ලවාංග (phytoplankton) (171,360 No/m3) සහ සත්ව ප්ලවාංග (zooplankton) (586,807 No/m3) ප්‍රමාණයක් සමඟ අනුරූප විය.

ඊට හාත්පසින්ම වෙනස්ව, මීගමුව-කොළඹ වෙරළ තීරයේ සාමාන්‍යයෙන් අඩු පෝෂක මට්ටම් පෙන්නුම් කෙරිණ. මතුපිට ජලයේ සිලිකේට් (Si) 2.28 සිට 114.09 µg/L; දක්වාද, ක්ලෝරෝෆිල්-ඒ මතුපිට 0.06 සිට 7.91 mg/L දක්වාද විචලනය විය. ශාක ප්ලවාංග 16,985 සිට 1,669,818 No/m3 දක්වාත් පරාසයක පැවතුණි. මෙහි ජීව විද්‍යාත්මක ක්‍රියාකාරීත්වය පැවතුනද, මෙම මට්ටම් වඩාත් පෝෂක බහුල ප්‍රදේශ වලට වඩා වෙනස් විය.

අධ්‍යනය මඟින් අවසන් වශයෙන් නිගමනය කෙරෙන්නේ, ගංගා මෝය සහ කලපු, පෝෂක ආදානය සහ ජීව විද්‍යාත්මක ඵලදායීතාවය සඳහා තීරණාත්මක කලාප වන බවත්, ඒවා සමස්ත වෙරළබඩ පරිසරයේ සෞඛ්‍යයට අත්‍යවශ්‍ය බවත්ය.

5. ඉස්සන් වගාවේ රෝග තත්ත්වයන් නිරීක්ෂණය කිරීම මගින් ලෙඩ රෝග නිසා වන හානි අවම කිරීම සහ ඵලදායී සෞඛ්‍ය කළමනාකරණ උපාය මාර්ග සකස් කිරීම

ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ වගා කලාප පහක (හලාවත, ආරච්චිකට්ටුව, මුන්දලම, කල්පිටිය සහ පුත්තලම) ඉස්සන් ගොවිපලවල් සහ අභිජනනාගාරවල ලෙඩ රෝග පැතිරීම පිළිබඳව සොය බැලීම සඳහා මෙම අධ්‍යනය සිදු කරන ලදී.

මෙම අධ්‍යනයෙන් ලංකාවේ ඉස්සන් වගාවේ බහුලව දැකිය හැකි රෝග අතරින් EHP රෝග තත්ත්වයෙහි සමස්ත ව්‍යාප්තිය ඉහළ මට්ටමක පවතින බවත්, පරීක්ෂා කරනලද සාම්පල වලින් 57.03% ක් EHP පරපෝෂිතයා මගින් ආසාදනය වී තිබුන බවත් තහවුරු කරන ලදී. එමෙන්ම, ලංකාවේ ඉස්සන් වගාවේ WOAH (සත්ව සෞඛ්‍ය සඳහා වන ලෝක සංවිධානය) විසින් ලැයිස්තුගත කර ඇති අනෙකුත් ප්‍රධාන වෛරස් සහ බැක්ටීරියා රෝග වලින් (EHP, IHHN, AHPND, YHV etc.) තොර බවද හඳුනා ගන්නා ලදී.

මෙම අධ්‍යනයෙන් EHP හි ඉහළම ප්‍රතිශතය වන 66.66% ප්‍රතිශතය, කලාප අංක 03 - මුන්දලම ප්‍රදේශයෙන් වාර්තා වූ අතර අනෙකුත් කලාප වල එය 62.5% (හලාවත), 57.5% (ආරච්චිකට්ටුව), 50% (කල්පිටිය) සහ 33.33% (පුත්තලම) ලෙස වෙනස් ප්‍රතිශත වලින් වාර්තා විය. 2025 ජනවාරි සිට අගෝස්තු දක්වා සිදු කරන ලද පරීක්ෂණ වලට අදාලව වයඹ පළාතේ EHP රෝග ව්‍යාප්ති සිතියම රූප අංක 02 හි දක්වා ඇත. ප්‍රධාන ලෙස වගා කරන ලද ඉස්සන් විශේෂ දෙක අතරද මෙම EHP රෝග ව්‍යාප්තියේ සැලකිය යුතු වෙනසක් පවතින බවද මෙම අධ්‍යයනයෙන් සොයා ගන්නා ලදී. *Penaeus monodon* (black tiger shrimp) හා සසඳන විට *Penaeus vannamei* (white leg shrimp) විශේෂයේ EHP ආසාදනය සැලකිය යුතු ඉහළ අනුපාතයක් පෙන්නුම් කළේය. මෙම සොයාගැනීමෙන් පෙනී යන්නේ *P. vanamei* ජලජීවී වගා සැකසුම් තුළ EHP ආසාදනවලට වඩාත් ගොදුරු වන බවත්, එනිසා සියලුම වගා කලාප ආශ්‍රිත ඉස්සන් වගාවන් වඩාත් හොඳින් කළමනාකරණය කිරීම සඳහා වැදගත් වන වගා පුරුදු අනුගමනය කිරීම අත්‍යවශ්‍ය බව මෙම පර්යේෂණයේදී නිරීක්ෂණය විය.



රූපය 1: වයඹ පළාතේ EHP රෝග ව්‍යාප්තිය දැක්වෙන සිතියම

6. ශ්‍රී ලංකාවේ ධීවර ගැටුම්වල සමාජ ආර්ථික, සංස්කෘතික සහ අලෙවිකරණ අංශ

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ඉන්දු - ශ්‍රී ලංකා ධීවර ආරවුලේ සහ කුඩා පරිමාණ ධීවරයින් අතර දේශීයකරණය වූ ගැටුම්වල සමාජ-ආර්ථික සහ සංස්කෘතික බලපෑම් විශ්ලේෂණය කිරීමෙන් ශ්‍රී ලංකාවේ ධීවර ගැටුම් පිළිබඳ දැවෙන ගැටලුව විසඳීමයි. මිශ්‍ර ක්‍රම ප්‍රවේශයක් භාවිතා කරමින්, අධ්‍යයනය යාපනය, මීගමුව සහ හලාවත ධීවර කලාපවල සමීක්ෂණ, අවධානය යොමු කණ්ඩායම් සාකච්ඡා සහ විවිධ පාර්ශවකරුවන් සමඟ සම්මුඛ සාකච්ඡා හරහා දත්ත රැස් කරයි. මේ වන විට, සම්පූර්ණ කරන ලද ප්‍රශ්නාවලිය 250 ක් සහ අවධානය යොමු කණ්ඩායම් සාකච්ඡා 12 ක් සමඟ සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. මූලික සොයාගැනීම්වලින් පෙනී යන්නේ ඉන්දියානු ට්‍රෝලර් යාත්‍රා ආක්‍රමණයන් යාපනය ධීවර දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට ලක් කරන ලද සියලුම ධීවරයින්ට පාහේ බලපාන බරපතලම ගැටළුව බවයි. සියලුම ප්‍රතිචාර දැක්වූවන් (100%) සිවිල් ගැටුම අවසන් වීමෙන් පසු 2009 සිට ඔවුන්ගේ මත්ස්‍ය අස්වැන්න 64.62% කින් පහත වැටී ඇති බව වාර්තා කළ අතර එය දඩයම් කිරීම නිසා ඇති වූ සම්පත් ක්ෂය වීම සමඟ සම්බන්ධ විය. හොඳ ධීවර ස්ථාන සොයා ගැනීම සඳහා ධීවර කාර්ය මණ්ඩලයට බොහෝ දුර ගමන් කිරීමට සිදුවන අතර එමඟින් මෙහෙයුම් පිරිවැය 57.92% කින් ඉහළ ගොස් තිබේ. අධ්‍යයනයෙන් මාසික ධීවර ආදායමේ 64.48% ක පහත වැටීමක් ද වාර්තා වූ අතර සම්පත් හායනය හේතුවෙන් හානි වූ ධීවර ස්ථාන පිළිබඳ නිතර වාර්තා විය. බොහෝ ප්‍රතිචාර දැක්වූවන් වාර්තා කළේ ධීවර ආම්පන්නවලට වැඩි හානියක් සිදුවී ඇති බවත්, ඇස්තමේන්තුගත මූල්‍ය පාඩු වසරකට රුපියල් 311,176 දක්වා ළඟා වන බවත්ය. ඊට අමතරව, ධීවරයින්ගෙන් 45% ක් සතියකට දින හයේ සිට තුන දක්වා තම ධීවර දින අඩු කර ඇති අතර, එමඟින් බරපතල ආර්ථික හා මෙහෙයුම් ප්‍රතිවිපාක පෙන්නුම් කෙරේ. මෙම ප්‍රතිඵල මගින් ශ්‍රී ලාංකික ධීවරයින්ට සමාජ-ආර්ථික බලපෑම් අඩු කිරීම සඳහා ඒකාබද්ධ කළමනාකරණ ප්‍රවේශයන් සහ ඵලදායී ගැටුම් නිරාකරණ යාන්ත්‍රණ සඳහා හදිසි අවශ්‍යතාවය ඉස්මතු කරයි.



රූපය 2: යාපනය දිස්ත්‍රික්කයේ ධීවර කලාපවල නියැදි ස්ථාන

බාහිර ඉල්ලීම් දෙකක් සාර්ථකව විමර්ශනය කරන ලද අතර, තාක්ෂණික වාර්තා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. මේවාට ඇතුළත් වන්නේ:

1. කළුතර දිස්ත්‍රික්කයේ පානදුර වරාය ආශ්‍රිතව ක්‍රියාත්මක කරනු ලබන යාන්ත්‍රක බිලී පිහි කර්මාන්තයේ කළමණාකරණ ගැටළු හඳුනාගැනීම පිළිබඳ අධ්‍යයනය

ශ්‍රී ලංකාවේ පානදුරේ යාන්ත්‍රික බිලී පිහි කර්මාන්තය, අමාත්‍යාංශය විසින් මෑතකදී කරන ලද අධ්‍යයනයකින් හඳුනාගෙන ඇති පරිදි, දැඩි කළමනාකරණ අභියෝගවලට මුහුණ දී සිටී. ප්‍රාථමික ගැටළු අතරට මත්ස්‍ය තොගවල තියුණු 70-80% ක පහත වැටීමක්, ධීවරයින්ගේ නිරීක්ෂණ මත පදනම් වූ ඇස්තමේන්තුවක්, වත්මන් අල්ලා ගැනීම් දශකයකට පෙර ඒවා සමඟ සංසන්දනය කිරීම, වෙරළබඩ මාදැල් මෙහෙයුම් සමඟ නිතර ගැටුම් සහ අවසාදිතකරණය හා සම්බන්ධ පාරිසරික හායනය ඇතුළත් වේ. අවසාදිතකරණය වාර්තා වුවද, වෙරළබඩ සංවර්ධන ක්‍රියාකාරකම් සමඟ එය සෘජුවම සම්බන්ධ කරන කිසිදු සාක්ෂියක් අධ්‍යනයෙන් හමු නොවීය. තවද, අධ්‍යයනයෙන් දේශීය ධීවරයින් අතර සැලකිය යුතු සමාජ-ආර්ථික අවදානම් අනාවරණය විය, එනම් සීමිත මසුන් ඇල්ලීමේ වේලාවන් සහ ඔවුන්ගේ සමාජ සඳහා නිල පිළිගැනීමක් නොමැතිකම. තිරසාර ධීවර කළමනාකරණය සහතික කිරීම සඳහා, ව්‍යාපෘතිය මඟින් ධීවර වේලාවන් දීර්ඝ කිරීම, ධීවර සමිති විධිමත් ලෙස ලියාපදිංචි කිරීම සහ වෙරළ තීරයන් සහ අවසාදිතකරණය පිළිබඳ දැඩි රෙගුලාසි ක්‍රියාත්මක කිරීම ඇතුළු ක්‍රියාකාරී විසඳුම් යෝජනා කරයි. මෙම නිර්දේශ පානදුර ධීවර ප්‍රජාවන්ගේ සම්පත් සංරක්ෂණය සහ වැඩිදියුණු කළ ජීවනෝපායන් සමතුලිත කිරීම අරමුණු කරයි.

2. අප්‍රිකානු වෙළඳපොළට ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අපනයනය: විභවයන්, අභියෝග සහ උපායමාර්ගික දැක්ම

මෙම පූර්ව අධ්‍යයනය මඟින් ශ්‍රී ලංකාව තම මත්ස්‍ය අපනයන අප්‍රිකානු වෙළෙඳපොළට ව්‍යාප්ත කිරීමට ඇති සැලකිය යුතු විභවය ඉස්මතු කරයි, අපනයන විවිධාංගීකරණය කිරීමට සහ වෙළඳපල සාන්ද්‍රණය අඩු කිරීමට උපකාරී වේ. මෙම පර්යේෂණයෙන් පෙනී යන්නේ අප්‍රිකාවේ මාළු සඳහා ඇති ඉල්ලුම, විශේෂයෙන් වියලන ලද සහ ශීත කළ නිෂ්පාදන, ශ්‍රී ලංකාවේ නිෂ්පාදන හැකියාවන් සමඟ සමපාත වන බවයි. ටූනා, ඉස්සන් සහ කකුළුවන් අපනයනය ස්ථාවර කිරීම සඳහා සීෂෙල්ස්, කෝට් ඩි අයිවෝර් සහ ඊජිප්තුව වැනි ජාතීන් සමඟ වෙළඳ සබඳතා ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය ප්‍රධාන සොයාගැනීම් අතර වේ. රුවන්ඩාව සහ නයිජීරියාව වැනි රටවල නව වෙළඳපොළට ප්‍රවේශ වීම සඳහා අභ්‍යන්තර ජල විශේෂ (තිලාපියා, කාප්) සහ මත්ස්‍ය අතුරු නිෂ්පාදනවල අවස්ථා ද මෙම අධ්‍යයනයෙන් හඳුනා ගනී. මෙම අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගැනීම සඳහා, ශ්‍රී ලංකාව නිෂ්පාදනය වැඩි කළ යුතුය, තත්ත්ව පාලනය පවත්වා ගත යුතුය, සහ කලාපීය වෙළඳ සංවිධාන උත්තේජනය කරන අතරතුර ජලජීවී වගාව සඳහා ආයෝජනය කළ යුතුය.

7. උතුරු පළාතේ ජලජීවී වගා පිළිවෙත්වල ශක්‍යතාව සහ ආර්ථික තක්සේරුව

මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ ජලජීවී වගාවේ ආර්ථික කාර්ය සාධනය, වටිනාකම් දාමය සහ සමාජ-ආර්ථික දායකත්වයන් ඇගයීමට ලක් කරනු ලබන්නේ අධික ලෙස භාවිතා කළ ස්වභාවික ධීවර සම්පත් ප්‍රතිසාධනය කිරීම සඳහා තිරසාර විකල්පයක් ලෙසය. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ මුහුදු කැකිරි සහ ඉස්සන් වගාව වැනි ප්‍රධාන පිළිවෙත් කෙරෙහි අවධානය යොමු කරමින්, ගැඹුරු ආර්ථික තක්සේරුවක් සැපයීම, වටිනාකම් දාම සිතියම්ගත කිරීම සහ කර්මාන්තය පිළිබඳ SWOT විශ්ලේෂණයක් පැවැත්වීමයි. මිශ්‍ර ක්‍රම ප්‍රවේශයක් භාවිතා කරමින්, ව්‍යාපෘතිය සමීක්ෂණ, සම්මුඛ සාකච්ඡා සහ අවධානය යොමු කණ්ඩායම් සාකච්ඡා (රූපය 4) හරහා ප්‍රාථමික දත්ත සහ රජයේ වාර්තාවලින් ද්විතීයික දත්ත යන දෙකම රැස් කිරීමයි.

රූපය 3: යාපනය දිස්ත්‍රික්කයේ සමීක්ෂණය අතරතුර පවත්වන ලද අවධානය යොමු කණ්ඩායම් සාකච්ඡා

8. හදිසි පාරිසරික සිදුවීම් සඳහා හේතු (හදිසි මසුන් මියයාම්, ඇල්ගී උඩුමණ්ඩි ඇතිවීම, තෙල් විසිරීමේ) තත්වයන් විමර්ශනය කිරීම සහ ජාතික වැදගත්කමකින් යුතු පාරිසරික ව්‍යාපෘතින් සිදුකිරීම

මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් හදිසි පාරිසරික අවස්ථා සහ ජාතික වැදගත්කමකින් යුතු කඩිනම් ව්‍යාපෘති මත පදනම් වේ. මෙහි ප්‍රධාන කාර්යයන් වූයේ ක්ෂේත්‍ර පරීක්ෂණ (ක්ෂේත්‍ර සාම්පල ලබා ගැනීම, ස්ථානීය මිනුම්, වැදගත් ප්‍රතිපුරක නිරීක්ෂණ සිදු කිරීම, අදාළ පුද්ගලයින් සමඟ සාකච්ඡා කිරීම මඟින් අවශ්‍ය දත්ත රැස් කිරීම පරීක්ෂණ සඳහා අවශ්‍ය සාම්පල එකතු කිරීම (ජලය, අවසාදිත, ඇල්ගී, මත්ස්‍ය), සාම්පල වල රසායනාගාර විශ්ලේෂණය, තාක්ෂණික වාර්තා සම්පාදනය සහ දත්ත විශ්ලේෂණය, තාක්ෂණික රැස්වීම් පැවත්වීම සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීමයි.

මෙම වසර තුළ, පරිසර අධ්‍යයන අංශය මෙම ව්‍යාපෘතිය යටතේ මෙවැනි හදිසි පාරිසරික සිද්ධීන් 11ක් විමර්ශනය කර ඇති අතර, ඒවාට හදිසි පාරිසරික සිදුවීම් 3 ක් සහ ජාතික වශයෙන් වැදගත් සමීක්ෂණ 8 ක් ඇතුළත් වේ. ජාතික වශයෙන් වැදගත් පරීක්ෂණ බොහොමයකට යාපනය සහ මන්නාරම දිස්ත්‍රික්ක ඇතුළු විවිධ කලාප හරහා මෙන්ම වයඹ, බටහිර සහ දකුණු වෙරළබඩ ප්‍රදේශ වල MSC ELSA 03 නැව අනතුරට පත්වීම මඟින් සිදු වූ පාරිසරික හානිය ඇගයීම සිදු කරනු ලැබේ.



රූපය 4: MSC ELSA 3 නෞකාවේ අපද්‍රව්‍ය හේතුවෙන් අපවිත්‍ර වූ වෙරළ බඩ කලාප උඩප්පුව, නයිනතිව් සහ පූන්කුඩතිව්

මෙම ව්‍යාපෘතිය යටතේ මහදිවුල්වැව ප්‍රදේශයේ හදිසි මත්ස්‍ය මරණ සිදුවීමක් 2025 අගෝස්තු මාසයේදී ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) විසින් ජාතික ජලජ සම්පත් පර්යේෂණ සංවර්ධන නියෝජිතායතනය (NARA) වෙත වාර්තා කරන ලද අතර ඒ සම්බන්ධව පරීක්ෂණ සිදු කරන ලදී .

රූපය 5 : හදිසි මසුන් මියයාමේ හේතු අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කරමින්

වගුව 1 : අධ්‍යයනය කරන ලද හදිසි සිදුවීම්		
හදිසි පාරිසරික සිදුවීම්	**හේතු**	**නිර්දේශ**
හදිසි මසුන් මියයාම කුඩාවැව -	යාබද ගොවිපලකින් අනවසර අප ජලය බැහැර කිරීම	ගොවිපල පවත්වාගෙන යාම සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීම සහ අදාල ආයතනයන්හි අඛණ්ඩ අධීක්ෂණය
හදිසි මසුන් මියයාම - මහදිවුල්වැව	ජලයේ ද්‍රාව්‍ය ඔක්සිජන් මට්ටම අඩුවීම සහ පෙව රසායනික ඔක්සිජන් ඉල්ලුම අඩු වීම	ජලාශය දූෂනය වෙන මූලාශ්‍රය හඳුනාගැනීම
මුහුදු කැකිරි වගා බිම් සංවර්ධනය කිරීම සඳහා පලයිතිව් සහ කෞතාරිමුනෙයි මුහුදු ප්‍රදේශයේ වෙරළබඩ ප්‍රදේශයන්හි ශක්‍යතා අධ්‍යනය කිරීම	අදාල ප්‍රදේශයේ ජල තත්ත්වය සහ මුහුදු පතුලේ ජීවත්වන ජීවීන් ඇතුළු පවතින පාරිසරික තත්ත්වය අධ්‍යයනය කිරීම	ව්‍යාපෘතියේ දිගු කාලීන බලපෑම් අධ්‍යයනය කිරීම
MSC ELSA 3 නෞකාව අනතුරට පත්වීම මඟින් සිදු වූ පාරිසරික හානිය ඇඟයීම (යාපනය, මන්නාරම් දිස්ත්‍රික්කය ඇතුළුව වයඹ, බටහිර සහ දකුණු වෙරළබඩ ප්‍රදේශ වල තෝරාගත් ස්ථාන)	නෞකාව අනතුරට පත්වී එහි බහාලුම් වල තිබුණු ප්ලාස්ටික් ඇතුළු රසායනික ද්‍රව්‍ය මුහුදට එකතු වීම	පාරිසරික හානි තක්සේරුව සිදු කරමින් පවතී

2. සංවර්ධන ව්‍යාපෘති

1. **GEBCO ආකෘතිය වැඩිදියුණු කිරීම මගින් සමුද්‍ර පර්යේෂණ, තිරසාර සංවර්ධන ක්‍රියාකාරකම් සහ ජලමිතික ආකෘති නිර්මාණය කිරීම සඳහා ශ්‍රී ලංකා ජල තීරය ආසන්න වෙරළ ප්‍රදේශවල ජලමිතික ආවරණය වැඩි දියුණු කිරීම**

වැලිගම සිට හම්බන්තොට දක්වා ජලමිතික සමීක්ෂණය ජනවාරි මාසයේ ආරම්භ වී මාර්තු ඊසාන දිග මෝසම් සමයේ අවසානය දක්වා පැවතුනි. නිරිතදිග මෝසම් සමය සක්‍රීය වීමත් සමඟ මැනුම් කටයුතු මන්නාරම ප්‍රදේශයට මාරු කරන ලදී. ක්‍රියාකාරී සැලැස්මට අනුව මන්නාරමේ සිට මණ්ඩතිවු දක්වා වෙරළට ආසන්න මුහුදු ප්‍රදේශයේ ජලශාස්ත්‍රීය මැනුම් කටයුතු මැයි මාසයේ සිට ක්‍රියාත්මක වෙමින් පවතී.



රූපය 6 : සිතියම් ගත කරන ලද ප්‍රදේශය - වැලිගම සිට හම්බන්තොට දක්වා (වම) සිතියම් ගත කරන ලද ප්‍රදේශය - තලෙයි මන්නාරමේ සිට මණ්ඩතිවු දක්වා (දකුණ)

2. **කළු ගං මෝය ආශ්‍රිතව වැලි බාධක කඩා වැටීම හේතුවෙන් ගංගා සහ වෙරළබඩ මුහුදු පතුලේ සිදුවන රූප විද්‍යාත්මක වෙනස්කම් පිළිබඳ ඒකාබද්ධ තක්සේරුව, ජලමිතිය, වෙරළ පැතිකඩ, GIS සහ දුරස්ථ සංවේදනය භාවිතා කිරීම**

චන්ද්‍රිකා රූප සැකසීම අවසන් කර ඇති අතර, ඩ්‍රෝන සහ මිනිසුන් රහිත මතුපිට යාත්‍රා භාවිතයෙන් ලබා ගන්නා ලද දත්ත සමීක්ෂණ අවසන් කර ඇත. වෙරළ පැතිකඩ සමීක්ෂණය දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඊළඟ ක්ෂේත්‍ර වැඩසටහන 2025 ඔක්තෝබර් මාසයේදී පැවැත්වීමට නියමිතය.



රූපය 7 : මිනිසුන් රහිත මතුපිට වාහනයක් සහ ඩ්‍රෝන යානයක් භාවිතා කරමින් කළු ගඟේ මෝය කටේ ජලමිතික සමීක්ෂණ.

අතිරේක මැනුම් කටයුතු සහ සිතියම්කරණ කටයුතු;

1. ලන්දේසි ඇළ මැනුම් කටයුතු (මුන්දල් වැවේ සිට පුත්තලම කලපුව දක්වා - ධීවර අමාත්‍යාංශය සඳහා)
2. MV Wan Hai 503 නෞකාව හේතුවෙන් සිදුවන පාරිසරික හානි තක්සේරුව පිළිබඳ ක්ෂේත්‍ර කටයුතු සහ GIS සිතියම් නිෂ්පාදනය කිරීම
3. පොල්වත්ත ගඟ ආශ්‍රිත මැනුම් කටයුතු (දකුණු පළාතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව)
4. යෝජිත නාවික ගමන් මාර්ගය සඳහා වැලිගම, කප්පරතොටහි ජලගාස්ත්‍රීය මැනුම් කටයුතු (ධීවර දෙපාර්තමේන්තුව)
5. මිරිජ්ජවිල මත්ස්‍ය ගොඩබෑමේ ස්ථානයේ වැලි අවහිරතා සහ නිස්සාරණය පිළිබඳ GIS සිතියම් සහ පරිමාමිතික විශ්ලේෂණ කටයුතු
6. ඔලුවිල් වරායේ GIS විශ්ලේෂණය සහ සිතියම් සැකසීමේ කටයුතු

- 2013 සිට 2024 දක්වා රොන්මඩ සහිත තැන්පත් වී ඇති පරිමාව ගණනය කිරීම
- යෝජිත වරාය පිවිසීමේ මාර්ගයේ ඉවත් කළ යුතු වැලි පරිමාව ගණනය කිරීම
- රොන්මඩ තැන්පත් වීම පිළිබඳ තක්සේරු කිරීම

7. පලාතිව් මුහුදු කුඩැල්ලන් වගාවේ ශක්‍යතා අධ්‍යයනය සඳහා මූලික සිතියම් සැකසීම
8. වෙරළබඩ කලාපයට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශයේ ඛනිජ වැලි නිස්සාරණය සඳහා GIS සිතියම් සැකසීම
9. CEB සඳහා ඉහළ කොත්මලේ බලාගාරයේ තලවකැලේ ජලාශයේ ජලගාස්ත්‍රීය මැනුම් කටයුතු
10. CEB සඳහා නිල්ලඹේ ජලාශයේ ජලගාස්ත්‍රීය මැනුම් කටයුතු
11. ගැටළු: සැලසුම් කළ පරිදි සමුද්‍රිකා යාත්‍රාවේ අළුත් වැඩියා කටයුතු සිදු කරමින් තිබීම හේතුවෙන් පළමු කාර්තුවේ දී එය සැලසුම් කළ පරිදි මැනුම් කටයුතු සඳහා භාවිතා කිරීමට නොහැකි විය.
12. "තරංගා" බෝට්ටු එන්ජිම සහ කුඩා බෝට්ටුවේ "බාර් රීල්" අලුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතී.

3. වෙරළ ආසන්න අවසාදිත ගතිකත්වය සහ බර ඛනිජ තැන්පතු පැතිරීම: ශ්‍රී ලංකාවේ නිරිතදිග වෙරළ තීරය සහ තෝරාගත් වරායන් සඳහා තිරසාර වෙරළ ආරක්ෂාව සහ ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රමාණාත්මක ඇගයීම

බර ඛනිජ සංචිත කෙරෙහි අවධානය යොමු කරන ලද පළමු අධ්‍යයනයෙන් ඉල්මනයිට්, ගාර්නට් සහ මොනසයිට් සැලකිය යුතු සාන්ද්‍රණයක් (3%-35%) නිරිතදිග වෙරළබඩ කලාපයේ විශේෂයෙන් බේරුවල ප්‍රදේශයෙන් සොයා ගන්නා ලදී කෙසේ වෙතත්, ඔලුවිල් සහ කිරින්ද වරායෙන් හැරූ අවසාදිතවල බර ඛනිජ ප්‍රමාණය සාමාන්‍යයෙන් අඩු විය. එසේ තිබියදීත්, වරායන් දෙකම, ගැඹුරු ස්ථරවල ඛනිජ සාන්ද්‍රණය වැඩිවීමත් සමඟ (කිරින්දෙහි 6% දක්වා) යහපත් ලකුණු පෙන්නුම් කළේය. කැණීම්වල ආර්ථික ශක්‍යතාව සම්පූර්ණයෙන් තක්සේරු කිරීම සඳහා වටිනා දුර්ලභ පෘථිවි මූලද්‍රව්‍ය (REEs) සඳහා වැඩිදුර විශ්ලේෂණයක් අවශ්‍ය බව අධ්‍යයනය යෝජනා කරයි.

බටහිර වෙරළ තීරයේ වෙරළබඩ අවසාදිත අයවැය විමර්ශනය කරන ලද දෙවන අධ්‍යයනයෙන් හෙළි වූයේ මිනිස් ක්‍රියාකාරකම් වෙරළ අස්ථාවරත්වයට ප්‍රධාන හේතුවක් බවයි. කොළඹ ජාත්‍යන්තර මූල්‍ය නගරය (CIFC) ගොඩකිරීම මගින් ජල ගතික වෙනස්කම් සහ තරංග සෙවනැලි, අවසාදිත ප්‍රවාහනයට බාධා සහ බාදනය වීමට හේතු වන බව මූලික ආකෘතීන් පෙන්වා දෙයි. අක්වෙරළ වැලි ගොඩදැමීමේ බලපෑම් වෙනස් වන අතර, එය පිටිපන වැනි ප්‍රදේශවල රළ නිරාවරණය වැඩි කර ඇත. ප්‍රධාන සොයාගැනීමක් වන්නේ ගංගාවේ අවසාදිත සැපයුමේ නාටකාකාර පහත වැටීමයි; නිදසුනක් වශයෙන්, මහඔය ගංගාවේ වාර්ෂික වැලි ප්‍රමාණය 0.05 සිට 0.01 mcm/වසරකට අඩු වී ඇති අතර, මෙම හිඟය පුළුල් වෙරළ බාදනය සඳහා ප්‍රධාන සාධකයක් ලෙස හඳුනාගෙන ඇත. මෙම සොයාගැනීම් මත පදනම්ව තිරසාර වෙරළ කළමනාකරණ උපාය මාර්ගවල අවශ්‍යතාවය පර්යේෂණය මගින් ඉස්මතු කරයි.

4. අභ්‍යන්තර මිරිදිය ජලජීවී අංශයේ සංවර්ධනය සඳහා නව්‍ය තාක්ෂණයන් යොදා ගැනීම.

මෙම පර්යේෂණය මගින් පරිසර දූෂණය අඩු කරන අතරතුරම ජලජීවී වගා ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා භාවිතාකළ හැකිනව ක්‍රමවේද දෙකක් කෙරෙහි අවධානය යොමු කරනු ලැබීය. ඒ අනුව පළමු ව්‍යාපෘතියට ගප්පි මසුන් සඳහා බයෝ ෆ්ලොක් පද්ධතියක් වැඩිදියුනු කිරීම ඇතුළත් වන අතර, එහිදී ගප්පි මසුන්ගේ ප්‍රජනන කාර්ය සාධනය ඇගයීම සඳහා මූලික අත්හදා බැලීම් සිදුවෙමින් පවතී (රූපය 9). ගප්පි මසුන්ගේ පෝෂණ කාර්යක්ෂමතාව අධ්‍යයනය කිරීම, ප්‍රශස්ත තොග ඝනත්වය තීරණය කිරීම පිළිබඳ අත්හදා බැලීම් සඳහා අවශ්‍ය සාදක සැලසුම් කිරීම සිදු කෙරෙමින් පවතී. ඒ සමඟම, ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වය සහ සමස්ත ජලයේ ගුණාත්මකභාවය කෙරෙහි විවිධ සාදකවල බලපෑම සොයා බැලීම සඳහා ප්‍රතිචක්‍රීකරණ පර්යේෂණ ජලජීවී වගා පද්ධති (RAS) දෙකක් සංවර්ධනය කරමින් පවතී.

රූපය 8 : ගප්පි පුභේද සඳහා පෙව ෆ්ලොක් වගා අත්හදා බැලීම්

දෙවන පර්යේෂණ සංරචකය දැනට දත්ත රැස් කිරීමේ අදියරේ පවතින අතර, ශ්‍රී ලංකාවේ බහු වාර්ෂික වාරිමාර්ග ජලාශවල වගා පාදක ධීවර කර්මාන්තයේ අස්වැන්නට බලපාන සාධක විමර්ශනය කරයි. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා පර්යේෂකයන්, තෝරාගත් ධීවර ප්‍රජාවන් සමඟ සම්මුඛ සාකච්ඡා හරහා සමාජ-ආර්ථික තොරතුරු රැස් කරමින් සිටී. මීට අමතරව, මෙම ප්‍රජාවන්ගේ ආයතනික ශක්තිමත්භාවය සහ සම-කළමනාකරණ තත්ත්වය පිළිබඳ තීරණාත්මක හා ගුණාත්මක දත්ත රැස් කිරීම සඳහා ග්‍රාමීය සහභාගීත්ව ගැමි පිවිසුම් කිහිපයක් (PRA) පවත්වා ඇත.

ජලජ ශාක වගා කිරීම සහ ජලජ ශාක විශේෂ නිවැරැදිව හඳුනාගැනීම සඳහා ජානමය විශ්ලේෂණ ක්‍රමවේදයන් දියුණු කිරීම සඳහා පර්යේෂණ කටයුතු කිහිපයක් සිදුවෙමින් පවතී. එක් ක්‍රියාකාරකමකදී, *Microsorum pteropus* සහ *Anubias barteri var nana-petite* වගා කිරීම සඳහා ජලජ පස භාවිතා කිරීමට අදාළ මූලික අත්හදා බැලීම්වලින් හඳුනාගන්නා ගන්නා ලද්දේ 10 mm සහ 15 mm ප්‍රමාණයේ ජලජ පස ශාක වර්ධනය වැඩි දියුණු කරන බවත්, සුදුසුම මාධ්‍යය සොයා ගැනීම සඳහා තවදුරටත් අත්හදා බැලීම් කිරීම අවශ්‍ය බවත්ය. *Anubias nana* 'Golden' සහ *Anubias barteri var* සඳහා ක්ෂුද්‍ර ප්‍රචාරණ ශිල්පීය ක්‍රම සංවර්ධනය කිරීම කෙරෙහි වෙනම ව්‍යාපෘතියක් මගින් අවධානය යොමු කර ඇත. *Coffeefolia* ශාකය පටක රෝපණය සඳහා අවශ්‍ය, විෂබීජහරණ ප්‍රොටෝකෝල සම්පූර්ණ කර ඇති අතර අංකුර ජනනය ආරම්භ කිරීම සහ වැඩිකිරීම සඳහා ප්‍රශස්ත මාධ්‍ය හඳුනා ගැනීම සඳහා අත්හදා බැලීම් සිදුවෙමින් පවතී (රූපය 10). ඊට සමගාමීව, තුන්වන ක්‍රියාකාරකම ලෙස DNA තීරු කේතනය (DNA barcoding) මත කේන්ද්‍රගත වී ජලජ ශාක විශේෂ නිවැරැදිව හඳුනාගැනීමට ජානමය විශ්ලේෂණ ක්‍රමවේදයන් දියුණු කිරීම සිදු කරමින් පවතින අතර සඳහා, ක්ෂේත්‍ර සාම්පල එකතු කර, සාර්ථකව DNA නිස්සාරණ ප්‍රොටෝකෝල වැඩි දියුණු කර ඇති අතර, *Cryptocoryne beckettii* සහ *Cryptocoryne wendtii* යන ජලජ ශාක විශේෂ දෙකක් ජානමය වශයෙන් හඳුනා ගැනීම සඳහා PCR අත්හදා බැලීම් ආරම්භ කර ඇත

Figure 10: Shoots of *Anubias nana* 'Golden'

5. ශ්‍රී ලංකාවේ කිවුල් දිය ජලජීවී වගා අංශ විවිධාංගීකරණය සහ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම.

පර්යේෂණ සොයාගැනීම් වලට අනුව ශ්‍රී ලංකාවේ තිරසාර ජලජීවී වගාව සඳහා සැලකිය යුතු ප්‍රගතියක් සහ විභවයක් සාමූහිකව ඉස්මතු කරන සුවිශේෂී ක්‍රියාකාරකම් තුනක් සිදු කර ඇත. මේ අතරින් පළමු ක්‍රියාකාරකම ලෙස උතුරු පළාතේ වලෙයිපාඩු, අරියාලෙයි සහ මණ්ඩතිව් යන නියමු ස්ථාන තුනක ඒකාබද්ධ සමෝධානික ජලජීවී වගාව (IMTA) සඳහා ආකෘති සාර්ථකව සංවර්ධනය කර ක්‍රියාත්මක කරන ලදී. මාස හයක පර්යේෂණ දත්ත වලින් ධනාත්මක ඒකාබද්ධ සමෝධානික ජලජීවී වගාව කළහැකි බව නිරීක්ෂණය විය. මුහුදු පැලෑටි ඉහළ වර්ධන අනුපාත පෙන්නුම් කළ අතර මුතු බෙල්ලන් ඒකීය වගාවට සාපේක්ෂව ඒකාබද්ධ පද්ධතිවල වැඩි ජීව්‍ය අනුපාතයක් පෙන්නුම් කළේය. මෙම වැඩිදියු

කළ ආකෘතිය වගා කරන ලද එම ජීවී විශේෂ වල පැවැත්මට සහ වර්ධනයට සහය වනවා පමණක් නොව, ගොවීන් මේ සම්බන්ධයෙන් දැඩි උනන්දුවක් දක්වන නිසාවෙන් ශක්‍ය ජීවනෝපාය විවිධාංගීකරණ උපාය මාර්ගයක් ලෙසටද ඉදිරිපත් කල හැකිය.

දෙවන ක්‍රියාකාරකම ලෙස ආටෙමියා වගාව කෙරෙහි අවධානය යොමු කළ අතර, දේශීය ආටීමියා විශේෂ භාවිතා කිරීමට වැඩි විභවයක් ඇති බව සොයා ගන්නා ලදී. දේශීය සහ ආනයනික (Red TOP®) ආටීමිය විශේෂ වල ආරම්භක ප්‍රමාණයන් සමාන වුවද, දේශීය ආටීමියා සැලකිය යුතු ලෙස ඉහළ පැවැත්මේ අනුපාතයක්, වඩා හොඳ වර්ධනයක් සහ වේගවත් පරිණතභාවයක් පෙන්නුම් කළේය. මෙම ලක්ෂණ වල යෝග්‍යය බව නිසා දේශීය පරිසරයට වඩා හොඳින් අනුවර්තනය වීමට හේතුවී ඇති අතර, විශේෂයෙන් ලවණතාවයට ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ දේශීය ආටීමිය විශේෂ වලට ඇති යෝග්‍යය තාව පිළිබඳ වැඩිදුර පර්යේෂණ, ජලජීවී වගාවේ සාර්ථකත්වය ඉහළ නැංවීමට අවශ්‍ය වනු ඇත.

අවසාන වශයෙන්, තුන්වන ක්‍රියාකාරකමට ආහාර සඳහා බෙල්ලන් වගාව සඳහා ප්‍රධාන සැලැස්මක් සැකසීම කොළ බෙල්ලන් සහ ගුණාත්මක (green mussels) අභිජනනය සඳහා ක්‍රියාවලියක් සැකසීම ඇතුළත් විය. වෙරළබඩ ජලයේ තිරසාර කොළ බෙල්ලන් වගාව සඳහා පුළුල් ප්‍රධාන සැලැස්මක් සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මෙයට ස්ථාන තෝරා ගැනීම සඳහා ආකෘතියක් සැලසුම් කිරීම සහ බෙල්ලන් වගාව සඳහා සුදුසු ප්‍රදේශ සිතියම්ගත කිරීම ඇතුළත් වේ. මේ සමගම, මහා පරිමාණ වගා මූලපිරීම් සඳහා සහාය වීම සඳහා ගුණාත්මක බීජ සැපයුමක් සහතික කිරීම සඳහා කොළ බෙල්ලන් (*Perna viridis*) අභිජනනය සඳහා ප්‍රමිතිගත ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමද සිදුකෙරේ. සුදුසු ස්ථාන හඳුනා ගැනීම සඳහා මීගමුව කලපුව සහ ගාල්ල වෙරළබඩ ජලයේ ජීව විද්‍යාත්මක හා පාරිසරික සමීක්ෂණ පවත්වන ලදී. ඒ සමඟම, අභිජනනාගාරයක කොළ බෙල්ලන් අභිජනනය කිරීමේ උත්සාහයන් අභියෝගවලට මුහුණ දුන් අතර, බිත්තර දැමීමේ උත්සාහයන් පහක් අසාර්ථක විය. අනාගත අත්හදා බැලීම් සඳහා පැටවුන් තොගය නඩත්තු කරනු ලබන අතර, ස්ථාන තේරීමේ සමීක්ෂණවලට අනුපූරකව සාර්ථක ටැංකි තුල අභිජනන ශිල්පීය ක්‍රම ස්ථාපිත කිරීමට අඛණ්ඩ උත්සාහයන් කරනු ලැබේ.

6. මුහුදුබඩ ධීවර කර්මාන්තය ඉහල නැංවීම සහ වැඩිදියුණු කිරීම සහ සහ මත්ස්‍ය ඒකරාශී කිරීමේ උපකරණ (FAD) ස්ථාපනයන් හරහා

මෙම ව්‍යාපෘතිය යටතේ, මුහුදු පතුලේ කෘතිම වාසස්ථාන සහ මුහුදු ජලය මත පාවෙන මසුන් එකතු කිරීමේ උපාංගයක් (FAD) (රූපය 11) සඳහා වඩාත් උචිත ස්ථාන තේරීම සම්පූර්ණ කර ඇත. මෙය තීරණාත්මක මුල් පියවරක් වන අතර, එය සමස්ත ව්‍යාපෘතිය සඳහා භෞතික ස්ථාන තීරණය කරයි. තෝරාගත් ස්ථානවල පුළුල් දත්ත රැස් කිරීමෙන් පර්යේෂකයන් මූලික පදනමක් ස්ථාපිත කර ඇත. මසුන් සහ ජලවාංග පිළිබඳ ජීව විද්‍යාත්මක තොරතුරු මෙන්ම ද්‍රාවිත ඔක්සිජන්, ලවණතාව සහ pH අගය වැනි භෞතික රසායනික පරාමිතීන් පරාසයක් ද ඇතුළුව පරාමිතීන් මේ වනවිට රැස්කරගෙන ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා, ස්ථාන තුනක් තෝරා ගන්නා ලදී: ත්‍රිකුණාමලය, කල්පිටිය සහ මීගමුව. මීගමුවේ, පාවෙන මාළු එකතු කිරීමේ උපාංගයක් (FADs) සහ ජලයෙන් යට වූ මුහුදු පතුල මත ඉදිකරන මාළු එකතු කිරීමේ අටවුම් (FADs) යන දෙකම යෙදවීම සඳහා ස්ථාන දෙකක් තෝරාගෙන ඇත. ඒ හා සමානව, ත්‍රිකුණාමලය සහ කල්පිටියේදී, ශ්‍රී ලංකාව සඳහා විදේශ විනිමය උත්පාදනය කිරීමේදී සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන සමුදුර විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ වර්ධනයට සහාය වීම සඳහා ජලයෙන් යට වූ මසුන් එකතු කිරීමේ උපාංග යොදවනු ලැබේ. මෙම මත්ස්‍ය ඇටවුම් භෞතික ඉදිකිරීම් සහ යෙදවීමේ කටයුතු CEYNOR පදනම විසින් නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් හරහා සිදු කරනු ලැබේ.

රූපය 9 : FAD යෙදවීමේ වැඩසටහන සඳහා තෝරාගත් ස්ථාන (කල්පිටිය, මීගමුව සහ ත්‍රිකුණාමලය)

7. පරිසර අධ්‍යයන අංශයේ රසායනාගාරය ISO 17025: 2017 ප්‍රතීතනය ලබාගැනීම සඳහා සංවර්ධනය කිරීම.

පරිසර අධ්‍යයන අංශ රසායනාගාරය (ESDL) ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමේ පරාමිතීන් වන pH, ද්‍රාව්‍ය ඔක්සිජන් ප්‍රමාණය (DO), ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම (BOD) , රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) , Nutrients, හරිතප්‍රද (Chlorophyll-a), තෙල් සහ ග්‍රීස් (Oil & Grease) කැළඹිලි බව (Turbidity), ලවණතාව (Salinity) සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOPs) සංවර්ධනය කර එය සම්මත රසායනාගාර ප්‍රමිතීන් (APHA, 2017) අනුකූලව සකසන ලදී. පරිසර විද්‍යා අංශයේ විද්‍යාඥයින් සහ පර්යේෂණ සහායකයින් සඳහා රසායනාගාර පිලිපැදිය යුතු ආරක්ෂක ක්‍රියාවන් පිළිබඳ පුහුණු වැඩ සටහන්, ක්ෂුද්‍රජීව විද්‍යා ක්‍රම සත්‍යාපනය (ISO 16140) සහ තත්ත්ව පාලනය පිළිබඳ පුහුණුව ලබා දෙන ලදී. අමතරව කාර්මික තාක්ෂණික ආයතනය (ITI) මඟින් සංවිධානය කරන ලද ප්‍රවීණතා පරීක්ෂණය (Proficiency Testing) සිදු කරන ලදී. තවද, උපකරණ ප්‍රසම්පාදනය සම්පූර්ණ කිරීම, ක්‍රමාංකනය අවසන් කිරීම, අභ්‍යන්තර පුහුණුව අඛණ්ඩව පවත්වාගෙන යාම, සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විට සිදුවෙමින් පවති.

8. ශ්‍රී ලංකාවේ දකුණු, නැගෙනහිර සහ උතුරු පළාත්වල විහව ජලජීවී විශේෂයන් පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධනය

මිරිදිය විසිතුරු මත්ස්‍ය වගාව සිදු කරනු ලබන ගොවින් සඳහා නව මත්ස්‍ය ප්‍රභේද වර්ග 6 ක් හඳුන්වාදීම සිදු කරන ලදී. මෙයට සමගාමීව ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් ආදායම් උත්පාදනය සඳහා නව සම්පතක් ලෙස මිරිදිය ජලජ ශාක හඳුන්වා දෙන ලදී. දික්වැල්ල, කොග්ගල සහ ගාල්ල යන ප්‍රදේශ වල සිටින පුද්ගලයන් 30 දෙනෙකු සඳහා මොලුස්කා වගාව හඳුන්වා දීමේ අරමුණින් මුල් අවධියේ මොලුස්කවන් එකතු කිරීම (Spats collection) සඳහා නවීන ක්‍රම හඳුන්වාදීම හා ඔවුනට අනාගතයේදී මොලුස්කා වගාව (mollusk culture) සිදු කිරීමට ඇති හැකියාව පිළිබඳව හඳුන්වාදීම සිදු කරන ලදී. කරවල සහ උම්බලකඩ නිශ්පාදනයේදී ඉවත් කෙරෙන අපද්‍රව්‍ය කළමණාකරණයට විසඳුම් සෙවීම සඳහා ඒ ආශ්‍රිත ප්‍රජා පවුල් 100 ක් පමණ සම්බන්ද කරගන්න ලද අතර එම අපද්‍රව්‍ය වලින් විසිතුරු මත්ස්‍යන් හා අනෙකුත් මත්ස්‍ය ආහාර සැකසීම සඳහා අමුද්‍රව්‍යක් ලෙස භාවිත කිරීම සහ පොල් වගාවේ පොහොර සඳහා ආකලන ද්‍රව්‍යක් ලෙස භාවිතයට ගැනීමට ඇති හැකියාව සම්බන්දයෙන් , සිදු කළ හැකි ප්‍රධාන නිශ්පාදන දෙකක් හදුනා ගන්න ලදී. රැකව කලපුවේ ඉස්සන් (*P. monodon*) පැටව් මිලියන 2.75 ක් පමණ ස්තාපිත කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී. මෙම වැඩ සටහන යටතේ ප්‍රතිලාභී පවුල් ගණන 150 ක් පමණ වේ. අපජලය පිරිපහදු කිරීමේ ව්‍යාපෘතියක් ලෙස, විසිතුරු මත්ස්‍ය වගාවෙන් ඉවත් කෙරෙන අප ජලය තුල ඇසොල්ලා සහ ඩක් වීඩ් නැමති පලැටි වගා කිරීම සිදු කරන ලදී. පසුව එම පැලැටි විසිතුරු මත්ස්‍ය අහාර සැකසීම සඳහා නයිට්‍රජන් බහුල අමුද්‍රව්‍යක් ලෙස යොදා ගන්නාලදී. මුහුදු පැලැටි භාවිතා කර ජලජ පැලැටි වගාව සඳහා දියර පොහොර නිශ්පාදනය සිදු කරන ලදී.

9. විසිතුරු මත්ස්‍ය කර්මාන්තය හා මත්ස්‍ය ආහාර නිෂ්පාදනය දියුණු කිරීම

නාරා ආයතනයේ පනාපිටිය ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානය මත්ස්‍ය ආහාර වල ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා පර්යේෂණ මාලාවක් සිදු කරන ලදි. ශ්‍රී ලංකාවේ වාණිජ ජලජීවී වගාව වැඩි වශයෙන් ආනයනික මත්ස්‍ය ආහාර මත යැපෙන අතර, මේ සඳහා විදේශ විනිමය වැයවේ. දේශීය මත්ස්‍ය ආහාර නිපදවීමට ප්‍රධාන ගැටළුව වන්නේ, තත්වයෙන් උසස් මාංශමය ප්‍රෝටීන ප්‍රභවය වන මාළු කුඩු (fishmeal-FM) වල මිල අධික වීම හා සැපයුම තිරසාර නොවීමයි. මෙයට විකල්පයක් ලෙස ලොව හදුනාගත් ප්‍රධානතම විකල්පය වන්නේ කෘමී ප්‍රෝටීන (insect meal) වන අතර, මෙම මධ්‍යස්ථානය මඟින් කළු හමුදා කුරුමිණි කීටයා (black soldier fly larvae- BSF) යොදාගෙන පරීක්ෂණ කිපයක් සිදු කරන ලදි.

ප්‍රථම පරීක්ෂණයේදී ජීන්ටි තිලාපියා ඇසිත්තන් ආහාර සඳහා FM වෙනුවට BSF හා මාළු අවශේෂ (fish silage -FS) සාර්ථකව යොදා ගත හැකි බව තහවුරු කර ගන්නා ලද අතර BSF : FS අනුපාතය 4:1 බව හඳුනා ගන්නා ලදී. ගප්පි මසුන් ආශ්‍රයෙන් සිදු කරන ලද දෙවන පරීක්ෂණයේදී BSF තෙල්, මාළු තෙල් හා අනෙකුත් සාම්ප්‍රධායික තෙල් වර්ග වන සෝයා තෙල් හා පොල් තෙල් වලට විකල්පයක් ලෙස යොදා ගත හැකි බව තහවුරු කර ගන්නා ලදි.

නැනෝ තාක්ෂණය ලෝකයේ සෑම අංශයකම ප්‍රගමනය සඳහා යොදා ගෙන ඇත. ශ්‍රී ලංකාවේ එය අවම ලෙස ප්‍රායෝගිකව භාවිතා වේ. මේ අනුව තුන්වන පරීක්ෂණයේදී ප්ලේටි මසුන්ගේ වර්ධනය හා වර්ණය නැනෝ Zn මඟින් මසුන්ගේ වකුගඩු වලට කිසිඳු අයහපත් බලපෑමකින් තොරව ඉහල නැංවිය හැකි බව හඳුනා ගන්නා ලදි.

Figure 2. Adult Male Yellow Sunset Guppy (*Poecilia reticulata*)

Figure 7.Liver weight and Fish Length measurement of fish to calculate HSI and ILI Indexes.



Figure 26. Representative histological images of liver tissue sections from *Xiphophorus maculatus* (Mickey Mouse Platy) under different dietary treatments

Figure 8.Total Carotenoid Test Procedure

රූපය 10 : මාළුන්ගේ අක්මාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ Histopathological විද්‍යාත්මක

3. සංරක්ෂණ ව්‍යාපෘති

1. ශ්‍රී ලංකාවේ තෝරාගත් කලපු දෙකක මත්ස්‍ය හා ජලජ ජීවීන් සඳහා කලපු ජල තත්ත්ව මාර්ගෝපදේශයක් සංවර්ධනය කිරීම: හලාවත සහ කොග්ගල

හලාවත සහ කොග්ගල කලපු පිලිබඳ අධ්‍යයනයට සැලකිය යුතු මට්ටමේ පාරිසරික පීඩන හේතුවෙන් විවිධ ආකාරයේ දූෂණයට හා හායනයකට ගොදුරුවීමෙන් ඇති බව අනාවරණය වේ. හලාවත කලපුවෙහි අධ්‍යයන අනුව ජල ගුණාත්මක භාවයේ සැලකිය යුතු අවකාශීය වෙනසක් අනාවරණය වූ අතර, ජලජීවී වගා කලාප සහ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථාන අසල පෝෂක මට්ටම් විශේෂයෙන් ඇමෝනියා නයිට්‍රජන් සහ නයිට්‍රේට්- නයිට්‍රජන්) ඉහළ අගයක් නිරීක්ෂණය විය. ජල ද්‍රාව්‍ය ඔක්සිජන් සාන්ද්‍රණය (5.3 ± 0.5 සිට 7.8 ± 0.5 mg/L දක්වා) ජලජ ජීවීන් අදාල නිර්දේශිත පරාමිතීන් අතර පැවතුනි. pH අගය (7.267 ± 1.523 සිට 8.105 ± 3.04) දක්වා පරාමිතියක පවතින බව අණාවරණය විය. නයිට්‍රේට්, නයිට්‍රජන් සාන්ද්‍රණයන් (0.0104 ± 0.0039 සිට 0.0278 ± 0.0296 mg/L) සහ ඇමෝනියා පරාසයක පවතින බව නිරීක්ෂණය විය. නයිට්‍රජන් මට්ටම් (0.0041 ± 0.001 සිට 0.0938 ± 0.0037 mg/L) හරිතප්‍රද සාන්ද්‍රණයන් (2.5 ± 1.5 සිට 8.2 ± 1.4 µg/L) පරාසයක පැවතුණි. ශාක සහ සත්ත්ව ප්ලාවාංග විශ්ලේෂණ ප්‍රතිපල වලට අනුව ඩයටම් (92.8%)සහ සත්ත්ව ප්ලාවාංග (කොපිපෝඩාවන්) 88.3% වාර්තා විය. කොග්ගල කලපුවෙහි අධ්‍යයනයට අනුව සාමාන්‍ය භෞතික රසයනික පරාමිතීන් වන pH (7.7 ± 0.2) සහ ද්‍රාව්‍ය ඔක්සිජන් (6.71 ± 0.77 mg/L) ස්ථාවර මෙන්ම හිතකර අගයන් වල පැවතියද, අඛණ්ඩ පරිසර දූෂණ තර්ජන වලට මුහුණ දීමෙන් ඇත. එනම්,කලපුවෙහි තෝරාගත් ස්ථාන සියල්ලෙහිම ජලය මිනිස් මළ අපද්‍රව්‍ය මගින් දූෂණය වී ඇති බව පැහැදිලි විය. (0 - >1,800 MPN/100 mL). තවද, මත්ස්‍ය සාම්පලහි බැර ලෝහ සාන්ද්‍රණය (ආසනික් (As 0.2 - 2.7 mg/kg) (ලෙඩ් Pb 0.05 - 0.17 mg/kg)) සම්මත ධාරණ සීමාවන්ට අනුව ඉහල අගයන් වාර්තා විය. මෙම අධ්‍යයන දෙකෙහිම ප්‍රතිපල අනුව කලපු කළමනාකරණයට ඒකාබද්ධ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සහ නිශ්චිත ජල තත්ත්ව මාර්ගෝපදේශ අත්‍යවශ්‍ය බව අනාවරණය වේ.

2. ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ වෙරළ කලාප කළමනාකරණය සඳහා මෙවලමක් ලෙස පාරිසරික සංවේදීතා දර්ශකය සංවර්ධනය කිරීම

පාරිසරික සංවේදීතා දර්ශක (ESI) සිතියම් මඟින් වෙරළබඩ වෙරළ තීරයේ සංවේදීතාව, ජීව විද්‍යාත්මක සම්පත් සහ මානව සම්පත් පිළිබඳ තොරතුරු සම්පාදනය කරයි. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශ හඳුනාගෙන අදාල සිතියම් සැකසීම සහ එක් එක් පාරිසරික සංවේදී ප්‍රදේශවල (පරිසර පද්ධතිය, වෙරළ තීරය සහ ධීවර සම්පත්) සංවේදීතා මට්ටම විශ්ලේෂණය කළ හැකි පාරිසරික සංවේදීතා දර්ශකයක් (ESI) සැකසීම වේ. ව්‍යාපෘතියේ ප්‍රගතිය ගත්කල දැනට බෙන්තොට සිට හම්බන්තොට දක්වා වෙරළ වර්ගීකරණය සහ තෝරාගත් ජෛව සම්පත් හඳුනා ගැනීම අවසන් කර ඇත. අනෙකුත් ජෛව සම්පත් හඳුනා ගැනීම මෙම වසරේ ඉදිරි මාසවලදී සිදු කෙරේ. බෙන්තොට සිට මාතර දක්වා වෙරළබඩ කොටස සඳහා එකතු කරන ලද දත්ත මත පදනම්ව GIS සිතියම් සකස් කිරීම අවසන් කර ඇත. මෙමගින් පාරිසරික වශයෙන් වැදගත් තොරතුරු ස්ථාපිත කරන අතර අනාගත පාරිසරික අනතුරු හෝ සිදුවීම් වලට පලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට මහෝපකාරී වේ.



රූපය 11 : පාරිසරික සංවේදීතා දර්ශක (ESI) සිතියම් - ගාල්ල දිස්ත්‍රික්කය

3. මීගමුව කලපුවේ තිරසාර කඩොලාන පාදක නිෂ්පාදන හරහා දේශගුණික විපර්යාස අවම කිරීම සහ ජීවනෝපාය සංවර්ධනය සඳහා කඩොලාන පරිසර පද්ධති සේවා.

මීගමුව මෝය කටේ කඩොලානවල කාබන් වෙන් කිරීමේ ධාරිතාව මැනීම අරමුණු කරගත් නිල් කාබන් තක්සේරුවක් සිදු කිරීමට උත්සාහ කරන ලදී. උතුරු කලාපයේ දූපත් පහක් තෝරාගෙන ඇති අතර ඒවා භූගත හා භූගත ජෛව ස්කන්ධය මැනීමට සහ කාබන් විශ්ලේෂණය සඳහා පාංශු සාම්පල එකතු කිරීමට බිම් කොටස් ස්ථාපිත කරන ලදී.

රූපය 12 : නිල් කාබන් අධ්‍යයනය සඳහා දූපත් පහක් තෝරා ගැනේ

වගුව 2 : 2025/08/31 දක්වා අධ්‍යයනය කරන ලද දූපත් සඳහා නිල් කාබන් අගයන්			
ස්ථානය	ජෛව ස්කන්ධයේ සම්පූර්ණ කාබන් ප්‍රමාණය; AGC+BGC (Mg C ha-1)	පසෙහි මුළු කාබනික කාබන් ප්‍රමාණය (Mg C ha-1)	කඩොලානවල වල නිල් කාබන් ප්‍රමාණය (Mg C ha-1)
මිරිස්සන්දුව	1094.94	438.4	1533.34
කාකදුව	584.62	328.26	912.88
වෙඩිකන්ද	982.74	405.68	1388.42
මහඋප්පලම	1025.37	410.98	1436.35
මණ්ඩගසලඹ	884.96	378.52	1263.48

ඉහළම නිල් කාබන් තොගය මිරිස්සන්දුවේ (1,533.34 Mg C ha^{-1}) වාර්තා වූ අතර, මහඋප්පලම, වෙඩිකන්ද, මණ්ඩගසලඹ සහ කාකදුව යන ප්‍රදේශවල ක්‍රමයෙන් අඩු අගයන් නිරීක්ෂණය විය. අපද්‍රව්‍ය උගුලට හසු කර ගැනීමේදී කඩොලානවල කාර්යභාරය තක්සේරු කිරීම සඳහා සුන්බුන් ආවරණය ප්‍රමාණනය කිරීම ද තක්සේරුවට ඇතුළත් වන අතර පරිසර පද්ධතියට එහි බලපෑම තේරුම් ගැනීම සඳහා ක්ෂුද්‍ර ප්ලාස්ටික් රඳවා තබා ගැනීම පසුව තක්සේරු කරනු ඇත.

දෙවන ක්‍රියාකාරකම වන්නේ කඩොලාන සම්පත් වලින් තිරසාර ජීවනෝපායන් සංවර්ධනය කිරීම සඳහා ප්‍රජා පාදක මූලපිරීමකි. ප්‍රධාන ජයග්‍රහණ අතරට ඖෂධීය ගුණ ඇති ශාකයක් වන *Acanthus ilicifolius* වලින් කඩොලාන පාදක ඖෂධීය තේ නිර්මාණය කිරීම ඇතුළත් වේ. රෙදිපිළි හා අත්කම් සඳහා විභව භාවිතය සඳහා පර්යේෂකයන් *Xylocarpus granatum* සහ *Rhizophora mucronata* වලින් ස්වභාවික සායම් සාර්ථකව නිස්සාරණය කළහ. මීට අමතරව, වියළි කඩොලාන මල් වලින් අතින් සාදන ලද යතුරු ටැග් නිෂ්පාදනය කරන ලද අතර, දේශීය ශිල්පීන්ට විකල්ප ආදායම් මාර්ගයක් ලබා දෙන ලදී (රූපය 15). මෙම ඒකාබද්ධ ප්‍රවේශය පාරිසරික සංරක්ෂණය සහ තිරසාර ආර්ථික සංවර්ධනය යන දෙකටම කඩොලානවල ද්විත්ව විභවය ඉස්මතු කරයි.

Herbal tea preparation

Prepared ornaments by using resins

Extracted dyes from mangroves

රූපය 13කඩොලාන පාදක නිෂ්පාදන සංවර්ධනය :

4. සමුද්‍ර ක්ෂීරපායින්ගේ ස්ථානීය සහ කාලීන ගහන සහ ව්‍යාප්ති රටාවන් සමීක්ෂණය: සංරක්ෂණය සහ තිරසාර කළමනාකරණය සඳහා ඇති බාධක

ශ්‍රී ලංකා ජල තිරය තුල ව්‍යාප්තව සිටින සමුද්‍ර ක්ෂීරපායි විශේෂ නැව්වල ගැටීම, දැල් වල පැටලීම වැනි මානව ක්‍රියාකාරකම් මෙන්ම දේශගුණ විපර්යාස වැනි ස්වභාවික හේතූන් නිසා තරජනයට ලක්වූ විශේෂ ලෙස හඳුනාගෙන ඇත. එසේ උවද ඇතැම් සමුද්‍ර ක්ෂීරපායි විශේෂ කෙලවල්ලන් මරුවැල් පන්නය වැනි ධීවර කර්මාන්ත කෙරෙහි දැඩි ආරථික හානි සිදු කරනු ලබයි. එසේ හානි සිදු කරනු ලබන්නේ මරුවැල් පන්නයට හසුවූ කෙලවල්ලන් සමුද්‍ර ක්ෂීරපායින් විසින් ආහාරයට ගැනීම හෝ හානි කිරීම තුලිනි. ඒ අතරම, ශ්‍රී ලංකාවේ දකුණු වෙරළ තීරයේ වාසය කරන නිල් තල්මසුන් වැනි විශේෂ, තල්මසුන් නැරඹීමේ සංචාරක කළමනාකරණය සඳහා මෙන්ම නැව් ගැටුම් සහ ඒ ආශ්‍රිත ඍණාත්මක ප්‍රතිවිපාක අවම කිරීම අරමුණු කරගත් සංරක්ෂණ ප්‍රයත්නයන් සඳහා අතිශයින්ම වැදගත් වේ. තල්මසුන් නැරඹීමේ කටයුතු වල යෙදෙන කණ්ඩායම් සමග ඒකාබද්ධව සිදු කරන ලද පරීක්ෂණ වලට අනුව, මෙම වසරේදී ශ්‍රී ලංකාවේ දකුණු වෙරළ තීරයේ සමුද්‍ර ක්ෂීරපායි විශේෂ නවයක් වාර්තා වී ඇත. තවද මීට පෙර වසරවලදී නිල් තල්මසුන් සුලබව වාර්තා වන උච්චතම සමයේදී (ජනවාරි සිට අප්‍රේල් දක්වා) නිරීක්ෂණය කල නිල් තල්මසුන් සංඛ්‍යාව පෙර වසරට සමානව සැලකිය යුතු ලෙස පහත වැටීමක් පෙන්නුම් කළේය. එනමුදු පසුගිය වසරවල අගෝස්තු මාසයේදී අඩු වශයෙන් නිල් තල්මුසුන් වාර්තා වූ නමුත් මෙම වසරේදී දිනපතා නිරීක්ෂණ වාර්තා වී ඇත. නිරීක්ෂණ අඩුවීම වාණිජ තල්මසුන් නැරඹීමේ කර්මාන්තයට ජාත්‍යන්තර ලෙස අහිතකර බලපෑමක් ඇති කර තිබේ. ඒ හා සමානව, මෙම කාල වකවානුව තුලදී අදාල ප්‍රදේශයේ නිල් තල්මසුන් නැව් වල ගැටීමක් හෝ මිය යාම නිසා වෙරලට ගසා ගෙන ඒමද වාර්තා වී නොමැත. මෙයට අමතරව ධීවර කටයුතු සහ සමුද්‍ර ක්ෂීරපායින් පිලිබඳ අන්තර් ක්‍රියා අධ්‍යනය සඳහා කරන ලද ප්‍රශ්නාවලි සමීක්ෂණයෙන් පෙන්නුම් කළේ මරුවැල් පන්නයට සසුවන කෙලවල්ලන් තල්මසුන් විසින් කෑ දැමීම/ හානි කිරීම අඛණ්ඩ ගැටළුවක් ලෙස පවතින බවත් එය වඩාත් දරුණු වෙමින් පවතින බවත්, ඊට පිළියම් ලෙස භාවිතා කල පිංගර් භාවිතය පිලිබඳ අත්හදා බැලීම් වලින් මිශ්‍ර ප්‍රතිඵල ලබා දී ඇති බවත්ය. එහි ප්‍රතිඵලයක් ලෙස, මොරටුවේ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය සමඟ සහයෝගයෙන් වඩාත් කාර්යක්ෂම ලෙස තල්මසුන්ගෙන් අල්ලන ලද කෙලවල්ලන්ට වන හානිය අවමකර ගැනීමේ හැකියාව ඇති පිංගර් හෝ ධ්වනි නිවාරණ උපාංග සංවර්ධනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කර ඇත.

4. තාක්ෂණ හුවමාරු ව්‍යාපෘති

1. තෝරාගත් ජලජ පාදක කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් සඳහා නව්‍ය තාක්ෂණික වැඩිදියුණු කිරීම්

නව නිෂ්පාදන හඳුන්වාදීමේ විද්‍යාගාරය විසින් සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම්
